වාර්ෂික කාර්යසාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2022



ශ්‍රී ලංකා ගුවන් හමුදාව

இலங்கை விமானப் படை

SRI LANKA AIR FORCE

2022 වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යසාධන වාර්තාව
ශ්‍රී ලංකා ගුවන් හමුදාව
වියදම් ශීර්ෂ අංක 224

පටුන

පිටු අංකය

ගුවන් හමුදාධිපතිතුමාගේ පණිවිඩය 05 -06

01 වන පරිච්ඡේදය 07

1. විධායක සාරාංශය 07
   1.1 හැඳින්වීම 07 - 08
   1.2 දැක්ම මෙහෙවර හා මුඛ්‍ය හැකියාවන් 08 - 09
   1.3 ප්‍රධාන කාර්යයන් 09
   1.4 සංවිධාන සටහන 10
   1.5 2022 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රධාන අධ්‍යක්ෂකයන් සහ විධායක අංශයන් සහ ඒවා පිළිබඳ සංක්ෂිප්ත විස්තරයන් 11 - 17

02 වන පරිච්ඡේදය 18

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම 18
   2.1 ප්‍රගතිය 18 - 28
   2.1.1 2022 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධනය පිළිබඳ සාරාංශය 29
      අ. ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකය 29 - 32
      ආ. ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය 32 - 33
      ඇ. ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය 33 - 45
      ඈ. සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය 46 - 52
      ඉ. විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂකය 52 - 53
      ඊ. සැපයුම් අධ්‍යක්ෂකය 54
      උ. පරිපාලන අධ්‍යක්ෂකය 54
      ඌ. සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂකය 54 - 57
      එ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකය 57 - 58
      ඒ. පුහුණු අධ්‍යක්ෂකය 58
      ඔ. සුභසාධන අධ්‍යක්ෂකය 58 - 60
      ඕ. ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය 60 - 61
      ඖ. තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය 61 - 62
      ක. නීති අධ්‍යක්ෂකය 62
      ඛ. මාධ්‍ය අධ්‍යක්ෂකය 62 - 64
      ග. විනයාරක්ෂක අධ්‍යක්ෂකය 64 - 65
      ඝ. ප්‍රාසාංගික කලා අධ්‍යක්ෂකය 65
      ඟ. ක්‍රීඩා අධ්‍යක්ෂකය 66
      ත. දන්ත වෛද්‍ය සේවා කාර්යාලය 66 - 67
      ද. අභ්‍යන්තර විගණන අංශය 67 - 74
      න. විධායක බඳවාගැනීමේ කාර්යාලය 74
      ප. විධායක පර්යේෂණ හා සංවර්ධන අංශය 74 - 77
      බ. එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් අංශය 77 - 78
   2.1.2 දීපව්‍යාප්තව පිහිටා ඇති ශ්‍රීලංගුහ මූලික කඳවුරු සහ කඳවුරු විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතීන් 79 - 89
   2.2 ඉදිරි දැක්ම 90 - 92

03 වන පරිච්ඡේදය 93

3. **2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්ය සාධනය** 93
- 3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 93
- 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 94
- 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 95
- 3.4 මූල්‍ය තත්වය පිළිබඳ සාරාංශ විශ්ලේෂණය 96 - 104
- 3.5 මූල්‍ය ප්‍රකාශ සටහන් 105
- 3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 106
- 3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 106
- 3.8 මු.රෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස වියදම් දැරීම සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 107 - 108
- 3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 109
- 3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව 110 - 118

04 වන පරිච්ඡේදය 119

4. **කාර්යසාධන දර්ශක** 119
- 4.1 ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 119 - 121

05 වන පරිච්ඡේදය 122

5. **තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සපුරාගැනීමේ කාර්යසාධනය** 122 - 131

06 වන පරිච්ඡේදය 132

6. **මානව සම්පත් පැතිකඩ** 132
- 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 132 - 136
- 6.2 මානව සම්පත් හිඟය සහ අතිරික්තය ආයතනයේ කාර්ය සාධනය කෙරෙහි බලපෑම 136
- 6.3 මානව සම්පත් සංවර්ධනය 137 - 148

07 වන පරිච්ඡේදය 149

7 **අනුකූලතා වාර්තාව** 149 - 156

08 වන පරිච්ඡේදය 157

8 **කමිටු වාර්තා** 157 - 159

9 **සමාප්තිය** 160

10 **කෙටි යෙදුම්** 161 - 164

ගුවන් හමුදාධිපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙනුවෙන් 2022 මූල්‍ය වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීම මා හට ඉමහත් සතුටකි. ජාතික ප්‍රතිපත්ති රාමුව වන "සෞභාග්‍යයේ ඉදිරි දැක්ම" ශ්‍රී ලංකා රජයේ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මට හා 2021-2023 වර්ෂ සඳහා වන ශ්‍රී ලංකා ගුවන් හමුදා සංයුක්ත සැලැස්මට හා 2022 වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වෙමින් අදාළ කරුණු රජයට පැහැදිලි කිරීම සඳහා මෙම වාර්තාව උපකාරී වේ. 2022 මූල්‍ය වර්ෂය සඳහා බදු ගෙවන්නන් විසින් ශ්‍රීලංකා ගුවන් හමුදාව වෙත පවරනු ලැබූ සම්පත්වල කළමනාකාරීත්වය සාමාන්‍ය ජනතාවට ඉදිරිපත් කිරීමේ මෙවලමක් ලෙස මෙන්ම, එම සම්පත් අප විසින් කළමනාකරණය කරන අයුරු, සහ අපගේ ජයග්‍රහණයන්, අභියෝග සහ අනාගතය දැක්ම තක්සේරු කර ගැනීම සඳහා ද උපකාරී වේ.

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් 2021-2023 සඳහා වන සංයුක්ත සැලැස්මේ දක්වා ඇති ඉලක්ක එකොළහ (11) ක් කෙරෙහි අවධානය යොමු කර ජාතික ආරක්ෂාව අපගේ ජනතාව රැකබලා ගැනීම කණ්ඩායම් ක්‍රියාකාරීත්වය තුළින් සාර්ථකව ඉටුකරමින් සිටී. 2022 වර්ෂයේ දී රට තුළ සිදු වූ සමාජයීය හා ආර්ථික පසුබෑම හමුවේ වුව ද ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් එහි මෙහෙවර අත්හැර නොමැත. විශේෂයෙන්ම 2022 මූල්‍ය වර්ෂයේ දී වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට ප්‍රතිචාර වශයෙන් ඉන්ධන, සන්නිවේදන දීමනා, ජලය හා විදුලිය වැනි වියදම් සීමා කිරීමට පියවර ගෙන ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදාව තම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර ක්‍රියාකාරකම් සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත. රටේ ආර්ථික අභියෝගාත්මක තත්ත්වය වැනි සංකීර්ණ අභියෝග හමුවේ ඉදිරි වසරවල දී රජයේ වියදම් කළමනාකරණ ක්ෂේත්‍රයට ධනාත්මක බලපෑමක් ඇති කරන වැදගත් මුලපිරීම් 2022 මූල්‍ය වර්ෂයේ දී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් දියත් කර ඇත. එසේම, රටේ ජාතික ආරක්ෂාව සහ ජාතියේ සංවර්ධනයේ අභියෝගයට මුහුණ දීම සඳහා අවශ්‍ය උපාය මාර්ග, සම්පත් සහ මෙහෙයුම් සංකල්ප අපි ක්‍රියාත්මක කරමින් සිටිමු. MI 17 හෙලිකොප්ටර් 03 ක් හා ගුවන් නියමුවන්, ඉංජිනේරුවන් සහ සහායක කාර්ය මණ්ඩලය ඇතුළත් සේවා පුද්ගලයින් 113 ක හට පිරිස් මධ්‍යම අප්‍රිකාවේ එක්සත් ජාතීන්ගේ හමුදා කණ්ඩායම් වෙත යෙදවීමට අප විසින් අඛණ්ඩව කටයුතු කර ඇති අතර එමගින් රටට විදේශ මුදල් ගලා ඒම වැඩි කිරීමට ධනාත්මක ලෙස බලපා ඇත. මෙම දුෂ්කර කාලවලදී නොසැලී සිටීම ගැන මම ශ්‍රී ලංකා ගුවන් හමුදා ශ්‍රම බලකායේ සෑම සාමාජිකයෙකුටම ස්තුතිවන්ත වෙමි.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉතා තීරණාත්මක සන්ධිස්ථානයකට පැමිණ ඇති අතර මෙම අභියෝගාත්මක තත්ත්වය පාලනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය වඩාත් වගකීමෙන් සහ ආර්ථිකමය ලෙස භාවිත කරමින් මහජනතාවට කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම තීරණාත්මක අවශ්‍යතාවක් වී තිබුණි. කෙසේ වුව ද, එයට නිශ්චිත කාලයක් ගතවූ බැවින් රාජ්‍ය වියදම් ඉතා අත්‍යවශ්‍ය සේවාවන් සඳහා පමණක්

ලබාගත හැකි වන පරිදි දැඩි ලෙස සීමා කළ යුතුවිය. මෙම දුෂ්කර තත්ත්වය තුළ සන්නද්ධ හමුදාවක් ලෙස ජාතික ආරක්ෂාව සඳහා අපගේ වගකීම ඉටු කිරීමේ දී සාර්ව ආර්ථික ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා ස්ථාවර රාජ්‍ය මූල්‍ය වැඩ පිළිවෙලක් ස්ථාපිත කිරීමට සහ නිලධාරීන් සෙසු නිලයන් සහ සිවිල් කාර්ය මණ්ඩලයේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාව කටයුතු කර ඇත.

සමස්ත මූල්‍ය කාර්යසාධනය පෙන්වන පරිච්ඡේදය මඟින් මෙම වසරේ විගණනයේ ප්‍රතිඵල විගණකාධිපති වාර්තාව මඟින් විස්තර කරනු ලබයි. අපගේ ඉලක්කය වන ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු සම්පත් උපාය මාර්ගයට, උපාය මාර්ගය ප්‍රතිපත්තිවලට සහ ප්‍රතිපත්ති රටේ අවශ්‍යතාවට ගැළපීම සහතික කිරීම සඳහා වන ප්‍රධාන කාර්යය විගණන ප්‍රතිකර්ම ප්‍රයත්නය වේ. අපගේ වෘත්තීය පරිචයන් නවීකරණය කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම තුළින් හොඳ වඩාත් ප්‍රඵල් සහයෝගයක් දැක්වීම සහ ඉහළ ප්‍රමුඛතාවන් සඳහා කාලය, මුදල් සහ පිරිස් නිදහස් කිරීම මඟින්, බදු ගෙවන්නන් විසින් වෙහෙස වී උපයන ලද සම්පත්වල වඩාත් හොඳ ආරක්ෂකයින් බවට පත්වීමට අපට හැකිවනු ඇත.

ශ්‍රී ලංකාව අනාගතයට ගෙනයන ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීම සඳහා රජයට සක්‍රීයව සහය වීම පිණිස අපගේ සූදානම් වීම, වර්ධනය සහ වගවීම වැඩි දියුණු කිරීමට ඉදිරි වසර තුළ අඛණ්ඩව උත්සාහ කරමු.



එයාර් මාර්ෂල් එස්. කේ. පතිරණ

WWV and Bar, RWP and Bar, RSP and three Bars, VSV, USP, MSc (MOA) USA, MSc (Def Stu) in Mgt, M Phil (Ind), MIM (SL), ndc (Ind), psc, qfi

ගුවන් හමුදාධිපති

2023 මැයි මස 31 වන දින

01 වන පරිච්ඡේදය

1. විධායක සාරාංශය

1.1 හැඳින්වීම

අ. 2022 මූල්‍ය වර්ෂයේදී, 2021-2023 වර්ෂ සඳහා වන සංයුක්ත සැලැස්ම හා 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම, මෙන්ම ජාතික ප්‍රතිපත්ති රාමුව වන "සෞභාග්‍යයේ ඉදිරි දැක්ම" ශ්‍රී ලංකා රජයේ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වෙමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව තම දායකත්වය ලබා දී ඇත. ජාතික ආරක්ෂාව සඳහා ගුවන් බලය ඵලදායී ලෙස මෙහෙයවීමේ තම මූලික කාර්යභාරයට අතිරේකව වාර්ෂිකව රට තුළ ක්‍රියාත්මක වන සංවර්ධන ක්‍රියාදාමයන් සඳහා ද ශ්‍රී ලංකා ගුවන් හමුදාව තම දායකත්වය ලබා දී ඇත. විශේෂයෙන්ම 2022 මූල්‍ය වර්ෂයේ දී වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව තම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර ක්‍රියාකාරකම් සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත. රටේ ආර්ථික අභියෝගාත්මක තත්ත්වය වැනි සංකීර්ණ අභියෝග හමුවේ ඉදිරි වසරවල දී රජයේ වියදම් කළමනාකරන ක්ෂේත්‍රයට ධනාත්මක බලපෑමක් ඇති කරන වැදගත් මූලපිරීම් 2022 මූල්‍ය වර්ෂයේ දී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් දියත් කර ඇත.

ආ. 2022 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සංචාරක කර්මාන්තයේ උන්නතිය උදෙසා අවශ්‍ය යැයි හඳුනාගත් ප්‍රධාන අවශ්‍යතාව වන අභ්‍යන්තර ගුවන් ගමන් කටයුතු වැඩිදියුණු කිරීමෙහිලා මූලිකත්වය ගෙන ක්‍රියාකොට ඇත. එමෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාව ජාතික ආපදා හා ව්‍යසනකාරී තත්ත්වවලදී තුවාලකරුවන් මුදවා ගැනීම මෙන්ම අවස්ථානුකූලව හට පිරිස් යෙදවීම ආදිය මඟින් තම ක්‍රියාකාරී දායකත්වය ලබා දී ඇත. 2022 වාර්ෂික කාර්ය සාධන වාර්තාව තුළ 2021-2023 වර්ෂ සඳහා වන සංයුක්ත සැලැස්ම හා 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම, මෙන්ම ජාතික ප්‍රතිපත්ති රාමුව වන සෞභාග්‍යයේ ඉදිරි දැක්ම" සහ ශ්‍රී ලංකා රජයේ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම වාර්ෂික ප්‍රතිපාදන වෙන්කිරීම් සමඟ විශ්ලේෂණය කිරීමට අදාළ තොරතුරු හා දත්ත ඇතුළත්ය. තවද, 2022 වර්ෂය තුළ ඉටු කිරීමට ස්ථාපිත ක්‍රියාකාරකම්වල ප්‍රගතිය එහි තත්‍ය කාර්යසාධනයට සාපේක්ෂව විශ්ලේෂණය කිරීම හා 2022 වර්ෂයේ අපේක්ෂිත සැලැස්ම සඳහා ඉස්මතු කිරීම සිදු කර ඇත.

ඇ. වාර්ෂික අයවැය වාර්තාව සමඟ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම විශ්ලේෂණය කිරීම

(1) වාර්ෂික කාර්යසාධන වාර්තාව, සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ වාර්ෂික අයවැය වාර්තාවට සමාන පදනමක් මත සකස් කර ඇත. එමඟින් 2021-2023 වර්ෂ සඳහා වන සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගත ඉලක්ක වලට සාපේක්ෂව කාර්යසාධනය වාර්තා කරයි. සෑම අංශයකම කාර්ය සාධනය පිළිබඳ කෙටි සාරාංශයක් හා ඇගයීමක් අන්තර්ගත වන අතර ඊට අතිරේකව වර්ෂය තුළ සිදු කරන ලද ආරක්ෂාව සම්බන්ධ ක්‍රියාකාරකම් පිළිබඳ ඇතැම් කරුණු පසුබිම්කොටගත් කරුණු දැක්වීම් ඇතුළත්ය.

(2) වාර්ෂික අයවැය වාර්තාව, නැඟී එන ඉහළ පෙළේ ප්‍රමුඛතා හා දෙපාර්තමේන්තුව සංවිධානය වීමේදී විය හැකි වෙනස්වීම් පිළිබිඹු කරමින් කාලයත් සමඟ විකසනය වීමට ඕනෑකමින් සැලසුම් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත ව්‍යුහය ස්ථාවරව පැවතියද, ඉහළ මට්ටමේ සහයක අරමුණු වලදී හා එම අරමුණු එකිනෙකට යා කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී එක් වාර්ෂික අයවැය වාර්තාවකින් ඊලඟ අයවැය වාර්තාවට සැලකිය යුතු ප්‍රමාණයේ වෙනස්කම් මතු වීම නොවැළැක්විය හැකි කරුණකි.

(3) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඉහළ මට්ටමේ අරමුණු 2021-2023 සංයුක්ත සැලැස්ම මඟින් පිහිටුවා ඇත. ඒ අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව 2021-2023 වර්ෂ සඳහා වන සංයුක්ත සැලැස්ම මඟින් පිහිටුවා ඇති ඉලක්ක හා 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට සාපේක්ෂව 2022 දෙසැම්බර් 31 දිනට වන කාර්ය සාධනය පිළිබඳ සාරාංශයකින් ආරම්භ වේ. වියදම් සමාලෝචනයන්, වාර්තාව පුරාවටම දක්වා ඇත.

ඇ. **දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන 2022**

(1) එක් එක් මූල්‍ය වර්ෂවලදී අවශ්‍ය වූ, රඳවා තබාගත් හා බැහැර කළ සම්පත් හා වර්ෂය තුළ දී ඒවා භාවිත කළ ආකාරය විස්තර කරමින් මූල්‍ය වාර්තා සකස් කිරීම ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කළ යුතු ය. ඒ අනුව මුදල් රෙගුලාසි හා භාණ්ඩාගාර මාර්ගෝපදේශයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන මුදල් පදනම මත සකස් කරනු ලබයි. වැඩි දුරටත් රජයේ ගිණුම්කරන මූලධර්මයන් පදනම් කරගෙන සකස් කර ඇති භාණ්ඩාගාර චක්‍රලේඛ හා මූල්‍ය ප්‍රකාශන අනුව ද වේ.

(2) ඔවුන් විසින් වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ කාර්යයන්වල තත්ත්වය, ශුද්ධ සම්පත් නිපැයුම, අරමුණු සාක්ෂාත් කරගැනීමට යොදාගත් සම්පත්, හඳුනාගත් ලාභ හා අලාභ සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳ නිවැරදි හා සාධාරණ මතයක් ලබා දිය යුතුය. 2022 වර්ෂය සඳහා වන දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශනය මෙම වාර්තාව සමඟ අමුණා ඇත.

ඉ. **කාර්යසාධන කළමනාකරණය සඳහා වන උපායමාර්ගික රාමුව**

(1) කාර්යසාධන කළමනාකරණය යනු උපායමාර්ගික අරමුණු හා ප්‍රමුඛතාවයන් නියම කිරීම, එහිලා වැඩසටහන් නිර්මාණය කිරීම, එම වැඩසටහන්වල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම, ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා දත්ත රැස්කිරීම හා ප්‍රගතිය මැන බැලීම, වැඩසටහන් හා සම්පත් විභජනය කෙරෙහි බලපෑ හැකි පරිදි කාර්යසාධන හා ඇගයුම් තොරතුරු උපයෝගී කරගැනීම, ආයෝජකයින් වෙත ප්‍රතිඵල සන්නිවේදනය හා තීරණ ගැනීම ආදී බහු අදියරයන්ගෙන් යුත් ක්‍රියාවලියකි.

(2) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධන කළමනාකරණය, 2021-2023 වර්ෂ සඳහා වන ශ්‍රී ලංකා ගුවන් හමුදා තුන් අවුරුදු සංයුක්ත සැලැස්ම හා 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා 5 අවුරුදු සෞභාග්‍යයේ ඉදිරි දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව මෙහෙයවා ඇත.

1.2 දැක්ම, මෙහෙවර හා මූඛ්‍ය හැකියාවන්

අ. **දැක්ම**

"ගුවන් බලය සඵලව යෙදවීමෙන් ජාතික ආරක්ෂාව තහවුරු කිරීම"

ආ. **මෙහෙවර**

"ගුවන් මෙහෙයුම් ක්‍රියාත්මක කරවීමෙහිලා අපගේ සුවිශේෂී නිපුණතාවයන් මත පදනම් වූ වෘත්තීය සුවිශිෂ්ඨතාවයෙන් අනුන ගුවන් හමුදාවක් මඟින් ජාතික ආරක්ෂක මෙහෙවර සාක්ෂාත් කිරීම"

ඈ. මුඛ්‍ය හැකියාවන් ආයතනික මුඛ්‍ය හැකියාවන් එහි ඉලක්කගත අරමුණු ළඟා කරගැනීම සඳහා ආයතනය මෙහෙයවන ප්‍රධාන නිර්ණායකයන් වේ. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුවද එවැනි අද්විතීය වූ මුඛ්‍ය හැකියාවන් පවතින අතර ඒවා පහත පරිදිය.

(1) ගුවන් මෙහෙයුම් හා ගුවන් ආරක්ෂක හැකියාව. ශ්‍රී ලංකාව තුළ ගුවන් මෙහෙයුම් සහ ගුවන් ආරක්ෂක මෙහෙයුම් සිදු කිරීමේ හැකියාව ඇති එකම ආයතනය ශ්‍රී ලංකා ගුවන් හමුදාව වේ.

(2) සීමිත සම්පත් නවෝත්පාදාත්මක ලෙස උපයෝජනය. ශ්‍රී ලංකා ගුවන් හමුදාව අතීතයේ සිට විවිධ වූ තත්ත්වයන් යටතේ සීමිත සම්පත් උපයෝජනය කිරීම හා යෙදවීම තුළින් උපරිම ප්‍රතිඵල ලඟා කරගැනීමේ අද්විතීය හැකියාවක් පෙන්නුම් කර ඇත.

(3) අනේකවිධ මෙහෙයුම් අත්දැකීම්වලින් සන්නද්ධ වූ වෘත්තිමය, අභිප්‍රේරිත ශ්‍රම බලකායක්. බ්‍රිතාන්‍ය රාජකීය ගුවන් හමුදාවේ පොහොසත් සම්ප්‍රදායන්ට උරුමකම් කියන, වෘත්තිමය සංවර්ධන ව්‍යුහයක් හා සුවිශේෂී පුහුණුවක් සහිත ආරම්භයේ සිටම විවිධ මෙහෙයුම් කාර්යයන් සඳහා ගුවන් බලය ලබා දීමෙන් ලද අත්දැකීම් සම්භාරයක්ද කැටිකර ගත් ශ්‍රී ලංකා ගුවන් හමුදාව, සේවය වෙනුවෙන් කැප වූ අභිප්‍රේරිත සහ අනුවර්තිත හැකියාවෙන් ඉහළ වෘත්තිමය බලකායක් බිහි කර ඇත.

(4) ජාතික ආරක්ෂාව සඳහා සයිබර් අවකාශය හා විද්‍යුත් චුම්බක වර්ණාවලිය සඵලදායිව, ආරක්ෂාකාරීව හා වගකීමෙන් යුක්තව උපයෝජනය කිරීම.

(5) දීපව්‍යාප්ත විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ සහ රේඩාර් ජාලයේ හිමිකාරිත්වය හරහා සන්නිවේදන හා ගුවන් නිරීක්ෂණ සඳහා විද්‍යුත් චුම්භක වර්ණාවලියත්, තොරතුරු කළමනාකරණය සඳහා සයිබර් අවකාශයත් ප්‍රයෝජනයට ගැනීම සඳහා ගුවන් හමුදාව සතුව අද්විතීය හැකියාවක් ඇත.

1.3 ප්‍රධාන කාර්යයන්

අ. මතුපිට ඇති සියලු මාධ්‍යයන් හරහා ගුවන් බලය යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාවය සහ ස්වෛරිභාවය ආරක්ෂා කිරීම.

ආ. යුධ හා නාවික හමුදාවන්ට උපායශීලි ගුවන් ආධාර සහ ප්‍රවාහන පහසුකම් සැලසීම.

ඇ. රජයේ ඉල්ලීම මත මුදවා ගැනීමේ පහසුකම් සහ ප්‍රවාහන පහසුකම් සැලසීම.

ඈ. ගුවන්යානා, මාර්ග ප්‍රවාහන, විද්‍යුත් උපකරණ, වෙනත් පිරියත සහ යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීම සඳහා ඉංජිනේරු හා සැපයුම් සේවා සම්පාදනය කිරීම.

ඉ. අභ්‍යන්තර ආරක්ෂක මෙහෙයුම් සඳහා හට පිරිස් සැපයීම.

ඊ. යුධමය නොවූ ගුවන් මෙහෙයුම්වල නිරත වීම සහ ජාතික සංවර්ධනය සඳහා වූ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවීම.

එ. එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා හට පිරිස්, ගුවන්යානා හා වාහන ලබා දීම තුළින් සක්‍රීයව දායක වීම.

1.4 සංවිධාන සටහන



ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ සංවිධාන සටහන

1.5 2022 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රධාන අධ්‍යක්ෂකයන් සහ විධායක අංශයන් සහ ඒවා පිළිබඳ සංක්ෂිප්ත විස්තරයන්

අ. ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකය

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් මෙහෙයුම් කාර්යයන් ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකයේ විෂය පථයට අයත් වේ. ගුවන් මෙහෙයුම්, ගුවන් ආරක්ෂාව, ගුවන් ගමන් පාලනය හා ගිනි නිවීම් යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මෙම අධ්‍යක්ෂකය වගකීම දරයි.

ආ. ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය

හැඳින්වීම. 2014 පෙබරවාරි 28 වන දින ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය නැවත සේවයේ පිහිටුවන ලදී. ඕනෑම අයුරක බාහිර/ අභ්‍යන්තර සතුරු ප්‍රහාර වැළැක්වීම සහ ගුවන් මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු ගුවන් වත්කම් හා ස්ථාපිතයන් ආරක්ෂා කිරීම අරමුණු කොට ගෙන පක්ෂාංග 29කින් යුත් ශ්‍රී ලංකා ගුවන් හමුදා රෙජිමේන්තුව, ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය යටතේ පිහිටුවන ලදී.

ඇ. ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු ගුවන් යානාවන් ගුවන් ගමන් වලට යොදා ගත හැකි මට්ටමෙන් පවත්වාගෙන යාම සඳහා සම්මත ඉංජිනේරු ප්‍රයෝගයන් භාවිතයට ගැනීම හා එමඟින් ගුවන් ගමන්වල ආරක්ෂාව තහවුරු කිරීමට ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය වගකියනු ලබයි. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව වර්ග 28ක ගුවන් යානා 108ක් ඇත. මෙම ගුවන් යානා 108, පියාපත් සහිත ගුවන් යානා 62ක් හා හෙලිකොප්ටර් යානා 46ක් ලෙස නැවත වර්ග කර දැක්විය හැක.

ඈ. සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය

(1) හැඳින්වීම.

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාන්‍ය ඉංජිනේරු වෘත්තීන් පරිපාලනය කිරීම සඳහා සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය ස්ථාපිත කර ඇත. මෙමඟින් ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූලික කාර්යය වන පියාසර කිරීම සඳහා අවශ්‍ය වන සහය සපයනු ලබයි. ප්‍රධාන අංශ 02ක් හා වෘත්තීන් 10ක් මෙම අධ්‍යක්ෂකයේ විෂයපථය යටතේ පාලනය වේ.

(ආ) සාමාන්‍ය ඉංජිනේරු පක්ෂාංගය හා මෝටර් රථ කාර්මික හා නඩත්තු කිරීමේ පක්ෂාංගය මෙම ප්‍රධාන අනුබණ්ඩ දෙක වේ. වෘත්තීන් 10කට අයත් විශේෂඥ දැනුමැති ගුවන්භටයින් මෙම අධ්‍යක්ෂකය සතු නමුත් සාමාන්‍ය ඉංජිනේරු කාර්යයන් හා ගුවන් යානා ඉංජිනේරු සම්බන්ධ කාර්යයන්වල මාරුවෙන් මාරුවට නියැලී සිටින කාර්මික ඉංජිනේරු ශාඛාවේ නිලධාරීන් විසින් මෙහි සේවය සපයයි.

ඉ. **විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ඵලදායී ලෙස විද්‍යුත්, විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණික පහසුකම් සැපයීම හා නඩත්තුව මෙන්ම එම කාර්යයන් පරිපාලනය සඳහා විද්‍යුත් හා විදුලි සංදේශ (E&TE) ඉංජිනේරු අධ්‍යක්ෂකය ස්ථාපිත කරන ලදී.

ඊ. **සැපයුම් අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියලුම මෙහෙයුම්, පුහුණුවීම්, පරිපාලනමය කටයුතු හා සුභසාධන කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සඳහා අවශ්‍ය සැපයුම් සහය ලබා දීම සඳහා මෙම අධ්‍යක්ෂකය පිහිටුවා ඇත.

උ. **පරිපාලන අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පරිපාලනයට අදාළ සියලුම කාර්යයන් මෙන්ම සාමාන්‍ය විනය සම්බන්ධ රාජකාරි, නිලධාරීන් සම්බන්ධ කාර්යයන්, ගුවන් භට/කාන්තා ගුවන් සම්බන්ධ කාර්යයන්, වැටුප් හා දීමනා, ආයතනික කාර්යයන් හා අනෙකුත් පරිපාලනමය කරුණු යනාදිය මෙම අධ්‍යක්ෂකය වෙත පවරා ඇත.

ඌ. **සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ප්‍රතිපත්ති සකස් කිරීම සහ විද්‍යුත්, කාර්මික හා සිවිල් යන විවිධ ඉංජිනේරු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සියලුම ඉංජිනේරු කාර්යයන් සිදු කිරීම සඳහා සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂකය ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ස්ථාපිත කරන ලදී. අධ්‍යක්ෂකයේ විෂය පථයට අයත්වන සියලුම ඉංජිනේරු අවශ්‍යතාවයන් සපුරා ගැනීමට අනුමත මිනිස් බලය, අනෙකුත් අමුද්‍රව්‍ය හා වෙන් කළ මුදල් ඵලදායී ලෙස යොදාගැනීම අධ්‍යක්ෂකය සතු කාර්යභාරය වේ.

එ. **සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකය**

හැඳින්වීම. තාක්ෂණික වශයෙන් බලවත් හමුදාවක ප්‍රධාන හේතුකාරකයක් වශයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙහි සෞඛ්‍ය රැකගැනීමේ කාර්යයෙහිලා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකය විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. අධ්‍යක්ෂකයෙහි ප්‍රමුඛ කාර්යය වන ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙහි සෞඛ්‍ය කටයුතු පවත්වාගෙන යාමට අමතරව ගුවන් හමුදා රෝහල්වල රෝගීන්ට සත්කාර කිරීමේ කටයුතු හැසිරවීමට අවශ්‍ය ශක්‍යතාවන් සංවර්ධනය කළ යුතුව ඇත.

ඒ. **පුහුණු අධ්‍යක්ෂකය**

(1) හැඳින්වීම

(අ) පුහුණු ප්‍රතිපත්ති සැකසීම, ආරම්භක, මූලික හා උසස් වෘත්තීය පුහුණු, විශේෂඥ හා උපදේශක පුහුණු, ගුවන්භටයින්ගේ හා නිලධාරීන්ගේ උසස්වීම් සඳහා වන විභාග සැලසුම් කිරීම හා පැවැත්වීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පුහුණු අධ්‍යක්ෂකය ස්ථාපිත කර ඇත. මෙම අධ්‍යක්ෂකය මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු සියලුම පුහුණු මධ්‍යස්ථාන ඉහළ ප්‍රමිතීන් සාක්ෂාත් කර ගනිමින් පවත්වාගෙන යන බව තහවුරු කරනු ලබයි.

(ආ) ගුවන් නියමුවන්, ගුවන්යානා ඉංජිනේරුවරුන්, සිවිල් වෛද්‍යවරුන්, ගණකාධිකාරීවරුන්, විගණන නිලධාරීන්, රෙජිමේන්තු නිලධාරීන්, යන විවිධ වෘත්තිකයින් සඳහා තම ශක්‍යතා වර්ධනය කර ගැනීම හා කුසලතා ඉහළ නංවා ගැනීම සඳහා 2022 වර්ෂය තුළදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් දේශීය මෙන්ම විදේශීය පුහුණු පාඨමාලාවන් පවත්වා ඇත. රාජ්‍ය සේවය සඳහා අවශ්‍ය විශිෂ්ට කාර්යසාධනයක් සහිත කුසලතා පුර්ණ හමුදා සේවයක් බිහි කිරීම පුහුණු අධ්‍යක්ෂකය සතු මුඛ්‍ය අරමුණ වේ. ඒ අනුව 2022 වර්ෂයේදී නිම කිරීමට අරමුණු කරගත් බොහෝ ව්‍යාපෘති, අධ්‍යක්ෂකය විසින් සාර්ථකව වර්ෂය තුළ නිම කර ඇත.

ඔ. **සුභසාධන අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියලුම නිලධාරීන්/ ගුවන්භටයින් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සුභසාධන කටයුතු සම්බන්ධයෙන් මෙම අධ්‍යක්ෂකය ගුවන්හමුදාධිපතිට වග කියනු ලැබේ. ඒ අනුව සේවා පුද්ගලයින්ගේ හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ජීවන තත්ත්වය ඉහළ දැමීමට මූල්‍ය හා වෙනත් අත්‍යවශ්‍ය සුභසාධන පහසුකම් සැපයීම සඳහා සුභසාධන කටයුතු ආරම්භ කිරීමට හා පාලනය කිරීමට අවශ්‍ය වගකීම සහිතව මෙම අධ්‍යක්ෂකය කටයුතු කරනු ලැබේ. එමෙන්ම ක්‍රියාකාරී සේවයේදී ආබාධිත වූ රණවිරුවන් සහ මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් පුනරුත්තාපනය හා ඔවුන්ට අවශ්‍ය සුභසාධන කටයුතු සැලසීම සුභසාධන අධ්‍යක්ෂකයෙහි වගකීම වේ.

ඕ. **ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියලුම බුද්ධි තොරතුරු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2017 මැයි 23 දින ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විෂය පථයට ගැනෙන ගුවන් හා නාවික උපායමාර්ගික අණ මධ්‍යස්ථානය සහ ගුවන් නිරීක්ෂණ මෙහෙයුම්, ගොඩබිම් බුද්ධිය, ගෝලීය බුද්ධිය සහ සයිබර් බුද්ධිය ඇතුළු ගුවන් බුද්ධිය කාර්යක්ෂමව හා ඵලදායිව සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂකය වගකියනු ලැබේ.

ඖ. **අයවැය අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ස්වාධීන අධ්‍යක්ෂකයක් ලෙස අයවැය අධ්‍යක්ෂකය පිහිටුවා ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් (ප්‍රතිපාදන) ලබා ගැනීම සහ රජයේ මුදල් රෙගුලාසි ප්‍රකාරව මූල්‍ය වර්ෂයක් තුළ අදාළ අධ්‍යක්ෂකවරුන්/ විධායක නිලධාරීන් වෙත වෙන් කළ ප්‍රතිපාදන ප්‍රශස්ත ලෙස උපයෝජනය උදෙසා ඔවුන් හට සැලකිය යුතු මට්ටමේ පෙළඹවීමක් සිදු කිරීම, අයවැය අධ්‍යක්ෂකයේ මූලික කාර්යය වේ.

ක. **තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ පිහිටි ස්වාධීන අධ්‍යක්ෂකයක් ලෙස තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය පිහිටුවා ඇත. ආයතනික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය මෘදුකාංග පද්ධති, තොරතුරු ජාලයන්, දෘඩාංග, දත්ත පද්ධති, බහුමාධ්‍ය සැලසුම් සහ සයිබර් ආරක්ෂාව ඇතුළු සියලුම තොරතුරු තාක්ෂණ පද්ධති හා මෙවලම් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම මෙම අධ්‍යක්ෂකයේ ප්‍රධාන කාර්යය වේ.

ඛ. **නීති අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව නීතියේ ආධිපත්‍යය පිළිගන්නා, කවර හෝ බලපෑමකට යටත් වීමකින් තොරව ස්වාධීනව හා විනිවිද භාවයෙන් යුක්තව, කාර්යක්ෂම, ඵලදායි සහ නිරවද්‍ය නීති උපදෙස් හෝ වෙනත් ඕනෑම නීති සේවාවන් ශ්‍රීලංගුහ ට සැපයීමේ පරමාර්ථයෙන් යුක්තව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විධායක ව්‍යුහයේ ස්වාධීන අංගයක් ලෙස ශ්‍රීලංගුහවේ නීති අධ්‍යක්ෂකය 2007 ජනවාරි 1 වන දින ස්ථාපිත කරන ලදී.

ග. **මාධ්‍ය අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුවක් ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ආරක්ෂක අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකාවේ මහජනයා වෙත වගකිව යුතු හා පිළිතුරු සැපයිය යුතුය. කෙසේ නමුත්, දෛනික රාජකරින්ට අමතරව, ශ්‍රී ලංකා ගුවන් හමුදාව තම ආයතනික ප්‍රතිරූපය ගොඩනැංවීම හා ආරක්ෂා කර ගැනීම සලකා හෝ ආයතනයට පරිභාහිරව ගොඩනැඟෙන සංවාදයන්ට ප්‍රතිචාර දැක්වීම සලකා, සාමාන්‍ය ජනතාව සමඟ සෘජුව සම්බන්ධ වීම අත්‍යවශ්‍ය වනු ඇත. එය සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ සාමාන්‍ය ජනතාව අතර සිදුවන ඕනෑම හා සියලුම ආකාරයේ සන්නිවේදනයන් ජාතික ආරක්ෂාවට ඇති බලපෑම පිළිබඳ නිසි අවබෝධයකින් යුතුව මෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගරුත්වය හා සදාචාරය ආරක්ෂා වන පරිදි සිදු කළ යුතු අතර එවැනි සියලුම ආකාරයේ සන්නිවේදනයන්ගේ අන්තර්ගතය හා හඬ හැසිරවීම, ශ්‍රී ලංකා ගුවන්හමුදාධිපතිගේ සෘජු විෂය පථයට ගැනෙන අධිකාරියක් විසින් පරීක්ෂාවට ලක් කිරීම අත්‍යවශ්‍යයෙන්ම සිදු විය යුතුය.

ඝ. **විනයාරක්ෂක අධ්‍යක්ෂකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදා පොලිසිය, ගුවන් හමුදාව තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීමට සහ ඉහළ විනයක් පවත්වා ගෙන යාමට මූලිකවම වගකියනු ලැබේ. විශේෂ පුද්ගලයින් සඳහා යතුරුපැදිවලින් ගමන්ගන්නා පරිවාර ආරක්ෂකයින් ලබා දීම, ගුවන් හමුදා උත්තමාචාර පෙළපාලි, පිරිස් පාලනය හා රථවාහන පාලනය ආදී සම්මානනීය අවස්ථා රාජකාරීන් සිදු කිරීම, පොලිස් නිලධාරියකු විසින් සිදු කරනු ලබන ප්‍රධාන රාජකාරීන්ගෙන් කිහිපයකි.

ඞ. **ප්‍රසාංගික කළා අධ්‍යක්ෂකය**

හැඳින්වීම ජාතික වශයෙන් සහ සංවිධානයක් වශයෙන් උත්සව සහ විනෝදාස්වාදය සැපයීමේ අවශ්‍යතාව, සපුරාලීම මෙන්ම ශ්‍රී ලංගුහ සේවයේ නියුක්ත සහ විශ්‍රාමික පුද්ගලයින්ගේ සහ සිවිල් කාර්ය මණ්ඩලයේ සුභසාධනය සඳහා විනෝදාස්වාදය සැපයීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ඇති එකම ආයතනය ප්‍රසාංගික කළා අධ්‍යක්ෂකය වේ. රට තුළ ඇති කීර්තිමත් ප්‍රසාංගික ආයතනයක් ලෙස ස්ථාපිත ප්‍රසාංගික කළා අධ්‍යක්ෂකය සංවිධානයේ ප්‍රධාන ආදායම් උත්පාදක අංශය ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආදායම ශක්තිමත් කරයි.

ණ. **සිවිල් පරිපාලන අධ්‍යක්ෂකය**

හැඳින්වීම. විවිධ අධ්‍යක්ෂකයන් යටතට ගැනෙන විවිධ සේවාවන් ඉටු කිරීම සඳහා අවශ්‍ය සිවිල් සේවකයින් ලබා දීම සිවිල් පරිපාලන අධ්‍යක්ෂකය විසින් සිදු කරනු ලබයි. කාර්යක්ෂම පරිපාලනයක් සඳහා සහ සිවිල් සේවකයින්ගේ විනය පාලනය සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා ද මෙම අධ්‍යක්ෂකය ගුවන් හමුදාධිපතිට වගකියනු ලබයි.

ත. **මුදල් අධ්‍යක්ෂකය**

හැඳින්වීම. මුදල් අධ්‍යක්ෂකය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ක්‍රියාකාරකම් රාජ්‍ය භාණ්ඩාගාරය හා සම්බන්ධ වෙමින් කළමනාකරණය කිරීම සිදු කරනු ලබයි. අයවැය ගත සියලු වියදම් සඳහා පවතින දවශීලතාවය තහවුරු කර ගැනීම හා අදාළ වියදම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් ලබා දීම මෙම අධ්‍යක්ෂකය මඟින් සිදු කරනු ලබයි.

ද. **විධායක කෘෂි ඒකකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදා විධායක කෘෂි ඒකකය පිහිටුවා ඇත්තේ කෘෂිකර්මාන්තය, සත්ව නිෂ්පාදනය හා වාණිජ ව්‍යාපාර වල උන්නතිය හා සම්බන්ධීකරණය සඳහා මෙන්ම ගුවන් හමුදාවේ සියලුම සේවා හා සිවිල් කාර්ය මණ්ඩලය වෙත තම ගොවිපල නිෂ්පාදන සැපයීම සඳහා ය.

ප. **දන්ත වෛද්‍ය සේවා කාර්යාලය**

හැඳින්වීම. රෝග වැළැක්වීමේ හා සුව කිරීමේ අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවාවක් ලෙස දන්ත වෛද්‍ය සේවය ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සෑම පුද්ගලයෙකුටම පහසුවෙන් හා වෘත්තිමය අයුරින් ලඟා කරගත හැකි විය යුතුය. දන්ත වෛද්‍ය සේවා කාර්යාලය තම සේවාවන් සියලුම ශ්‍රීලංගුහ ආයතන වෙත ව්‍යාප්ත කරන අතරම දන්ත වෛද්‍ය සේවාවේ ගුණාත්මකභාවය නිරතුරුවම වැඩි දියුණු කිරීමට ක්‍රියාකරමින් සිටියි.

බ. **විධායක සංවර්ධන ව්‍යාපෘති ඒකකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා රජය විසින් ආරම්භ කරන ලද සංවර්ධන කාර්යයන්වලට අවශ්‍ය ගල් වැලි සැපයීම සඳහා විධායක සංවර්ධන ව්‍යාපෘති නිලධාරී (CDPO) යටතේ විධායක සංවර්ධන ව්‍යාපෘති ඒකකය (CDPU) පිහිටුවා ඇත. විධායක සංවර්ධන ව්‍යාපෘති නිලධාරී (CDPO) ඍජුවම ගුවන් හමුදාධිපතිට වාර්තා කරයි. ඉදිකිරීම් සඳහා අවශ්‍ය කළුගල් ඉල්ලුම සපුරා ගැනීම සඳහා තෝරාගත් ප්‍රදේශවල ගල්වලවල් (quarry) ආරම්භ කිරීම සඳහා වන වගකීම ගුවන් හමුදාව වෙත පවරා ඇත. සංවර්ධන කටයුතුවලට අමතරව, යුධමය ඉදිකිරීම් සඳහා ත්‍රිවිධ හමුදාව වෙත තම නිෂ්පාදන සැපයීමට ද මෙම ව්‍යාපෘතිය බැඳී සිටියි.

ම. **විධායක ගුවන් ආරක්ෂණ පරීක්ෂණ අංශය (CFSI)**

(1) හැඳින්වීම.

(අ) විධායක ගුවන් ආරක්ෂණ පරීක්ෂණ අංශයේ (CFSI) ප්‍රධානියා ලෙස කටයුතු කරන විධායක ගුවන් ආරක්ෂණ පරීක්ෂණ නිලධාරියා (CFSO) විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ආරක්ෂණ සංවිධානයේ ද මුලසුන හොබවන අතර එම විෂය පථය යටතට ගැනෙන සියලුම කාර්යයන් සඳහා ඔහු ගුවන් හමුදාධිපතිට වගකියනු ලබයි. ගුවන් ආරක්ෂණය සඳහා වන පියාසර හා ඉංජිනේරු කටයුතු හැසිරවීම් සඳහා වෙන් වෙන්ව මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු සිටී.

(ආ) පියාසර කිරීම්, ඉංජිනේරු හා වෛද්‍ය යන අංශ නියෝජනය කරන පරිදි ප්‍රධාන ගුවන් ආරක්ෂණ පරීක්ෂණ නිලධාරීන් තිදෙනෙකු සිටින අතර ඔවුන් ප්‍රතිපත්ති, ක්‍රියාපිළිවෙත් සකස් කිරීම හා විධායක ගුවන් ආරක්ෂණ පරීක්ෂණ අංශයේ සමාලෝචන හා වෙනත් කාර්යයන් ඉටු කිරීම සඳහා විධායක ගුවන් නිරීක්ෂණ පරීක්ෂණ නිලධාරියා සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කරයි. තවද, Fixed Wing, Rotor Wing, Jet Aircraft සහ ගුවන් ගමන් පාලනය යන අංශ නියෝජනය කරමින් ගුවන් ආරක්ෂණ පරීක්ෂකවරු සිව් දෙනෙකු සිටින අතර ඔවුන් ප්‍රධාන ගුවන් ආරක්ෂණ පරීක්ෂකවරයා යටතේ කටයුතු කරයි.

ය. **අභ්‍යන්තර විගණන අංශය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මගින් දක්වා ඇති ව්‍යවස්ථාපිත අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය 2011 වර්ෂයේදී ස්ථාපිත කරන ලදි. ඒ අනුව අභ්‍යන්තර විගණන අංශය ගුවන් හමුදාධිපතිට සෘජුව වගකියන අංශයක් වන අතර "විධායක අභ්‍යන්තර විගණක" යටතේ පාලනය වේ. රජයේ සිවිල් නිලධාරියෙකු ප්‍රධාන අභ්‍යන්තර විගණක (සිවිල්) ලෙස පත්කිරීමෙන් පසු 2017 දී මෙම පත්කිරීම "විධායක අභ්‍යන්තර විගණක (සේවා)" ලෙස නම් කරන ලදි. "ප්‍රධාන අභ්‍යන්තර විගණක (සිවිල්)" ද ස්වාධීනව අභ්‍යන්තර විගණන රාජකාරී ඉටුකරන අතර ශ්‍රී ලංකා ගුවන් හමුදාධිපතිට වාර්තා කරයි.

ර. **විධායක තත්ත්ව නීර්ණ නිරීක්ෂණ ඒකකය**

හැඳින්වීම. ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ තත්ත්ව නිර්ණ නිරීක්ෂණය පිළිබඳ කාර්යයන් ඉටු කිරීම සඳහා විධායක තත්ත්ව නිරීක්ෂණ ඒකකය (CQAI) ස්ථාපිත කර ඇත. මෙම ඒකකයේ ප්‍රධානියා ලෙස විධායක තත්ත්ව නිර්ණ නිරීක්ෂණ නිලධාරියා (CQAO) කටයුතු කරයි. ඔහු තත්ත්ව නිරීක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් ඒකකයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව පිළිබඳ සෘජුවම ගුවන් හමුදාධිපතිට වග කියනු ලබයි.

ළ. **විධායක බඳවා ගැනීමේ කාර්යාලය**

හැඳින්වීම. බඳවා ගැනීම් සිදු කිරීම විධායක බඳවා ගැනීමේ නිලධාරියාගේ වගකීම වේ. බඳවා ගැනීමේ අංශයෙහි කාර්යභාරය වනුයේ ගුවන් හමුදාධිපතිවරයාගේ අණ පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදා නිත්‍ය/ ස්වේච්ඡා සේවයන්ගේ නිලධාරී, කාන්තා නිලධාරී, ගුවන් භට සහ ගුවන් කාන්තා යන පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමයි. ගැසට් නිවේදන, පුවත්පත්/ රූපවාහිනී දැන්වීම් සහ විශේෂ බඳවා ගැනීමේ ප්‍රවාහයන් හරහා මෙම අරමුණ ඉටු කරගනු ලැබේ.

ව. **විධායක පර්යේෂණ හා සංවර්ධන අංශය**

(1) හැඳින්වීම.

(අ) 2011 මාර්තු මස සිට මේ දක්වා විධායක පර්යේෂණ හා සංවර්ධන අංශය ක්‍රියාත්මක වේ. ගුවන් හමුදාවේ සමස්ත කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය ක්ෂේත්‍රවල පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම හා සම්බන්ධීකරණය කිරීම සඳහා දක්වා විධායක පර්යේෂණ හා සංවර්ධන අංශය ස්ථාපිත කර ඇත.

(ආ) කටුනායක ශ්‍රීලංගුහ මූලික කඳවුරේ පර්යේෂණ හා සංවර්ධන පක්ෂාංගය (RDW) 2015 වර්ෂය තුළ ස්ථාපිත කරන ලද අතර එය විධායක පර්යේෂණ සහ සංවර්ධන නිලධාරී (CRDO) යටතේ ක්‍රියාත්මක වේ. පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍රයේ සිටින වෘත්තිකයින්, ආයතන හා විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධ වෙමින් ශ්‍රීලංගුහ පර්යේෂණ අධ්‍යයනයන් පැවැත්වීම හා ඊට අවශ්‍ය පහසුකම් සැපයීම පර්යේෂණ හා සංවර්ධන පක්ෂාංගය වෙත පැවරී ඇත.

ස. **විධායක සුභසාධන ව්‍යාපෘති ඒකකය**

(1) හැඳින්වීම.

(අ) සුභසාධන කටයුත්තක් ලෙස ගුවන් හමුදා සාමාජිකයින්ගේ පරිභෝජනය සඳහා සියලුම අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ හා වෙනත් පාරිභෝජ්‍ය භාණ්ඩ සහනදායී මිලට සැපයීමේ අරමුණින් විධායක සුභසාධන ව්‍යපෘති ඒකකය පිහිටුවන ලදී.

(ආ) විධායක සුභසාධන ව්‍යපෘති ඒකකයේ මෙහෙයුම් කාර්යයන් ලෙස බාහිර ආයතනයන්ගෙන් පාරිභෝජ්‍ය භාණ්ඩ විශාල ප්‍රමාණයෙන් ප්‍රසම්පාදනය කිරීම, එම භාණ්ඩ ගබඩා කිරීම හා දීපව්‍යාප්තව පිහිටි ශ්‍රීලංගුහ ආයතනයන් වෙත ඒවා බෙදා හැරීම ආදී සැලකිය යුතු මට්ටමේ ගණුදෙනු සිදු කරනු ලබයි.

හ. **එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම්**

හැඳින්වීම. 2015 වර්ෂයේ සිට මේ දක්වා මධ්‍යම අප්‍රිකානු ජනරජයේ එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් (MINUSCA) සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් බලඇණි යොදවන ලදී. දැනට MI 17 හා හෙලිකොප්ටර් 03ක් හා ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් බලඇණි 110ක් MINUSCA රාජකාරියෙහි යොදවා ඇත.

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය

2022 වර්ෂයේදී රට තුළ ඇතිවූ සමාජ හා ආර්ථික අර්බුදය වැනි බාධාවන් අභිබවා පහත පරිදි ප්‍රගතිය සිදුකර ඇත.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
ඉලක්කය-01 ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පියාසර හා මෙහෙයුම් ශක්‍යතාවන් ඉහළ නැංවීම හා ශක්තිමත් කිරීම.	(1) චීනයේ M/s CATIC වෙත යවන ලද PT-6 ගුවන්යානා එන්ජින් 08න් PT-6 ගුවන් යානා එන්ජින් 04ක පූර්ණ අළුත්වැඩියාව අවසන් කර ලැබී ඇති අතර ඉතිරි එන්ජින් 04 බලාපොරොත්තුවෙන් සිටී. මෙමගින් ද අංක 01 පියාසර පුහුණු පක්ෂාංගයේ පියාසර පුහුණුව වැඩි දියුණු හා ශක්තිමත් කෙරෙනු ඇත. (2) වසර 35 ක සේවා කාලයක දැනටමත් සම්පූර්ණ කර ඇති Y-12II ගුවන් යානා 02ක් (SCL-853 සහ SCL-854), සඳහා සේවා කාලය වැඩි දියුණු කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදි. වැඩි දුරටත් Y-12II ගුවන් යානාවේ (SCL-854) සේවා දීර්ඝ කිරීම සාර්ථකව නිම කරන ලද අතර අවසාන අනුමැතිය සඳහා තාක්ෂණික ලියවිලි ඉදිරිපත් කරන ලදි. (3) Kfir C2/ C7 මල්ටිරෝල් ජෙට් ගුවන් යානා පහක් (5) ක් C12 අනුවාදයට වැඩිදියුණු කිරීම සිදු වෙමින් පවතී. ව්‍යාපෘතිය 2021 නොවැම්බර් 4 වැනි දින ආරම්භ වූ අතර දළ වශයෙන් 30% ප්‍රගතියක් ලබා ඇත. (4) SFI-783, F-7GS මල්ටිරෝල් ජෙට් ගුවන් යානා ප්‍රතිසංස්කරණය කිරීම කටුනායක ගුවන් හමුදා AOW හරහා සිදු කර ඇත. ව්‍යාපෘතියෙන් අපේක්ෂිත වශයෙන් 80% ක් පමණ අවසන් කර ඇත. (5) පහත සඳහන් බෙල් 212/412/412EP හෙලිකොප්ටර් යානාවල පැය 1000/ වසර 5ක සේවා කාලය සාර්ථකව නිම කර පියාසර මෙහෙයුම් සඳහා මුදා හරින ලදී. (අ) SUH-563 - Bell 212 (ආ) SUH-522 - Bell 412 (ඇ) SUH-523 – Bell 412 (ඈ) SUH-529 – Bell 412 (6) SMH-4428 Mi-171E හෙලිකොප්ටරයේ ප්‍රධාන අලුත්වැඩියාව සම්පූර්ණ කරන ලදී. හෙලිකොප්ටරය 2022 ඔක්තෝම්බර් 23 වන දින ශ්‍රී ලංකාවට භාර දෙන ලද අතර අවසාන භාරගැනීම සඳහා බලා සිටී. (7) අලුතින් මිලදී ගත් Bell 206 හෙලිකොප්ටරය (SHT-556) ප්‍රතිසංස්කරණය අවසන් කර පියාසර පුහුණු මෙහෙයුම් සඳහා නිදහස් කරන ලදී.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
	(8) SJT-749 K-8 ගුවන් යානා සහ SFI-708 F-7BS ගුවන් යානාවල යුධඅවි අමතර කොටස් අළුත්වැඩියා කිරීම. (9) අංක 10 බලඝණය සඳහා වායුරෝධක පද්ධතියක් මිල දී ගැනීම, Bell 206 බිම් හැසිරවීමේ රෝද 12ක්, Bell 212/ 412 බිම් හැසිරවීමේ රෝද 12ක් සහ මහන මැෂිමක් මිලදී ගැනීම. (10) පහත පුහුණු පැවැත්වුණි, (අ) පකිස්ථානයේ පැවති ආධුනික ගුවන් යානා පුහුණු පාඨමාලාව (ගුවන් සහ බිම්) සඳහා ශ්‍රීලංගුහ භටයින් හය දෙනෙකු (තාක්ෂණික), පස්වතාවක් සහභාගී විය. (ආ) ඉන්දියාවේ පැවති MI-17, ඉලෙක්ට්‍රොනික්ස් ෆිටර් (IPT), ඩ්‍රෝනියර් සමුද්‍රීය ඔත්තු බැලීමේ ගුවන් යානාවල පියාසර සහ තාක්ෂණික පුහුණුව, ඩ්‍රෝනියර් සමුද්‍රීය ඔත්තු බැලීමේ ගුවන් යානාවල පියාසර සහ තාක්ෂණික පුහුණුව, තත්ත්ව සහතික (ගුවන්) (QAS-A), Indra Mk II Radar පුහුණු පාඨමාලා සඳහා 24 වතාවක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ (තාක්ෂණ ශිල්පී) 60 දෙනෙක් (නිරීක්ෂකයින්) සහභාගී වූහ. (ඇ) ඇමරිකා එක්සත් ජනපදයේ ගුවන් තොටුපළ මෙහෙයුම්, සැපයුම්, උපකරණ හුරුපුරුදු පුහුණු පාඨමාලා සඳහා දෙවතාවක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ (තාක්ෂණ ශිල්පී) දෙදෙනෙකු සහභාගී විය. (ඈ) ඇමරිකා එක්සත් ජනපදයේ ආරක්ෂක සේවා තාක්ෂණික මාණ්ඩලික නිලධාරි පුහුණු පාඨමාලා සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ එක් පුද්ගලයෙක් (තාක්ෂණ ශිල්පී) එක්වරක් සහභාගී විය.
ඉලක්කය-02 අනන්‍ය ආර්ථික කළාපය ද ඇතුළුව ශ්‍රී ලංකා භූමිය තුළ උපායමාර්ගික හා උපායශීලී ගුවන් නිරීක්ෂණ හා සෝදිසි හැකියාවන් වර්ධනය කිරීම.	(1) ඔත්තු බැලීමේ හැකියාවන් සහිත ඩ්‍රෝනියර් ගුවන් යානය (SMR-846) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට හඳුන්වා දෙන ලදී. මෙම ගුවන් යානය ඉන්දියානු රජය විසින් සමුද්‍රීය වසම සුරක්ෂිත කිරීම සඳහා ලබා දී ඇත. (2) AASL විසින් එකඟ වූ පරිදි ඔවුන්ගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පද්ධතිය වැඩිදියුණු කරමින් නව ATM පද්ධතිය ශ්‍රීලංගුහ AD ජාලයට ලබා ගැනීම. (3) Indra MK II රේඩාර් සඳහා දේශීය ග්‍රාහකයක් සංවර්ධනය. (4) භූමි පාලන ස්ථානයක් පිහිටුවීම. (5) දේශීය UAV ගුවන් යානයක් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම, වැඩිදියුණු කළ සහ ශක්තිමත් සැලසුම් අංගයන් සමඟ ඉදිකළ Lihiniya Mk IE ව්‍යාපෘතියෙන් ආසන්න වශයෙන් 60%ක් අවසන් කර ඇත.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
	(6) ILOC (ඉන්දියානු ණය රේඛාව) හරහා නව රෝහිණී රේඩාර් පද්ධති දෙකක් අත්පත් කරගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. (7) 100Km Data down Link පද්ධතියක් අත්පත් කර ගැනීම සිදු කරමින් පවතී. (8) 09 extend කුඩා දත්ත සම්බන්ධක පද්ධති දෙකක් මිලදී ගැනීම. (9) Global Navigation චන්ද්‍රිකා පද්ධතිය මිලදී ගැනීම. (10) CDRD පිටිපන විසින් අරමුදල් සපයන ලද පර්යේෂණ ව්‍යාපෘතියක් ලෙස මීරිගම ගුවන් හමුදා කඳවුරේ ADC සහ CC වෙත IP පදනම් කරගත් ගොඩබිම සිට ගුවන දක්වා සන්නිවේදන අධීක්ෂණ පද්ධතිය සංවර්ධනය කරන ලදී. (11) CDRD පිටිපන විසින් අරමුදල් සපයන පර්යේෂණ ව්‍යාපෘතියක් ලෙස ගුවන් ආරක්ෂක මෙහෙයුම් මධ්‍යස්ථානයේ (ADOC)/ Air Defense Radar Squadons (ADRS) හි ගුවන් ආරක්ෂක සිමියුලේටර් පද්ධතිය වැඩිදියුණු කිරීම සම්පූර්ණ කරන ලදී.
ඉලක්කය-03 ඉලෙක්ට්‍රොනික යුධ කටයුතු පිළිබඳ ඒකකය පිහිටුවීම හා ජාල කේන්ද්‍රීය යුධ මෙහෙයුම් හඳුන්වාදීම.	(1) ශ්‍රීලංගුහ ගුවන් ආරක්ෂා ජාල ශක්‍යතාව ඉහළ නැංවීම සඳහා ඩ්‍රෝන් ජෑමර් මිලදී ගැනීම. (2) අනාවරකය සහ ජෑමරය පදනම් කරගත් ඩොප්ලරයේ මූලික සැලැස්ම ශ්‍රීලංගුහ රත්මලාන මූලික කඳවුරේ E&TE පක්ෂාංගයේ R & D රසායනාගාරයේ සංවර්ධනය කර ඇත. ඊළඟ පියවර ලෙස ප්‍රෝටෝ වර්ගයේ ඩ්‍රෝන් අනාවරකය සහ ජෑමර් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇත. (3) ගුවන් යානා ආවේක්ෂණ විකාශන පද්ධතිය (ASD-B) ගුවන් යානා නිරීක්ෂණ පද්ධතිය සාර්ථකව සංවර්ධනය කර භාවිතයට සූදානම් කර ඇත. (4) ගුවන් යානා හඳුනාගැනීමේ පද්ධතිය (AIS) සමුද්‍රීය නිරීක්ෂණ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා චීන වරාය ශ්‍රීලංගුහ ඇකඩමියේ අංක 03 සමුද්‍රීය බලඝණයේ ඩ්‍රෝනියර් ගුවන් යානා සමඟ ඒකාබද්ධ කර ඇත. (5) ගුවන් ආරක්ෂක රේඩාර් නිරීක්ෂණ හැකියාව ප්‍රශස්ත මට්ටමින් පවත්වා ගැනීම සඳහා රේඩාර් නඩත්තු කටයුතු සිදු කරනු ලැබේ. (6) EW කළමනාකරණ අංශය අධ්‍යක්ෂක මට්ටමින් පිහිටුවා ඇති අතර අනාගත සංවර්ධන සැලසුම් කිරීම සඳහා මාණ්ඩලික නිලධාරියෙකු පත් කර ඇත.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
ඉලක්කය-04 අත්‍යවශ්‍ය ගුවන් වත්කම්, ස්ථාපිතයන් සඳහා පුළුල් පිරිස් ආරක්ෂාවක් ලබාදීම සහ VAs සහ VPs සඳහා ආරක්ෂාව සැපයීම.	(1) දේශ සීමා ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා ශ්‍රීලංගුහ ආයතනයන්ට ආවේක්ෂණ කැමරා (CCTV) සහ අදාළ වන උපකරණ ලබා ගැනීම. (2) R&D ව්‍යාපෘතිය හරහා ධාරිතා ගොඩනැගීමේ පුහුණු ව්‍යාපාර පැවැත්වීම සහ තාක්ෂණික දියුණුව.
ඉලක්කය-05 දිවා/ රාත්‍රී/ සියලු කාලගුණික තත්ත්වයන් තුළ මෙහෙයුම් අතිරික්තතාව අත්කර ගැනීම සහ ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ධාවනපථ වැඩිදියුණු කිරීම්.	(1) වීරවිල ගුවන් හමුදා කඳවුරේ ධාවන පථය සහ කුලී රථ ආලෝක පද්ධතිය ස්ථාපනය කිරීම. (2) වවුනියාව ගුවන් හමුදා කඳවුරේ ධාවන පථයේ හානියට පත් ප්‍රදේශය ප්‍රතිසංස්කරණය කිරීම (චිප් සීල් කිරීම). (3) ශ්‍රී ලංකා ගුවන් හමුදා වවුනියාව කඳවුරේ මධ්‍ය ඇප්‍රොන් හි පුළුල් කිරීමේ සන්ධි නිවැරදි කිරීම. (4) හිඟුරක්ගොඩ ගුවන් හමුදා මූලික කඳවුරේ ගුවන් යානා අංගනය නැවත වාත්තු කිරීම.
ඉලක්කය-06 මිත්‍ර හමුදාවන් හට සයිබර් අවකාශය භාවිතයේදී නිදහස තහවුරු කිරීම හා සතුරු පාර්ශවයන් හට එය භාවිතය/ අයතා භාවිතය ප්‍රතික්ෂේප කරමින් සයිබර් අවකාශය උපරිම අයුරින් භාවිතයට ගැනීම.	(1) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානයට කාර්මික වශයෙන් දක්ෂ පුද්ගලයින් සේවයේ යෙදවීම. (2) දැනට සිටින සාමාජිකයින්ගේ සයිබර් ආරක්ෂණ නිපුණතා සහ කුසලතා වැඩි දියුණු කිරීම. (3) සයිබර් තර්ජනවලට එරෙහිව සටන් කිරීම සඳහා විශේෂ සයිබර් ආරක්ෂණ කණ්ඩායම් සැකසීම. (4) සර්වරය දැඩි කිරීමේ ක්‍රියා පටිපාටිය ක්‍රියාත්මක කිරීම. (5) ගුවන් හමුදා ආයතනවල දත්ත මධ්‍යස්ථාන විගණන සහ තොරතුරු තාක්ෂණ විගණන පැවැත්වීම. (6) අභ්‍යන්තර පද්ධති සහ මොඩියුලවල අවදානම් තක්සේරු කිරීම. (7) ශ්‍රීලංගුහ වෙබ් අඩවි තත්‍ය Cloud වේදිකාවකට සංක්‍රමණය කිරීම. (8) ශ්‍රීලංගුහ නිල වෙබ් අඩවිය සඳහා Cloud මත පදනම් වූ ආරක්ෂණ වේදිකාවක් යෙදවීම. (9) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානයට නව විධාන ව්‍යුහයක් හඳුන්වාදීම, තොරතුරු තාක්ෂණ ඉංජිනේරු ශාඛාවේ නව ශාඛා පිහිටුවීම. (10) විවෘත මූලාශ්‍ර බුද්ධිය රැස් කිරීම සඳහා තොරතුරු මෙහෙයුම් මධ්‍යස්ථානයක් සැකසීම. (11) ශ්‍රීලංගුහ සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානයෙහි හැකියාවන් පුළුල් කිරීම සඳහා සයිබර් ආරක්ෂණ මෙවලම් මිලදී ගැනීම සහ සංවර්ධනය කිරීම.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
ඉලක්කය-07 අමතර සුභසාධන කටයුතු ඇති කිරීම මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ප්‍රවාසතාව අවම කිරීම හා ඉහළ චිත්ත ධෛර්යයක් පවත්වාගෙන යාම.	(1) පවතින අවශ්‍යතාවය සපුරාලීම සඳහා මානව සම්පත් කළමනාකරණ තොරතුරු පද්ධතිය (HRMIS) සංවර්ධනය කිරීමට කටයුතු කර ඇත. (2) පවුලේ අය සමඟ සිටීමට වැඩි අවස්ථාවක් ලබා දීම පිළිබඳ සමාලෝචනයේ දී, වාර්ෂික ස්ථාන මාරුකිරීම් කාලසටහන් කිරීමේදී සේවා පුද්ගලයින් විසින් ඉල්ලා සිටින ස්ථාන මාරුකිරීම් තේරීම්වලට ප්‍රමුඛත්වය ලබා දී ඇත. (3) මේ වන විට බොහෝ සේවා නිලධාරීන් විවිධ හේතූන් මත සේවයෙන් ඉවත්ව යාමට පුරුදුව සිටිති. එමනිසා, ඔවුන්ගේ දුක්ගැනවිලි විසඳීම සඳහා, ඔවුන් තවදුරටත් සේවයේ රැඳී සිටීමට පෙළඹවීම සඳහා ඔවුන්ගේ ඉහළ නිලධාරීන් විසින් නිතිපතා සම්මුඛ සාකච්ඡා කරනු ලැබේ. (4) මිනී පෙට්ටිය සහ එම්බාම් ගාස්තුව රුපියල් 60,000.00 දක්වා වැඩිකර අවමංගල්‍ය වියදම් ඉහළ දැමීමට කටයුතු කර ඇත. (5) POR ස්වයංක්‍රීය ක්‍රමය හඳුන්වා දී ඇත. (නිවාඩු, රාජකාරී දීමනාව, L/out) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අදාළ මානව සම්පත් හිඟය සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සිටින සේවා පුද්ගලයින් සඳහා වන කාර්‍යයන් අවම කිරීම සඳහා. (6) මූල්‍ය ගැටලු අවම කර ගැනීම සඳහා සලාක දීමනාව සහ බැට්මෑන් දීමනාව නිලධාරීන්ගේ වැටුප් සමඟ ගෙවීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක කරන ලදී. (7) භටයින් සඳහා වන කාර්යභාරය අවම කිරීම සඳහා සහ ලිපි ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සඳහා ස්වයංක්‍රීය මෙහෙයුම් වාර්තා පොත් (F.540) පද්ධතිය ක්‍රියාත්මක කරන ලදී. (8) වසර පුරා සේවා පුද්ගලයින්ගේ වෘත්තීය කුසලතා වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. (9) ඔවුන්ගේ විෂයයන් පිළිබඳ ප්‍රවීණයන් වන අයට මෘදුකාංග වැඩසටහන් සංවර්ධනය කිරීමට පෙළඹවීම සහ අවස්ථාව ලබා දීම. (10) ඔවුන්ගේ වෘත්තීන් සඳහා පිළිගැනීමක් ලබා ගැනීම සඳහා NVQ මට්ටමේ ප්‍රමිතිය සපුරාලීම සඳහා සියලු නිලයන්ගේ පුහුණුවේ ප්‍රමිතිය ඉහළ නංවා ඇත. (11) ගුවන් හමුදාවේ උසස් සහ මූලික පාඨමාලා සඳහා විද්‍යුත් සටහන් පුහුණුව හඳුන්වා දී ඇත. (12) ශ්‍රීලංගුහ රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථාන හරහා ගුවන් හමුදා සාමාජිකයින්, ඔවුන්ගේ පවුල් සහ විශ්‍රාමික පුද්ගලයින් සඳහා වෛද්‍ය පහසුකම් නඩත්තු කිරීම. (13) ගුවන් හමුදා සාමාජිකයින්, ඔවුන්ගේ පවුල් සහ විශ්‍රාමික පුද්ගලයින් සඳහා කටුනායක ගුවන් හමුදා කඳවුරේ රුධිර කාන්දු පෙරන පහසුකම පවත්වාගෙන යනු ලැබේ.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
	(14) කටුනායක ගුවන් හමුදා රෝහලේ විශ්‍රාමික වාට්ටු සංකීර්ණයේ විශ්‍රාමික ගුවන් හමුදා සාමාජිකයින් සඳහා අභ්‍යන්තර ප්‍රතිකාර පහසුකම් පවත්වාගෙන යනු ලැබේ. (15) ගුවන් හමුදා දිනපොත් සහ දින දර්ශන සියලුම සේවා පුද්ගලයින්, සිවිල් කාර්ය මණ්ඩලය, ක්‍රියාන්විතයේදී මියගිය සාමාජිකයින්ගේ සමීප ඥාතීන් සහ ආබාධිත සාමාජිකයින් අතර නොමිලේ බෙදා දෙන ලදී. (16) ගුවන් හමුදා වාර්ෂික අවුරුදු පොළ 2022 අප්‍රේල් මාසය තුළ සංවිධානය කර පවත්වන ලදී. (17) කටුනායක ගුවන් හමුදා කඳවුර මඟින් පාසල් ගොඩනැගිලි ඉදිකිරීමේ 1 වන සහ 2 අදියර මීගමුව කළාප අධ්‍යාපන කාර්යාලය සමඟ සම්බන්ධීකරණය කර ඇත. (18) විශ්‍රාමික ගුවන් හමුදා සාමාජිකයින් සඳහා රැකියා බැංකුවක් පවත්වාගෙන යනු ලැබේ. (19) ආබාධිත නිලධාරීන් සඳහා පහත වෛද්‍ය ආධාර පරිත්‍යාග කරන ලදී, (අ) කෘතිම ඇස් 01 (ආ) කෘතිම අත් පා 30 (ඇ) රෝද පුටු 04 (ඈ) කිහිලි කරු 02 (20) සේවා පුද්ගලයින්ගේ සමීප ඥාතීන් සඳහා රැකියා ස්ථාන මාරුවීම් සඳහා ලිපි ලබා ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී. (21) කොළඹ සහ කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයට ළමුන් 92ක් ඇතුළත් කිරීම ආරක්ෂක අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් සිදු කරන ලදී. (22) සුභසාධන පහසුකම් නංවාලීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා ආයතන වෙත ආධාර ලබා දෙන ලදී. (23) බාහිර රැකියා අවස්ථා සඳහා අයදුම් කිරීම සඳහා ඉල්ලුම් කරන ලද සේවා පුද්ගලයින්ට සේවා සහතික නිකුත් කරන ලදී. (24) ශ්‍රී ලංකා ගුවන් හමුදා සෙබළුන් 35 දෙනෙකුට ඔවුන්ගේම නිවාස ප්‍රතිසංස්කරණය කිරීම සහ ඉදිකිරීම සඳහා ශ්‍රම ආධාර ලබා දෙන ලදී. (25) රණවිරු සේවා අධිකාරියට අනුබද්ධව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ බලලත් නිලධාරීන් අතර විරුසර වරප්‍රසාද කාඩ්පත් 53ක් බෙදා දෙන ලදී. (26) ගුවන් හමුදා පෙරපාසල් ගුරුවරුන් 59 දෙනෙකු සඳහා අවශ්‍ය සාරි නොමිලේ බෙදා දෙන ලදී.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
	(27) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දේපළවලින් ඉඩම් කට්ටි 26ක් මූල්‍ය සහන වශයෙන් තෝරාගත් සේවා පුද්ගලයින් අතර බෙදා දෙන ලදී. (28) වැඩිදියුණු කළ ප්‍රවේශ්‍යතාවය සහ උසස් තාක්ෂණය හඳුන්වාදීම මඟින් උසස් දන්ත වෛද්‍ය පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම තුළින් ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයින් සහ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයන් සඳහා සපයනු ලබන දන්ත වෛද්‍ය සේවාවන් වැඩිදියුණු කිරීම. (29) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවයේ නියුතු සාමාජිකයින්ට, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට සහ සිවිල් පුද්ගලයින්ට ලබාදිය හැකි උපරිම මුඛ සෞඛ්‍ය සේවා සැපයීම. (30) ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පවරන ලද රාජකාරී අතරතුර ගිනි අවි භාවිතය හේතුවෙන් නීතිමය ක්‍රියාමාර්ගවලට මුහුණ දෙන සේවා පුද්ගලයින්ට සහය වීම සඳහා නීති ආධාර අරමුදල ස්ථාපිත කර ඇත. (31) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නීති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අඛණ්ඩ නීති අධ්‍යාපන වැඩසටහන සහ නීති ආධාර වැඩසටහන හඳුන්වා දී ඇත්තේ සේවා පුද්ගලයින්ගේ නීති දැනුම වැඩි දියුණු කිරීම සහ ඒවා අවශ්‍ය අයට නොමිලේ නීති උපදෙස් ලබා දීම සඳහාය.
ඉලක්කය-08 ජාතික අවශ්‍යතාවයට සහය වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු සම්පත් ප්‍රශස්තීකරණය	(1) ගුවන් හමුදාව විසින් රු. 14,074,086.00 කුලී ගුවන් ගමන් හරහා උත්පාදනය කර ඇති අතර එම මුදල රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ. (2) SMH-4417 සහ SMH-4418 MI-171SH හෙලිකොප්ටර් 2022 මාර්තු මස මධ්‍යම අප්‍රිකාවේ එක්සත් ජාතීන්ගේ දූත මණ්ඩල වෙත පූර්ණ අළුත්වැඩියාවෙන් පසු යෙදවීම. (3) වවුනියාව දිස්ත්‍රික්කයේ, හල්මිල්ලාව ගම්මානය, කණුගහවැව ගම්මානය සහ තල්ගහවැව ගම, යන මුළු භූමි ප්‍රමාණය කිලෝමීටර් 13 යි මීටර් 740 කින් ආවරණය වන පරිදි බලපාන ගම්මාන සඳහා විදුලි වැට ඉදිකිරීම. (4) 2022 වර්ෂය තුළ ශ්‍රීලංකන් එයාර්ලයින් ගුවන් යානා 3,296 ක් විෂබීජහරණය කර ඇත. (5) SCM-3501 සහ SCM-3502, MA-60 ගුවන් යානා වල බිම්මැදිරි අළුත්වැඩියා කිරීම සහ Helitours (Pvt) Ltd යටතේ සිවිල් පියාසර මෙහෙයුම් නැවත ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියෙන් 50% ක් පමණ අවසන් කර ඇත. (6) ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කරන ලද සියලු දායකත්වයන් සඳහා ප්‍රවාහන පහසුකම් සපයා ඇති අතර වෘත්තීය උපදේශන, විශේෂිත සකස්කිරීම්/ නිෂ්පාදන සහ පුහුණු ශ්‍රමය සම්බන්ධයෙන් අවශ්‍ය සාමාන්‍ය ඉංජිනේරු සහාය ලබා දෙන ලදී.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
	(7) එක්සත් ජාතීන්ගේ දූත මණ්ඩල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය දක්ෂ වෘත්තිකයින් සහ සාමාන්‍ය ඉංජිනේරු සම්පත් ලබා දීම. (8) අනපේක්ෂිත ස්වභාවික විපත් සහ අනෙකුත් ජාතික අවශ්‍යතා ඇතුළුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අවශ්‍යතා සපුරාලීම සඳහා දැනට පවතින ප්‍රවාහන/විශේෂිත වාහන සේවා හැකියාවේ ඉහළම මට්ටමක පවත්වාගෙන යාම. (9) මධ්‍යම අප්‍රිකාවේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම සඳහා අත්‍යාවශය ශක්තිය සහ උපකරණ ලබා දී ඇත. (10) ජාතික අවශ්‍යතා සඳහා සහාය දැක්වීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඉලක්ක සපුරා ගැනීම සඳහා මානව සම්පත් සපයා ඇත. (11) එක්සත් ජාතීන්ගේ මෙහෙයුම සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල උපකරණ සපයා ඇත. (12) සාමාන්‍ය ජනතාව ඉලක්ක කර ගනිමින් ගුවන් හමුදා වෛද්‍ය කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් බාහිර වෛද්‍ය සායන/ සෞඛ්‍යය සායන පැවැත්වීම. (13) වෛද්‍යකාර්ය මණ්ඩලය නිසි අවස්ථාවන්වලදී ලබාදීම තුළින් ගුවන් හමුදාව විසින් සිදුකරනු ලබන ගුවන් මඟින් රෝගීන් ප්‍රවාහනය කිරීමේ සේවාව පවත්වාගෙන යාමට අවශ්‍ය සහාය ලබාදීම. (14) MINUSCA හි පවතින එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම වෛද්‍ය උපකරණ, පරිභෝජන ද්‍රව්‍ය සහ කාර්ය මණ්ඩලය ලබා දීමෙන් තිරසාර කරන ලදි. (15) රාජ්‍ය අංශයේ රෝහල් සම්බන්ධීකරණයෙන් ස්වභාවික විපත් වලදී අවශ්‍ය වෛද්‍ය සහාය ලබා දීම. (16) එවැනි තර්ජන තුරන් කිරීම සඳහා අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබා දෙන ලදී. එවැනි අවදානමක් ඇති විට වෛද්‍ය කාර්ය මණ්ඩලයේ සහාය සෑම විටම සපයනු ලැබේ. (17) 2022 වර්ෂය තුළ කුකුළේගඟ, IPSTOL හි එක්සත් ජාතීන්ගේ පූර්ව යෙදවීමේ පාඨමාලාවක් සාර්ථකව නිම කරන ලදී. (18) 2022 වර්ෂය තුළ CBRNE මූලික පාඨමාලා 05ක් සහ උසස් පාඨමාලා 03ක් සාර්ථකව සම්පූර්ණ කර ඇත. (19) ආපදා කළමනාකරණ මූලික පාඨමාලා 02ක් සහ දුනු විදීමේ පාඨමාලා 05ක් සාර්ථකව නිම කර ඇත. (20) ජාතික වෙසක් උත්සවය සඳහා කුරගල රජමහා විහාරස්ථානයේ සහ බෞද්ධාලෝක වෙසක් කළාපයේ ආරක්ෂක

<table>
<tr><th>ඉලක්කය</th><th>ප්‍රධාන ජයග්‍රහණයන්</th></tr>
<tr><td></td><td>අමාත්‍යාංශය සහ ත්‍රිවිධ හමුදාව සම්බන්ධ කර ගනිමින් අවශ්‍ය සහය ලබා දෙන ලදී.

(21) MOD සහ අනෙකුත් සහෝදර සේවාවන් සම්බන්ධ කර ගනිමින් BMICH හි පැවති ජය පිරිත සජ්ඣායනා කිරීමේ මහෝත්සවය පැවැත්වීම සඳහා සහය ලබා දෙන ලදී.

(22) ගංගාරාම විහාරස්ථානයේ නවම් මහා පෙරහැර සහ බෙල්ලන්විල රජමහා විහාරස්ථානයේ මහා පෙරහැර පැවැත්වීම සඳහා සහය ලබා දෙන ලදී.

(23) අම්පාර දීඝවාපිය චෛත්‍යයේ සර්වඥ ධාතූන් වහන්සේ තැන්පත් කිරීම සඳහා අවශ්‍ය සහය ලබා දෙන ලදි.

(24) ශ්‍රී පාදය පවිත්‍ර කිරීමේ වැඩසටහන මාර්තු මාසයේදී පවත්වන ලදී.

(25) රට තුළ මත්ද්‍රව්‍යය උවදුර තුරන් කිරීම සඳහා, ශ්‍රී ලංකා පොලීසිය සහ අනෙකුත් බුද්ධි අංශ සමඟ සම්බන්ධතා පවත්වමින් පහත අත්අඩංගුවට ගැනීම් සිදු කරන ලදී. (අත්අඩංගුවට ගත් සැකකරුවන් - 232).

<table>
<tr><th>මත්ද්‍රව්‍ය</th><th>ප්‍රමාණය</th></tr>
<tr><td>හෙරොයින්</td><td>126.291 g</td></tr>
<tr><td>කේරළ ගංජා</td><td>5.2 kg</td></tr>
<tr><td>අයිස් මත්ද්‍රව්‍ය</td><td>580.9 g</td></tr>
<tr><td>නීති විරෝධී පෙති</td><td>6,855</td></tr>
<tr><td>ගංජා</td><td>10.537 kg</td></tr>
<tr><td>ගංජා පැල</td><td>5,017</td></tr>
<tr><td>මාවා</td><td>2.24kg</td></tr>
<tr><td>නීති විරෝධී මත්පැන්</td><td>5,614.1 Ltrs</td></tr>
<tr><td>මරිජුවානා මිශ්‍ර මත්ද්‍රව්‍ය</td><td>1,741</td></tr>
<tr><td>නීති විරෝධී සිගරට්</td><td>9,060</td></tr>
<tr><td>අක්‍රමවත් දුම</td><td>2.24kg</td></tr>
<tr><td>විදේශීය මත්පැන්</td><td>39 Ltrs</td></tr>
</table>
වගුව -1

(26) දන්ත මධ්‍යස්ථාන නොමැති ස්ථානවල ජංගම දන්ත සායන පැවැත්වීම.

(අ) ප්‍රතිකාර සංඛ්‍යාව - 110
(ආ) රෝගීන් සංඛ්‍යාව - 64

(27) බහුවිධ ජංගම දන්ත සායන පැවැත්වීම.
(අ) ප්‍රතිකාර ගණන - 1,178
(ආ) රෝගීන් සංඛ්‍යාව - 960</td></tr>
<tr><td><u>ඉලක්කය-09</u>
කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා වෘත්තීමය දක්ෂතා වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දැනට</td><td>(1) කැඩෙට් නිලධාරි පුහුණුව දැනටමත් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය විසින් සංශෝධනය කර 2022 ජූලි 5 අනුමත කර ඇත.</td></tr>
</table>

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
ක්‍රියාත්මක පුහුණු වැඩසටහන් පද්ධතිය හා එහි ක්‍රියාවලියන් සමාලෝචනය කිරීම.	(2) පුහුණුවීම් සඳහා විෂය නිර්දේශ බොහොමයක් විශේෂඥ නිලධාරීන්ගෙන් සමන්විත ස්වාධීන මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇත.
ඉලක්කය-10 නව තාක්ෂණය හඳුන්වාදීම හා බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදා බලකා ව්‍යුහය නිරවද්‍ය ප්‍රමාණයට ගෙන ඒම.	(1) ශ්‍රී ලංකා ගුවන් හමුදා මානව සම්පත් නිරවද්‍ය ප්‍රමාණයට ගෙන ඒම සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාදාමයන් සඳහා අදාළ තොරතුරු සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සම්පත් නිරවද්‍ය ප්‍රමාණයට ගෙන ඒම සම්බන්ධ යෝජනා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ උසස් බලධාරීන් වෙත ඉදිරිපත් කර ඇත. (2) මාණ්ඩලික ප්‍රධානී විසින් පත් කරන ලද නිලධාරී මණ්ඩලය විසින් අධ්‍යනයක් සිදු කර ඉදිරි ක්‍රියාමාර්ග සඳහා මණ්ඩලයේ නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
ඉලක්කය 11 නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මඟින් ශ්‍රීලංගුහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ තත්ත්වය පිළිබඳ දැනුවත්වීම වැඩි දියුණු කිරීම.	(1) AI ක්‍රමවේද භාවිතයෙන් ඉලක්කයක් සහ විභව තර්ජන හඳුනා ගැනීමට ස්වයංක්‍රීය විසඳුමක් සංවර්ධනය කරන ලදී. (2) ADRS සහ ADC සහ CC වෙත සංයුක්ත රේඩාර් පින්තූර සැපයීම සඳහා ස්වයංක්‍රීය මධ්‍යම රේඩාර් ඒකාබද්ධ පද්ධතියක් සංවර්ධනය කරන ලදි. (3) AERS පද්ධතියේ අනාගත ගුවන් යානා සේවා අවශ්‍යතා පුරෝකථනය කිරීමට සහ හඳුනා ගැනීමට මෘදුකාංග මොඩියුලයක් සංවර්ධනය කරන ලදී. (4) ශ්‍රීලංගුහ හි ඉහළ ගුවන් යෝග්‍යතාවය පවත්වා ගැනීම සඳහා අනාගත සැපයුම් අවශ්‍යතා පුරෝකථනය කිරීම සඳහා මෘදුකාංග මොඩියුලයක් සංවර්ධනය කරන ලදී. (5) ශ්‍රීලංගුහ හි කඩදාසි භාවිතය අවම කිරීම සඳහා ස්වයංක්‍රීය ප්‍රවාහ කළමනාකරණ විසඳුමක් හඳුන්වා දෙන ලදී. (6) තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහාය වීම සඳහා ස්වයංක්‍රීය පද්ධතියක් සඳහා විශ්ලේෂණ උපකරණ පුවරුව හඳුන්වා දීම. (7) ගැටුම් ප්‍රදේශ/ යුධ පිටියේ සහ ආපදා තත්ත්වයන්හි හමුදා ස්ථාන නිරීක්ෂණය කිරීමෙන් සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීම සඳහා සේවාවන් සමඟ සහයෝගයෙන් ජාල කේන්ද්‍රීය මෙහෙවර සැලසුම් පද්ධතියක් සංවර්ධනය කරන ලදී. (8) ශ්‍රීලංගුහ මූලස්ථානය සඳහා අකුරේගොඩ DHQC හි දේශීය විධායක සහ පාලන මධ්‍යස්ථානයක් නිර්මාණය සහ සංවර්ධනය සඳහා ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. මූලික යෝජනාව අනුමත කරන ලද අතර සංවර්ධන ක්‍රියාවලිය රත්මලාන අංක 01 තොරතුරු තාක්ෂණ පක්ෂාංගයේ (ITW) දී ආරම්භ විය. (9) කටුනායක ශ්‍රීලංගුහ මූලික කඳවුරේ සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොල කඳවුර අතර සන්නිවේදනය වේගවත්, විශ්වසනීය සහ දිගු දුර අතර ආරක්ෂාකාරී බව තහවුරු කිරීම සඳහා නව ෆයිබර් ඔප්ටික් රැහැන් ඇදීම.

ඉලක්කය	ප්‍රධාන ජයග්‍රහණයන්
	(10) දේපල හානිය අවම කිරීම හා පද්ධතිවල විශ්වසනීයත්වය ආරක්ෂා කිරීම තහවුරු කිරීම සඳහා මීරිගම ශ්‍රීලංගුහ කඳවුරෙහි ADC&CC සඳහා අකුණු සන්නායක පද්ධතියක් ස්ථාපිත කිරීම.

වගුව - 1

2.1.1 2002 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධනය පිළිබඳ සාරාංශය

අ. ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකය

(1) පහත සඳහන් ප්‍රධාන මෙහෙයුම් වර්ගීකරණයන් යටතේ 2022 වර්ෂය තුළ පියාසර කරන ලද මුළු පියාසර පැය ගණන 6,298.17 කි.

අනු අංකය	මෙහෙයුම් වර්ගය	පියාසර පැය
01	මෙහෙයුම්	2,527.30
02	පුහුණු	3,122.45
03	විශේෂ පුද්ගල ගුවන් ගමන්	131.55
04	ප්‍රභූ පුද්ගල ගුවන් ගමන්	81.58
05	වාණිජ	17.10
06	පරීක්ෂණ පියාසර කිරීම්	398.49
07	දිවයිනෙන් බැහැරට පියාසර කිරීම්	4.00
08	ආපදා සහන මෙහෙයුම්	14.10
එකතුව		**6,298.17**

වගුව - 2



රූප සටහන - 1

(2) ගුවනින් ගමන් කළ මඟින් සංඛ්‍යාව - 566

(3) ගුවනින් ගෙනගිය භාණ්ඩ සංඛ්‍යාව - 795 Kg

(4) පසුගිය වසර හය (6) තුළ පියාසර පැය ගණන් සැසඳීම පහත පරිදිය.

මෙහෙයුම් වර්ගය	වර්ෂය					
	2017	2018	2019	2020	2021	2022
මෙහෙයුම්	-	4,448.40	3,793.25	3,337.85	3,969.50	2,527.30
ඒකාබද්ධ මෙහෙයුම්	-	112.20	264.45	-	-	-
මෙහෙයුම් විදේශීය	-	2,077.55	2,165.13	2,341.64	-	-
පුහුණු	5,875.38	6,412.19	7,890.14	6,868.40	5,757.01	3,122.45
ප්‍රභූ පුද්ගල ගුවන් ගමන්	601.30	618.15	641.50	329.85	221.05	131.55
විශේෂ පුද්ගල ගුවන් ගමන්	281.35	220.15	153.05	84.30	131.50	81.58
වාණිජ	278.35	117.50	235.00	35.80	37.50	17.10
මුහුදින් එතෙර	-	20.00	-	64.25	67.15	4.00
වෙනත්	5,685.50	617.40	86.05	-	751.57	412.59
එකතුව	**12,721.88**	**14,645.14**	**15,229.37**	**13,062.09**	**10,926.48**	**6,298.17**

වගුව - 3



රූප සටහන - 2

(5) ගුවන් මෙහෙයුම් අධ්‍යක්ෂකයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සාපේක්ෂව තත්‍ය කාර්යසාධනය.

අනු අංකය	2022 දී මිලට ගත් අයිතමයන්	මුදල (ලං.රු.මි)
01	Mist blower (Ea-05)	0.16
02	ගිනි නිවීම් උපකරණ (Ea-268) Fire blanket (Ea-30) Delivery Hose 25m (Ea-24)	3.60
03	BA Sets (Ea-05)	3.36
04	ගිනි ආරක්ෂණ හෙල්මට් (Ea-15)	2.48

වගුව – 4

(6) 2022 වර්ෂය තුළ ලබා ගත් ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කිරීම.

අනු අංකය	ආදායම් උපයාගත් ආකාරය	මුදල (ලං.රු.මි)
01	කුලී පදනම මත ගුවන් යානා ලබා දීම මඟින් ලබා ගත් ආදායම	14.07
02	අභ්‍යන්තර ගුවන් ගමන් ටිකට්පත් අලෙවි ආදායම	0.53

වගුව - 5



රූප සටහන- 3

(7) 2022 අගෝස්තු 26 වන දින කෙරවළපිටිය ප්‍රදේශයේ සිදු කරන ලද ගිනි නිවීමේ(Bambi) මෙහෙයුම.



ආ. ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය

(1) 2022 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට සාපේක්ෂව තත්‍ය කාර්ය සාධනය

යෝජිත ක්‍රියාකාරකම්	අයවැය ප්‍රතිපාදන (ලං.රු.මි)	මූල්‍ය කාර්ය සාධනය (ලං.රු.මි)	නිම කරන ලද භෞතික මට්ටම
ආරක්ෂක උපාංග සහ ගුවන් සුනඛයින් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීම	68.02	50.07	73.61%
ආරක්ෂක උපාංග/අශ්වයින් හා ගුවන් සුනඛයින් සඳහා අවශ්‍ය අයිතම	6.89	4.05	58.78%
වෙනත් සේවා (රක්ෂණ)	11.44	8.86	77.44%
ආරක්ෂක, බෝම්බ නිෂ්ක්‍රීය සහ පැරෂුට් උපකරණ නඩත්තුව	5.0	0.68	13.6%
සටන් උපකරණ අලුත්වැඩියා කිරීම	2.18	0.021	0.96%
ආරක්ෂක, බෝම්බ නිෂ්ක්‍රීය සහ පැරෂුට් උපකරණ, DART සහ RSF උපකරණ මිලදී ගැනීම	36.59	27.13	74.14%
ආපදා කළමනාකරණ උපකරණ මිලදී ගැනීම	18.71	14.96	79.95%

වගුව - 6

(2) ආපදා කළමනාකරණය සඳහා සහය.

(අ) මුලතිව් ආපදා කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානය මඟින් 2022 දී පවත්වන ලද ආපදා කළමනාකරණ පුහුණුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පුද්ගලයින් 200 දෙනෙක්, ශ්‍රී ලංකා යුධ හමුදාවේ පුද්ගලයින් 06දෙනෙක්, ශ්‍රී ලංකා නාවික හමුදාවේ පුද්ගලයින් 08 දෙනෙක් හා ශ්‍රී ලංකා පොලීසියේ පුද්ගලයින් 04 දෙනෙක් විසින් සාර්ථකව හදාරන ලදි.

(ආ) එම වර්ෂයේදීම පහත සඳහන් මෙහෙයුම් සිදු කරන ලදි.

i. 2022 ජනවාරි මස 30 දින අම්පාර උහන නගරයේ වෙළඳ සැලක ඇති වූ ගින්න නිවීමේ මෙහෙයුම.
ii. 2022 මාර්තු මස 05 දින මීරිගම හොරකැලේ රක්ෂිතයේ ඇති වූ ගින්න පාලනය කිරීම.

iii. 2022 මාර්තු මස 06 දින දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ ඇති වූ ගින්න පාලනය කිරීම.

iv. 2022 සැප්තැම්බර් මස 27 දින අතුරුගිරිය වල්ගම ප්‍රදේශයේ කුණු වලෙහි ඇති වූ ගින්න පාලනය නිවීමේ මෙහෙයුම.

v. 2022 සැප්තැම්බර් මස 27 දින මෝදර නිවාස පෙලේ ඇති වූ ගින්න නිවීමේ මෙහෙයුම.

vi. තවද, ශ්‍රී ලංකා ගුවන්හමුදාව විසින් කොළඹ හම්බන්තොට සහ පුත්තලම යන දිස්ත්‍රික් ආපදා කළමණාකරණ මධ්‍යස්ථාන 03ක් පවත්වාගෙන යන අතර හදිසි අවස්ථාවක දී සහය දීම සඳහා අමතර රාජකාරි 24/7ක් සඳහා යොදවා ඇත.

(3) ආරක්ෂක හමුදාවල ශක්තීන් ජාතික සංවර්ධනයට දායක කර ගැනීම.

(අ) අනුරාධපුර කඳවුරේ අක්කර 05ක වී, කෙසෙල් සහ එළවළු වගාව සිදු කිරීම.

(ආ) පලාලි කඳවුරේ අක්කර 10ක අඹ, මිදි, කෙසෙල්, එළවළු සහ කෝමාරිකා වගාව සිදු කිරීම.

(ඇ) දියතලාව කඳවුරේ අක්කර 04ක එළවළු වගාව සිදු කිරීම.

(ඈ) මොරවැව කඳවුරේ අක්කර 148ක වී වගාව සිදු කිරීම.

(ඉ) පාලවී කඳවුරේ අක්කර 07ක අන්නාසි සහ එළවළු සහ කෝමාරිකා වගාව සිදු කිරීම.

(ඊ) අම්පාර කඳවුරේ අක්කර 06ක වී, එළවළු වගාව සිදු කිරීම.

(උ) සීගිරිය කඳවුරේ අක්කර 08ක වී,කෙසෙල් සහ එළවළු වගාව සිදු කිරීම.

(4) 2022 වර්ෂය තුළ දී පහත සඳහන් ව්‍යාපෘති සිදු කරන ලදි.

(අ) අකුරෙගොඩ ව්‍යාපෘතිය.

(ආ) මහියංගනය ගඩෝල් ව්‍යාපෘතිය.

(ඇ) හරිත කෘෂි මෙහෙයුම් මධ්‍යස්ථානය.

(ඈ) නීලගිරි මහාසෑය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය.

(ඉ) සඳහිරු සෑය ව්‍යාපෘතිය.

ඇ. ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය

(1) ගුවන්යානා අමතර කොටස් මිලදී ගැනීම 2022 වර්ෂය තුළ ගුවන්යානා නඩත්තුව සඳහා ලං.රු.මි. 587.90ක මුදලක් වියදම් දරා ඇත. මෙයට ලං.රු.මි. 494.38ක ගුවන්යානා අමතර කොටස් සහ ගුවන්යානා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම් සහ ලං.රු.මි 93.52ක එන්ජින් සහ අවර පෙති, ගුවන්යානා මෙවලම් සහ පරීක්ෂණ උපකරණ මිලදී ගැනීම් ඇතුළත්ය.

(2) අලුත්වැඩියා කිරීම සහ පූර්ණ අලුත්වැඩියා කිරීම 2022 වර්ෂය තුළ ගුවන්යානා අලුත්වැඩියා කිරීම් හා සේවා කිරීම් සඳහා ලං.රු.මි 2,954.40ක මුළු මුදලක් වියදම් දරා ඇත. මෙයට ප්‍රධාන ගුවන්යානා සමූහය සම්පූර්ණ අලුත්වැඩියා කිරීම සඳහා ලං.රු.මි 907.22ක් සහ ගුවන්යානා මෙවලම් අලුත්වැඩියාව හා ක්‍රමාංකනය, කෆීර් ගුවන්යානා යාවත්කාලීන කිරීම හා නැවත සේවයට එක්කිරීම සඳහා වැය වූ මුදල ලං.රු.මි 2,047.18ක් ද වේ.

(3) අංක 01 පියාසර පුහුණු පක්ෂාංගය (FTW) ගුවන්යානා වැඩිදියුණු කිරීම සහ ගුවන් ගමන්වලට අදාළ ක්‍රියාකාරකම් - 2022 අංක 01 පියාසර පුහුණු පක්ෂාංගය සතුව PT-6 ගුවන්යානා 13ක්, Cessna-150 ගුවන්යානා 06ක්, K-8 ගුවන්යානා 07ක් ආදී ලෙස ගුවන්යානා 26ක් ඇති අතර මෙම පක්ෂාංගය මඟින් 2022 වර්ෂය තුළ විවිධ ගුවන්යානා සේවා කිරීම් සිදු කර ඇත. මෙම පක්ෂාංගය විසින් PT-6 ගුවන්යානාවල පැය 25 සේවා කිරීම් 09ක්, පැය 100 සේවා කිරීම් 01ක්, සහ පැය 400 සේවා කිරීම් 01ක් සහ විඛාදන පරීක්ෂණ 264ක් සිදු කර ඇත. තවද, Cessna-150 ගුවන්යානාවල පැය 50 සේවා කිරීම් 10ක්, පැය 100 සේවා කිරීම් 07ක්, පැය 200 සේවා කිරීම් 06ක් ද විඛාදන පරීක්ෂණ සේවා කිරීම් 144ක් සහ අතිරේකව ගුවන් යෝග්‍යතාවය සුදුසු බව පිළිබඳ පරීක්ෂණ සිදු කර ඇත. ඊට අමතරව, K-8 ගුවන්යානා පැය 50 සේවා කිරීම් 04ක්, පැය 125 සේවා කිරීම් 04ක්, පැය 150 සේවා කිරීම් 01ක්, පැය 250 සේවා කිරීම් 03ක් සහ විඛාදන පරීක්ෂණ සේවා කිරීම් 72ක්, සහ K-8 ගුවන්යානාවල ස්වාභාවික ගුවන් ගමන් තට්ටු 15ක සේවා කිරීම් 36, ස්වාභාවික ගුවන් ගමන් තට්ටු 30ක සේවා කිරීම් 17ක්, ස්වාභාවික ගුවන් ගමන් තට්ටු 90ක සේවා කිරීම් 05ක් සිදුකර ඇති අතර ප්‍රමාණාත්මක මූල්‍ය වටිනාකමින් යුතු අළුත්වැඩියා වියදම් පහතින් දක්වා ඇත.

මාසය	ක්‍රියාකාරකම්	මූල්‍ය වටිනාකම
මාර්තු	Qty-08 HUOSAI-6A 2022 මාර්තු 11 දින එන්ජින් යවන ලදි. (අළුත්වැඩියා සහ පූර්ණ අළුත්වැඩියාව සඳහා)	USD 87,000.00 x 08

වගුව - 7

(4) අංක 02 බලසෙනඟේ ගුවන්යානා සහ ගුවන් ගමන් සම්බන්ධ ක්‍රියාකාරකම් වල වර්ධනය AN-32B ගුවන් යානා 04ක් සහ C-130 ගුවන්යානා 02ක් ඇතුළුව අංක 02 බලසෙනඟය සතුව ගුවන් යානා 06ක් ඇති අතර මෙම බලසෙනඟය විසින් 2022 වර්ෂය තුළ විවිධ අයුරින් සේවා කිරීම් සිදු කර ඇත. එමෙන්ම මෙම බලසෙනඟය විසින් AN-32B ගුවන්යානා වල පැය 600 සේවා කිරීම් 03ක් සහ පැය 900 සේවා කිරීම් 03ක් සිදු කර ඇත.

(අ) AN-32B ගුවන් යානා බලඇණියේ පැය 600 සේවා කිරීම (SCM 860, SCM 863 සහ SCM 869 Aircraft).



(ආ) AN-32B ගුවන් යානා බලඇණියේ පැය 900 සේවා කිරීම (SCM 860, SCM-863, SCM-869).



(ඇ) AN-32B ගුවන් යානා වෙනස් කිරීම හා TCAS සවි කිරීම.



(5) <u>අංක 03 සමුද්‍රීය බලඝණයේ ගුවන්යානා සහ ගුවන් ගමන් සම්බන්ධ ව්‍යාපෘති/ ක්‍රියාකාරකම්වල වර්ධනය</u> B-200 ගුවන් යානා 01ක්, Y-12 II ගුවන් යානා 01ක් සහ Dornier-228 ගුවන් යානා 01ක් ඇතුළුව අංක 03 බලඝණය සතුව ගුවන් යානා 03ක් ඇති අතර මෙම බලඝණය විසින් 2022 වර්ෂය තුළ විවිධ අයුරින් සේවා කිරීම් සිදු කර ඇත. මෙම බලඝණය විසින් B-200 ගුවන්යානයේ දින 07ක සේවා කිරීම් 45ක් සහ විබාදන පාලන 09ක් සිදු කර ඇත. තව ද Dornier-228 ගුවන්යානයේ දින 07ක සේවා කිරීම් 15ක්, දින 14ක සේවා කිරීම් 08ක්, මාසික AHCP දින 30ක සේවා කිරීම් 03ක්, මාසික AR සේවා කිරීම් 03ක්, ද්වී මාසික සේවා කිරීම් 02ක් සහ ත්‍රෛමාසික සේවා කිරීම් 01ක් සිදු කර ඇත. ඊට අමතරව, B-200 ගුවන්යානයේ ආස්තරණය නිරීක්ෂණය කිරීමෙන් පසු දෙපසම සුළං ආවරණ නැවත සවි කිරීමේ ප්‍රධාන අළුත්වැඩියාවක් සිදු කර ඇත.

(අ) ආස්තරණය නිරීක්ෂණය කිරීමෙන් පසු දෙපසම සුළං ආවරණ නැවත සවිකිරීම.



(6) <u>අංක 04 විශේෂ/ ප්‍රභූ පුද්ගල හෙලිකොප්ටර් බලඝණය ශ්‍රීලංගුහ රත්මලාන</u>

අංක 04 විශේෂ/ ප්‍රභූ පුද්ගල හෙලිකොප්ටර් බලඝණය සතුව BELL 412 ගුවන් යානා 04ක් , Bell 412 EP ගුවන් යානා 04ක් සහ BELL 212 ගුවන් යානා 01ක් ඇතුළුව ගුවන් යානා 09ක් ඇති අතර මෙම බලඝණය විසින් 2022 වර්ෂය තුළ විවිධ අයුරින් සේවා කිරීම් සිදු කර ඇත. මෙම බලඝණය මඟින් පැය 25ක සේවා කිරීම් 52ක්, පැය 50ක සේවා කිරීම් 19ක්, පැය 100ක සේවා කිරීම් 05ක්, පැය 300 සේවා කිරීම් 01ක් පැය 600ක සේවා කිරීම් 04ක්, Bell 412 සහ Bell 412 EP හෙලිකොප්ටර් යානා වල මාස 03 මලබැඳීම් පාලනය සිදු කර ඇත. වැඩිදුරටත්, Bell 412 සහ Bell 412 EP හෙලිකොප්ටර් යානා වල ප්‍රධාන Rotor blades 05ක්, AFCU 04ක්, TCU 02ක්, ඉන්ධන පම්ප් 02ක්, PTG 04ක් Tail rotor actuator 03ක් oil to fuel heater 03ක්, MFCU 02ක්, engine 02ක්, ගිනි නිවීම් උපකරණ 04ක්, TX Assy 01ක්, 42˚ Gear box 01ක්, 90˚ Gear Box 03ක් යන කොටස් වෙනස් කිරීම මඟින් ප්‍රධාන උපාංග වෙනස්කම් සිදුකර ඇත.

(අ) SMH 4428 MI 171E හෙලිකොප්ටර් පූර්ණ අළුත්වැඩියාව සම්පූර්ණ කිරීම සහ සේවා කිරීම.



(ආ) පූර්ණ අළුත්වැඩියාව සඳහා යැවීමට SMH 4429 හෙලිකොප්ටර් නැවත ගොඩනැගීම හෝ ගොඩබිම් ධාවන තත්ත්වය.



(ඇ) SUH 529 සහ SUH 530 හෙලිකොප්ටර්වල දෙපසම කාර්ය මණ්ඩල ආසන සකස් කිරීම සිදුකර අවසන් කර ඇත.



(ඈ) හෙලිකොප්ටර්වල (SUH527, SUH528, SUH529 සහ SUH 530) විශේෂ පුද්ගලයින් සඳහා වන පඩිපෙළෙහි නොලිස්සන ද්‍රව්‍ය යොදා සකස් කිරීම.



(ඉ) ගුවන් යානා ලිහිල් ආවරණ, එන්ජින් ඉන්ටේක් ආවරණ, එන්ජින් පිටාර ආවරණ සහ පඩි ආවරණ සැකසීම.



(7) <u>අංක 05 ප්‍රහාරක බලඝණයේ ගුවන්යානා සහ ගුවන් ගමන් සම්බන්ධ ක්‍රියාකාරකම්වල වර්ධනය</u> අංක 05 ප්‍රහාරක බලඝණය සතුව, FT-7BS ගුවන් යානා 01ක් F-7 BS ගුවන් යානා 03ක් සහ F-7GS ගුවන් යානා 04ක් ඇතුළුව ගුවන් යානා 08ක් ඇති අතර මෙම බලඝණය මඟින් 2022 වර්ෂය තුළ විවිධ අයුරින් සේවා කිරීම් සිදු කර ඇත. මෙම බලඝණය මඟින් FT-7BS, F7-BS සහ F-7GS ගුවන් යානා වල පැය 25ක එන්ජින් සේවා කිරීම් 05ක්, පැය 50ක එන්ජින් සේවා කිරීම් 02ක්, පැය 50ක ගුවන්යානා සැකිල්ල/ E&I/ රේඩියෝ සේවා කිරීම් 01ක් සහ පැය 100ක ගුවන්යානා සැකිල්ල/ E&I/ රේඩියෝ සහ ARM සේවා කිරීම් 01ක්, පැය 200ක ගුවන්යානා සැකිල්ල/ E&I/ රේඩියෝ සහ ARM සේවා කිරීම් 01ක්, පැය 300ක ගුවන්යානා සැකිල්ල/ E&I/ රේඩියෝ සහ ARM සේවා කිරීම් 01ක්, පැය 400 ගුවන්යානා සැකිල්ල/ E&I/ රේඩියෝ සහ ARM සේවා කිරීම් 01ක්, දින 07ක් නවතා තැබීමෙන් පසු සිදු කරන සේවා කිරීම් 29ක්, දින 10ක් නවතා තැබීමෙන් පසු සිදු කරන සේවා කිරීම් 22ක්, දින 30ක් නවතා තැබීමෙන් පසු සිදු කරන සේවා කිරීම් 11ක්, මාස 6ක සේවා කිරීම් 03ක්, මලබැඳීම පාලනය කිරීමේ සේවාවන් 49ක්, මාස 03 ARM සේවා කිරීම් 08ක්, මාස 03 රේඩියෝ සේවා කිරීම් 07ක්, දින 30 ARM සේවා කිරීම් 24ක්, ද්වී වාර්ෂික ejection seat සේවා කිරීම් සිදු කර ඇත.

(අ) ඉංජිනේරු නිලධාරීන් 03 දෙනෙකු විසින් භූමි ධාවන නිපුණතාවය සාර්තකව නිම කරන ලදී.



(ආ) යුධ ගුවන්යානා ද්වී වාර්ෂික සේවා කිරීම සහ ගුවන්යානා සැකිල්ල පැය 300 සේවා කිරීම.



(8) <u>ගුවන් යානා සහ ගුවන් සේවා සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා අංක 06 බලසෘණ සංවර්ධනය කිරීම</u> අංක 06 බලසෘණය සතුව MI-171 ගුවන් යානා 02ක්, MI-171SH ගුවන් යානා 02ක් සහ MI-171E ගුවන් යානා 01ක් ඇතුළුව ගුවන් යානා 05ක් ඇති අතර මෙම බලසෘණය මඟින් 2022 වර්ෂය තුළ විවිධ අයුරින් සේවා කිරීම් සිදු කර ඇත. MI-17 හෙලිකොප්ටර් යානා සඳහා පැය 25ක පරීක්ෂාවන් 13ක්, පැය 25ක ලිහිසි කිරීම් 06ක්, පැය 50ක පරීක්ෂාවන් 03ක්, පැය 50ක සේවා සැපයීම් 05ක්, පැය 100ක සේවා සැපයීම් 04ක්, පැය 200ක සේවා සැපයීම් 01ක්, පැය 300ක සේවා සැපයීම් 01ක්, දින 30ක ගබඩා සේවා 29ක්, මාස 03ක ගබඩා සේවා 08ක්, මාස 06ක ගබඩා සේවා 07ක් සිදු කර ඇත.

(අ) 2022 ජනවාරි මස SMH-599 හෙලිකොප්ටර් පියාසර අවශ්‍යතා සඳහා යොදා ගන්නා ලදී.



(ආ) උපාංග වෙනස් කිරීම මඟින් 2022 පෙබරවාරි මස SMH-4426 හෙලිකොප්ටර් ප්‍රභූ පුද්ගල අවශ්‍යතා සඳහා යොදා ගැනීමට නැවත සකස් කරන ලදී.



(ඇ) 2022 අප්‍රේල් මස MINUSCA වෙත යැවීමට පෙර SMH-4418 MI-171SH හෙලිකොප්ටරය කොටස්වලට වෙන් කරන ලදී.



(ඈ) එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් වලින් පසු ශ්‍රීලංගුහ වෙත ආපසු පැමිණි විට SMH-581 සහ SMH-4415 හෙලිකොප්ටර් 2022 අප්‍රේල් මස නැවත සකස් කරන ලදී.



(ඉ) SLG-300 winch ගබඩා කිරීම සඳහා නව ආධාරකයක් නිපදවා එය 2022 ජූලි මස බිත්තියට සවි කරන ලදී.



(ඊ) 2022 මැයි මස SMH-589 හෙලිකොප්ටරයේ (පුහුණු ආධාරකයක ලෙස සකස් කරන ලද) Nose landing gear සඳහා නව ආධාරකයක් නිපදවීම.



(උ) TETTRA පාසැලේ පුහුණුව මෙන්ම MI-17 හෙලිකොප්ටර් කාර්මිකයින්ගේ කුසලතාව වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාව මත 2022 සැප්තැම්බර් මස SMH-589 හෙලිකොප්ටරයේ නැවත සකස් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරන ලදී.



(ඌ) SMH-599 සහ SMH-4426 හෙලිකොප්ටර් පූර්ව ලංසු පරීක්ෂණ ලේඛනය අනුව 2022 ඔක්තෝබර් මස නැවත සකස් කරන ලදී.



(9) <u>අංක 07 බලඝණය - ගුවන් යානා සහ ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා සංවර්ධනය</u> අංක 07 බලඝණය සතුව Bell 206 ගුවන් යානා 03ක්, Bell 212 ගුවන් යානා 07ක් ඇතුළුව ගුවන් යානා 10ක් ඇති අතර මෙම බලඝණය මඟින් 2022 වර්ෂය තුළ විවිධ අයුරින් සේවා කිරීම් සිදු කර ඇත. මෙම බලඝණය මඟින් Bell 206 සහ Bell 212 හෙලිකොප්ටර්වල මාස 03 විබාදන නිෂේධක 19ක්, පැය 100 විබාදන සේවා, පැය 25 සේවා සැපයුම් 39ක්, පැය 50 සේවා සැපයුම් 19ක්, පැය 100 සේවා සැපයුම් 08ක්, පැය 600 සේවා සැපයුම් 02ක්, පැය 1000 සේවා සැපයුම් 01ක්, පැය 1200 සේවා සැපයුම් 01ක් සිදු කර ඇත. ඊට අමතරව, ගුවන් යානා රාමුව සකස් කිරීම, ASB 206-12-129 සැකසීම, දොර අළුත්වැඩියා කිරීම, windshield assy ප්‍රතිස්ථාපනය, සිරස් pin හි ව්‍යුහය අළුත්වැඩියා



කිරීම මඟින් Bell 206 සහ Bell 212 හෙලිකොප්ටර්වල ප්‍රධාන අළුත්වැඩියාවන් සිදු කරනු ලැබ ඇත.

(10) <u>අංක 8 බලඝණය - ගුවන් යානා සහ ගුවන් සේවා ආශ්‍රිත ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් සංවර්ධනය</u> අංක 08 බලඝණය සතුව Y-12II ගුවන්යානා 04ක්, Y-12IV ගුවන් යානා 02ක් සහ B-200 ගුවන් යානා 01ක් ඇතුළුව ගුවන් යානා 07ක් ඇති අතර මෙම බලඝණය මඟින් 2022 වර්ෂය තුළ විවිධ අයුරින් සේවා කිරීම් සිදු කර ඇත. මෙම බලඝණය මඟින් Y-12II සහ Y- 12IV ගුවන් යානාවල දින 07ක සේවා සැපයුම් 144ක්, පැය 100ක සේවා සැපයුම් 02ක්, පැය 200ක සේවා සැපයුම් 01ක්, පැය 800ක සේවා සැපයුම් 01ක්, විබාදන පාලන සේවා 37 ක් සහ B-200 Beech King ගුවන් යානාවේ දින 07ක සේවා සැපයුම් 48ක්, I සහ II අදියර පරීක්ෂණ 01ක්, විබාදන පාලන සේවා 04ක්, සිදු කර ඇත. ඊට අමතරව Y12-IV විශේෂ/ප්‍රභූ පුද්ගල ,ගුවන් යානාවේ සිරස් ස්ථායිකාරකයක් වෙතින් HF ඇන්ටනාව විසන්ධිවීම අළුත් වැඩියාවන් කිරීම, පුහුණු පියාසර අවස්ථාවක කුරුළු පහරදීමක් හේතුවෙන් හානි වූ B-200 Beechcraft ගුවන් යානාවේ STBD wing leading edge අළුත් වැඩියාව, Y-12 ගුවන් යානාවේ සිරස් ස්ථායිකාරක ආධාරකයේ පිපිරීම අළුත් වැඩියාව සිදු කර ඇත.

(අ) King Air B-200 (BB-1900) Beechcraft ගුවන් යානාවේ හානි වූ STBD Wing Leading Edge area හි ඡායාරූප.



(ආ) SCL-3124 ගුවන් යානාවේ සිරස් ස්ථායිකාරක ආධාරකයේ පිපිරීම.



(ඇ) SCL-3125 ගුවන් යානාවේ විබාදන අළුත්වැඩියාව.



(11) <u>ශ්‍රීලංගුහ හිඟුරක්ගොඩ මූලික කඳවුරේ අංක 09 ප්‍රහාරක හෙලිකොප්ටර් බලඝණය</u> අංක 09 ප්‍රහාරක හෙලිකොප්ටර් බලඝණය සතුව MI-24 ගුවන් යානා 03ක්, MI-35 ගුවන් යානා 03ක්, MI-171E ගුවන් යානා 01ක්, MI-171V ගුවන් යානා 01ක්, MI-171 ගුවන් යානා 01ක් ඇතුළුව ගුවන් යානා 09ක් ඇති අතර මෙම බලඝණය මඟින් 2022 වර්ෂය තුළ විවිධ අයුරින් සේවා කිරීම් සිදු කර ඇත. MI-171/171E/171V හෙලිකොප්ටර්වල පැය 25ක සේවා සැපයුම් 03ක්, පැය 50ක සේවා සැපයුම් 01ක්, ගබඩා සේවා 29ක් සහ MI-24 සහ MI-35 හෙලිකොප්ටර් යානා සඳහා දින 10ක සේවා සැපයුම් 192ක්, මාස 01ක සේවා සැපයුම් 64ක්, මාස 03ක සේවා සැපයුම් 16ක්, මාස 06ක සේවා සැපයුම් 8ක්, වාර්ෂික සේවා සැපයුම් 08ක් සිදු කර ඇත.

(12) <u>ශ්‍රීලංගුහ කටුනායක මූලික කඳවුරේ අංක 10 ප්‍රහාරක බලඝණය</u> අංක 10 ප්‍රහාරක බලඝණය සතුව Kfir TC2 ගුවන් යානා 02ක්, Kfir C2 ගුවන් යානා 03ක්, Kfir C7 ගුවන් යානා 01ක් ඇතුළුව ගුවන් යානා 06ක් ඇති අතර මෙම බලඝණය මඟින් 2022 වර්ෂය තුළ විවිධ අයුරින් සේවා කිරීම් සිදු කර ඇත. මුල් නිෂ්පාදකයා සී/ස IAI සමාගම සමග එක්ව කෆීර් යානා වැඩි දියුණු කිරීම සිදු කර ඇත.

(අ) ගුවන් යානා බඳ සහ පියාපත් මත විනාශකාරී නොවන පරීක්ෂණ සම්පූර්ණ කිරීම. (Eddy current, Ultrasound and liquid penetrant inspection).



(ආ) ව්‍යුහමය වැඩි දියුණු කිරීම ආරම්භ කිරීම.



(13) <u>අංක 111 UAV බලඝණය ගුවන් හමුදා මූලික කඳවුර වවුනියාව</u> අංක 111 UAV බලඝණය සතුව සෙවුම්කරු MK II ගුවන්යානා 01 හා ලිහිණියා MK I, ඇතුළුව UAVගුවන් යානා 02ක් ඇති අතර මෙම බලඝණය මඟින් 2022 වර්ෂය තුළ විවිධ අයුරින් සේවා කිරීම් සිදු කර ඇත. මෙම බලඝණය මඟින් MK II UAV යානාවේ සති 06 UAV සංරක්ෂණ 02, මාස 06 එන්ජිම සංරක්ෂණය කිරීම් 01 සිදු කර ඇත.

(14) <u>අංක 61 පියසැරිය රත්මලාන ගුවන් හමුදා මූලික කඳවුර - ගුවන් යානා සහ ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවර්ධනය</u> අංක 61 පියසැරිය සතුව MI-171E හෙලිකොප්ටර් 06ක්, MI-171 හෙලිකොප්ටර් 01ක්, MI-17V5 හෙලිකොප්ටර් 01ක් ඇතුළුව හෙලිකොප්ටර් 08ක් ඇති අතර මෙම පියසැරිය මඟින් 2022 වර්ෂය තුළ විවිධ අයුරින් සේවා කිරීම් සිදු කර ඇත. MI-17 හෙලිකොප්ටර්වල පැය 25ක පරීක්ෂණ 12ක්, පැය 50ක පරීක්ෂණ 05ක්, පැය 100ක සේවා කිරීම් 03ක්, පැය 300ක සේවා කිරීම් 01ක්, ගබඩා සේවා 36ක් සිදුකර ඇත.

ශ්‍රීලංගුහ කටුනායක මූලික කඳවුරේදී SMH-596, SMH-4419, SHM-4420 සහ SMH-4422 හෙලිකොප්ටර් ගොඩබිම් ධාවන තත්ත්වයට සකස් කරන ලදි.



(15) <u>මධ්‍යම අප්‍රිකාවේ එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා අංක 62 පියාසැරිය</u> එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා මධ්‍යම අප්‍රිකාවේ අංක 62 පියාසැරිය සතුව MI-17 V5 හෙලිකොප්ටර් 01ක්, MI-171 SH හෙලිකොප්ටර් 02ක් ඇතුළුව හෙලිකොප්ටර් 03ක් ඇති අතර මෙම පියසැරිය මඟින් 2022 වර්ෂය තුළ විවිධ අයුරින් සේවා කිරීම් සිදු කර ඇත. MI-17 හෙලිකොප්ටර් සඳහා පැය 25ක පරීක්ෂා 14ක්, පැය 50ක පරීක්ෂා 09ක්, පැය 25ක ලිහිසි කිරීම් 19ක්, පැය 50ක සේවා කිරීම් 08ක්, පැය 100ක සේවා කිරීම් 06ක්, පැය 200ක සේවා කිරීම් 01ක්, පැය 300ක සේවා කිරීම් 06ක් සහ පැය 500ක සේවා කිරීම් 02 සිදු කර ඇත.

(අ) MI-171SH හෙලිකොප්ටර් 02ක් MINUSCA හි සේවයේ යෙදවීම.



(ආ) 08 වැනි හට කණ්ඩායම MINUSCA හි සේවයේ යෙදවීම.



(16) <u>හෙලිටුවර්ස් ශ්‍රීලංගුහ මූලික කඳවුර රත්මලාන</u> හෙලිටුවර්ස් ශ්‍රීලංගුහ රත්මලාන කඳවුර සතුව MA-60 ගුවන් යානා 02ක් ඇති අතර 2022 වර්ෂය තුළ විවිධ අයුරින් සේවා කිරීම් සිදු කර ඇත. සති 01ක සේවා කිරීම් 12ක්, මාස 03ක සේවා කිරීම් 02ක්, මාස 06ක සේවා කිරීම් 01ක්, පැය 1000ක සේවා කිරීම් 01ක්, සතිපතා සේවා කිරීම් 06ක් (පූර්ව පියාසර අවස්ථාව), සති 02ක සේවා 01ක්, (පූර්ව පියාසර අවස්ථාව), මාස 03ක සේවා 01ක් (පූර්ව පියාසර අවස්ථාව), සතිපතා ආවර්තිත ගබඩා සේවා 83ක්, විඛාදන පරීක්ෂණ 17ක්, සති 02ක ගබඩා සේවා 42 ක්, මාස්පතා ආවර්තිත සේවා 18ක්, අවු.02 ආවර්තිත සේවා 02ක් මාස 03ක ආවර්තිත සේවා 02ක්, මාස 06ක අඛණ්ඩ ආවර්තිත සේවා 01ක් සිදු කර ඇත.

(17) <u>ගුවන් යානා ඉංජිනේරු පක්ෂාංගය (AEW) - ගුවන් යානා සහ ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සංවර්ධනය</u>.

2022 වර්ෂය තුළ AEW මඟින් පහත සඳහන් නඩත්තු කටයුතු සිදු කර ඇත.

(අ) <u>විශේෂ ව්‍යාපෘතිය</u>. Bell 412 හා Bell 212 හෙලිකොප්ටර් 02 පැය 1000/ අවුරුදු 5 සේවා කිරීම් පක්ෂාංගය විසින් සම්පූර්ණ කර ඇති අතර Bell 212 හෙලිකොප්ටර් 04 ක පැය 1000/ අවුරුදු 5 සේවා කිරීම් සිදු කරමින් පවතී.

(ආ) <u>ස්ටැන්ඩර්ඩ් රූම්</u>. පක්ෂාංගය විසින් සියලුම ගුවන් යානා සම්බන්ධයෙන් බල ක්‍රමාංකනය 344කි. මිනුම් ක්‍රමාංකන 212ක්, ස්ටැන්ඩර්ඩ් torque wrench calibration 221 සහ fresher gauge calibration 615 කි.

(ඇ) <u>විනාශකාරී නොවන පරීක්ෂණ විද්‍යාගාර</u>. පක්ෂාංගය මඟින් සියලුම ගුවන් යානා සම්බන්ධයෙන් එඩී ධාරා පරීක්ෂණ 56ක්, චුම්බක අංශු පරීක්ෂණය 581ක්, අල්ට්‍රා සොනික් පරීක්ෂණ 12ක්, ද්‍රව විනිවිද යාමේ පරීක්ෂණ 252ක්, දෘශ්‍ය පරීක්ෂණය 02ක් සහ එක්ස් කිරණ පරීක්ෂණ 81ක් සිදුකර ඇත.

(ඈ) <u>විද්‍යුත් අංගනය</u>. පක්ෂාංගය මඟින් සියලුම ගුවන් යානාවල විදුලි උපාංගවලට අදාළව ගිනි නියාමන ඒකක 01ක්, anti-coalition light 01 ඉන්ධන බූස්ටර් පම්ප් 02ක්, vent blower 02 AN 32B ගුවන් යානයේ A/C ගොඩබෑම් ලයිට්, විදුලි ජනක පාලන පැනල 01ක්, landing & taxi light 02, විදුලි ජනක පාලන පැනල 01ක්, ගොඩබෑම් ලයිට් 01ක්, pre-installation tester 02ක්, vent blower motor 02ක්, RYS-7 fuel accessory 01ක් සහ බැටරි විශ්ලේෂක 01 අළුත්වැඩියා කිරීම සිදු කරනු ලැබ ඇත.

(ඉ) ආරක්ෂක උපකරණ අංගනය. පක්ෂාංගය මඟින් සියලුම ගුවන් යානාවල ආරක්ෂිත උපකරණ අංගනය මඟින් ජීවිතාරක්ෂක කබා 456ක්, මගී ජීවිතාරක්ෂක කබා 1,453ක්, බහු ආසන ජීවිතාරක්ෂක යානා 32ක්, පැරෂුට් 27ක්, WD-3 කුඩා පැරෂුට 02ක්, පුද්ගල දිවි ගලවා ගැනීමේ ඇසුරුම් 08ක්, AC Fire බෝතල් 05ක්, G Suit 61ක්, ආරක්ෂිත පටි 07ක් සේවා කර ඇත.

(ඊ) ගුවන් යානා අලුත්වැඩියා සහ මුක්තාවශේෂ අංශය.
පක්ෂාංගය මඟින් Bell-212, Bell-412, AN-32B, Y-12, MI-17, C-130, Cessna-150, B 200, Bell 206 සහ MA-60. ගුවන් යානාවල ව්‍යුහාත්මක අළුත්වැඩියා කිරීම් 98ක් සිදු කරනු ලැබ ඇත.

(උ) එන්ජින් අංගනය පක්ෂාංගය තුළ Bell 212/ 412 ගුවන් යානා සඳහා PT6-3B එන්ජින් 21ක්, Y-12 ගුවන් යානා සඳහා PT6A-27 එන්ජින් 03ක්, ලිහිසි තෙල් විශ්ලේශණ 09ක් සහ වෙනත් අළුත්වැඩියා කිරීම් 08ක් සිදු කරනු ලැබ ඇත.

(ඌ) සංරචක, රෝද සහ තිරිංග අංගනය පක්ෂාංගය මඟින් Bell 412/ 212 ගුවන් යානාවල අළුත්වැඩියා කිරීම් 37ක් සහ AN32 සහ F-7 ගුවන් යානාවල ප්‍රධාන රෝදයේ පිටත ආවරණයේ අළුත්වැඩියා කිරීම් 12ක් සිදු කරනු ලැබ ඇත.

(එ) උපකරණ අංගනය පක්ෂාංගය මඟින් Bell 412/ 212/ 206, Y-12, AN-32, PT-6 ගුවන් යානා අළුත්වැඩියා කිරීම් 103ක් සහ, සියලුම ගුවන් යානාවල බර හා සමතුළිතතාවය පිළිබඳ අළුත්වැඩියා කිරීම් 36ක් සිදු කරනු ලැබ ඇත.

(ඒ) Rotor Bay. පක්ෂාංගය මඟින් Bell 412/ 212/ 206 සහ සියලුම ගුවන් යානාවල main/ tail rotor blades වල අළුත්වැඩියා කිරීම් 10ක් සිදු කරනු ලැබ ඇත.

(ඔ) සංයුක්ත අංගනය පක්ෂාංගය මඟින් සියලුම ගුවන් යානාවල සංයුක්ත පැනල 26ක අළුත්වැඩියා කිරීම් සිදු කරනු ලැබ ඇත.

i. වීඩියෝ විෂය පථය වැඩි දියුණු කිරීමේ කට්ටලය.



ii. නිපදවන ලද යුනිවර්සල් එන්ජින්.



(18) ASW - ගුවන් යානා සහ ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සංවර්ධනය.

2022 වර්ෂය තුළ දී ASW පක්ෂාංගය මඟින් පහත සඳහන් නඩත්තු කටයුතු සිදු කර ඇත.

(අ) Component shop Y-12II/IV, B-200, AN-32B, K-8, B-200, PT-06 සහ C-150 ගුවන් යානා 24 අලුත්වැඩියා කිරීම/ සේවා කිරීම/ පරීක්ෂා කිරීම/ පූර්ණ අලුත්වැඩියා කිරීම පක්ෂාංගය මඟින් සිදු කර ඇත.

(ආ) Electrical & Instrument Shop PT-06, C-150, Bell-206, PT-03, K-8, Y-12, B-200, MI-17, Bell212/ 412 සහ Mi17 ගුවන් යානා අලුත්වැඩියා කිරීම සහ පූර්ණ අලුත්වැඩියාවන් 52 ක් පක්ෂාංගය මඟින් සිදු කර ඇත.

අනු/ අංකය	විස්තරය	සේවා වර්ගය	ගුවන් යානා වර්ගය	කාර්යයන් ගණන	දළ පිරිවැය ඉතිරිය (ලං.රු)
01	ගුවන් දත්ත පරිගණක	ශක්‍යතා අධ්‍යයන	K-08	01	600,000.00
02	ස්ථිතික ඉන්වටර්			04	14,000,000.00
03	ITT දර්ශකය			02	2,800,000.00
04	දුම් අනාවරකය		Bell-412/ 212	01	350,000.00
05	Mast TQ signal conditioner			01	7,000,000.00
06	Blower යන්ත්‍ර			01	210,000.00
07	Hyd පීඩන මාපක		MI-17	02	280,000.00
08	එන්ජින් ඔයිල් P&T			02	1,155,000.00
09	ඉන්ධන පීඩන ස්විචය			06	2,520,000.00
10	Gear box oil උෂ්ණත්ව මාපකය			01	630,000.00
11	ත්‍රිලක්ෂ්‍ය දර්ශකය			02	700,000.00
12	පීඩන ප්‍රේරක පරිවර්තක			02	1,050,000.00
13	DPD එන්ජින් උණුසුම් වායු වැල්ව්			01	280,000.00
14	හදිසි අනතුරු ඇඟවීමේ සංඥ ඒකකය			01	350,000.00
15	Fuel Qty prop		Bell-206	01	700,000.00
16	ඉන්ධන වසා දැමීමේ වැල්ව්			01	525,000.00
17	උපකරණ එකතුව			01	1,750,000.00
18	ඉන්ධන පීඩන දර්ශකය			01	280,000.00

වගුව - 8

(19) AOW - ගුවන් යානා සහ ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සංවර්ධනය.

2022 වර්ෂය තුළ දී AOW පක්ෂාංගය මඟින් පහත සඳහන් නඩත්තු කටයුතු සිදු කර ඇත.

(අ) Mechanical repair workshop F-7/ K-8. පක්ෂාංගය මඟින් K-8/F, 7GS සහ F-7GS. ගුවන් යානා 29 ක අළුත්වැඩියා කිරීම සිදු කර ඇත.

(ආ) Small-parts repair workshop. පක්ෂාංගය මඟින් Y-12 ගුවන් යානාවල ඉන්ධන පුවරු 02ක් අළුත්වැඩියා කිරීම හා මතුපිට ප්‍රතිකාර සිදු කර ඇත.

(ඇ) Pipeline repair workshop F-7/ K-8. පක්ෂාංගය මඟින් F-7BS, F-7GS සහ Bell 206 ගුවන් යානා 03ක නල මාර්ග අළුත්වැඩියා කිරීම සිදු කර ඇත.

(ඈ) E&I Workshop Y-12/ PT-6. පක්ෂාංගය මඟින් Y-12 සහ PT-6 ගුවන් යානාවල අළුත්වැඩියා කිරීම් 17ක් සහ ක්‍රියාකාරී පරීක්ෂාව සිදු කර ඇත.

(ඉ) Wire Harness Repair Workshop F-7/ K-8. පක්ෂාංගය මඟින් F-7GS සහ K-8 ගුවන් යානා 27 ක අලුත්වැඩියා කිරීම සිදු කර ඇත.

(ඊ) ව්‍යුහාත්මක අලුත්වැඩියා Workshop. පක්ෂාංගය මඟින් Y-12 ගුවන් යානා 14 ක අළුත්වැඩියා කිරීම සිදු කර ඇත.

(උ) යාන්ත්‍රික අලුත්වැඩියා work shop Y-12/ PT-6. පක්ෂාංගය මඟින් Y-12 සහ PT-6 ගුවන් යානා 13 ක අළුත්වැඩියා කිරීම සිදු කර ඇත.

(ඌ) විශේෂ උපකරණ Workshop F-7/ K-8. පක්ෂාංගය මඟින් F-7GS සහ K-8 ගුවන් යානා 08 ක අළුත්වැඩියා කිරීම සිදු කර ඇත.

i. 2022 වර්ෂය තුළ දී ගුවන් යානා සහ ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සංවර්ධනය PT-6 ගුවන් යානය පූර්ණ අළුත්වැඩියාව.



ii. Y-12 ගුවන් යානය පූර්ණ අළුත්වැඩියාව.



iii. F-7 ගුවන් යානය පූර්ණ අළුත්වැඩියාව.



iv. K-8 ගුවන් යානය පූර්ණ අළුත්වැඩියාව.



(20) UAV කටුකුරුන්ද පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - ගුවන් යානා සහ ගුවන් ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවර්ධනය

කටුකුරුන්ද පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සතුව සෙවුම්කරු MK II Half Scale සහ ලිහිණියා MK I ඇතුළු නියමුවන් රහිත ගුවන් යානා (UAV) 02 ක් ඇති අතර 2022 වර්ෂය තුළ දී මධ්‍යස්ථානය මඟින් නියමුවන් රහිත ගුවන් යානා (UAV) පැය 10ක සේවා කිරීම් 02 ක් සිදු කර ඇත.

(අ) පියාසර පැතිකඩ සංදර්ශකය සහ පටිගතකිරීම් පද්ධතිය.



(ආ) ආරක්ෂාව සඳහා අතින් දියත් කරන UAV.



(ඇ) දුරස්ථ වෙඩි තැබීම් යාන්ත්‍රණය.



(ඈ) ආපදා සහන යාන්ත්‍රණය.



(ඉ) ‘SOLIDWORKS’මෘදුකාංග පුහුණු වැඩසටහන.



(21) වෘත්තිය පුහුණු පාසල - පුහුණු වීම් හා ගුවන් සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල සංවර්ධනය.

ගුවන් එන්ජින් වෘත්තියෙහි උසස් සහ මූලික අභ්‍යාසලාභීන්ගේ නිපුණතා සහ ප්‍රායෝගික දැනුම වැඩි දියුණු කරමින් ශ්‍රීලංගුහ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා වෘත්තීය පුහුණු පාසල වැඩි දියුණු සහ ප්‍රතිසංස්කරණය කර ඇත. ගුවන් යානා එන්ජින් සහ සම්බන්ධිත පද්ධතිවල මෙහෙයුම් නඩත්තුවට පසුකම් සැලසීම සඳහා නව ප්‍රායෝගික අංගනයක් ස්ථාපිත කර ඇත. වැඩිදුරටත් සම්පූර්ණ උපාංග සහිත ප්‍රායෝගික අංගනය මඟින් බොහෝ ප්‍රායෝගික සැසි පුහුණුව ඇතුළත පැවැත්වීමට හැකිවීම මඟින් ගුවන් එන්ජින් පුහුණු කාල සීමාව අඩු කිරීමට උපකාරී වේ.



ඈ. සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය

(1) සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය විසින් සිය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ කටයුතු සඳහා 2022 වසර ආරම්භයේදී රුපියල් මිලියන 1,438.23 ක මුදලක් ප්‍රක්ෂේපණය කර ඇත. මෙම ප්‍රතිපාදන අතරින්, ද්‍රවශීලතාව අනුව අධ්‍යක්ෂකය විසින් 2022 වර්ෂය තුළ එහි අත්‍යවශ්‍ය කාර්යයන් ඉටු කර ඇත.

(2) 2022 වසරේ සාමාන්‍ය ඉංජිනේරු ක්‍රියාකාරකම් සඳහා වූ වියදම්

2022 වර්ෂය තුළ සාමාන්‍ය ඉංජිනේරු කටයුතු සඳහා වූ මුළු වියදම රුපියල් මිලියන 756.84කි. මෙයට ඇතුළත් වන්නේ,

(අ) වාහන අළුත්වැඩියාව සහ සේවා පිරිවැය රුපියල් මිලියන 238.45.
(ආ) පතොරම් මිල්දී ගැනීම සහ යුධෝපකරණ වියදම් සඳහා රුපියල් මිලියන 13.70.
(ඇ) යාන්ත්‍රික ප්‍රවාහනය සඳහා රුපියල් මිලියන 504.69.

(3) ගුවන් යානා පින්තාරු කිරීම

(අ) ගුවන් යානා අංක SMH 589 හි අලුත්වැඩියාව සහ සම්පූර්ණ පින්තාරුව සිදු කර ඇත.



(ආ) SMH-4418 සහ SMH-4417 හෙලිකොප්ටර් touch-up කර එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා යෙදවීමට පෙර සියළු UN සළකුණු යොදා ඇත.



(ඇ) SHT 556 Bell 206 Jet Ranger හෙලිකොප්ටරයේ පූර්ණ පින්තාරු කිරීම සිදු කර ඇත.



(ඈ) SMR-858/ SCL-859 ගුවන් යානා ප්‍රයිමර් තීන්ත කිරීම සහ සම්පූර්ණ පින්තාරුව සිදු කර ඇත.



(4) ගුවන් යානා ගොඩබිම් සහායක උපකරණ අලුත්වැඩියාව.

(අ) PCB අලුත්වැඩියාව ඇතුළුව භූමි උපකරණ (GPU) වල ප්‍රධාන අළුත්වැඩියාව.



(5) වාහනවල ප්‍රධාන අළුත්වැඩියාව.

(අ) (ලීටර් 6,000) - ටාටා 1212C ජල බවුසරය අළුත්වැඩියාව.



(ආ) Asia Wing යතුරු පැදි එන්ජිම පූර්ණ අළුත්වැඩියාව ටින්කරින් කිරීම සහ පූර්ණ පින්තාරු කිරීම සිදු කර ඇත.



(ඇ) G-5621 & G-5606 Hero Hunk යතුරු පැදි 02 ක් ප්‍රභූ රාජකාරි සඳහා නවීකරණය කිරීම.



(ඈ) APC වැසි භාවිත කර APC ජල බවුසරයක් ලෙස නවීකරණය කිරීම.



(ඉ) G-3657 බස් රථය අළුත්වැඩියාව.



(ඊ) G-6403 Bolero Turbo S/Cab රථය ටින්කරින් හා පින්තාරු කිරීම.



(උ) G-3337 Isuzu D/Cab රථය පූර්ණ අළුත්වැඩියාව.



(6) සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය හා සම්බන්ධ ප්‍රධාන ව්‍යාපෘති.

(අ) විශාල බහාලුම් නිෂ්පාදනය කිරීම (Ea 700).



(ආ) වාහන ආවරණ නිෂ්පාදනය කිරීම.



(ඇ) Combat Harness (Ea 900) නිෂ්පාදනය කිරීම.



(ඈ) පොල් ලෙලි ගැසීමේ යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම.



(ඉ) සන්නද්ධ රථයක් නිෂ්පාදනය කිරීම.



(ඊ) කොහු මෙට්ට වියළීමේ යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම.



(උ) දූවිලි එකතු කිරීමේ යන්ත්‍රයක් නිෂ්පාදනය කිරීම.



(ඌ) අස්වනු ප්‍රවාහනය සඳහා ට්‍රැක්ටර් ට්‍රේලරය වෙනස් කිරීම.



(එ) ශ්‍රීලංගුහ බෝම්බ ගබඩාවන්හි පතොරම් ගබඩා කිරීම් සඳහා සුදුසු පෙට්ටි නිෂ්පාදනය කිරීම.



(ඒ) සුළං බලාගාරයක් සකස් කිරීම.



(ඔ) බැලස්ටික් හිස්වැසුම් අළුත්වැඩියාව.



(ඕ) ආපදා කළමනාකරණ ට්‍රැක්ටර් ට්‍රේලර් වෙනස්කොට සකස් කිරීම.



(7) ප්‍රාග්ධන උපකරණ මිලදී ගැනීම.

(අ) මහන යන්ත්‍ර 01 ක් මිලට ගැනීම.



(ආ) ඕවර් ලොක් යන්ත්‍ර 01 ක් මිලට ගැනීම.



(ඇ) වායු රෝධක පද්ධතියක් මිලට ගැනීම හා ස්ථාපිත කිරීම.



(8) යුධෝපකරණ මිලට ගැනීම.

(අ) එයාර් රයිෆල් 10,177 මිලට ගැනීම.



(ආ) මි.මී. 9 පතොරම් 1800, මිලට ගැනීම.



(ඇ) මීටර් 2,000 Det Cord එකක් මිලට ගැනීම.



(ඈ) Sky Diving 160ක් මිලට ගැනීම.



(9) වාහන මිලට ගැනීම.

(අ) ශ්‍රීලංගුහ සඳහා Forklift (Mitsubishi FD 15 05 Ton) මිලට ගැනීම.



(10) පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතිවල විස්තර.

(අ) අතේ ගෙන යා හැකි hydraulic test-rig platform එකක් නිෂ්පාදනය කිරීම.



(ආ) නියමුවන් රහිත ලිහිණියා ගුවන් යානා භාවිත කරමින් වෙඩි තැබීම සඳහා දුරස්ථ ප්‍රේරක යාන්ත්‍රණයක් හඳුන්වා දී ඇත.



(ඇ) ශ්‍රීලංගුහ බර වාහන/ විශේෂිත වාහන සඳහා වාහන ලුහු බැඳීමේ ක්‍රමයක් හඳුන්වා දී ඇත.



(ඈ) වෙඩි තැබීමේ දී කුඩා ආයුධවල පසු බැසීමේ බලයන් මැනීම සඳහා විශේෂ තුවක්කු ආධාරකයක් සැලසුම් කිරීම හා නිපදවීම.



(ඉ) 7.62 මි.මී. CH/ T56 ආයුධය ට ගැළපෙන හිස් ගිනි ඇමණුම් සකස් කිරීම.



(ඊ) විදුලි බලයෙන් ක්‍රියා කරන තණකොළ කැපීමේ යන්ත්‍රයක් සකස් කිරීම.



ඉ. විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂකය

(1) 2022 වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා කාර්ය සාධන ඇගයීම අනුව ලං.රු.මි 304.67 විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු උපකරණ මිලදී ගැනීම සඳහා වැය කර ඇත.

(2) 2022 වර්ෂය තුළ විද්‍යුත් හා විදුලි සංදේශ කටයුතු හා සම්බන්ධ ප්‍රධාන ව්‍යාපෘතිවල සංවර්ධනය සිදු කරන ලදී.

(අ) එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා විනාශ මොඩියුල මිල දී ගැනීම.



(ආ) රත්මලාන ශ්‍රීලංගුහ මූලික කඳවුරේ Helitours හි EFIS-85N පද්ධතිය ට හා SCM-3501 (4R-HTN) MA 60 ගුවන් යානයට අමතර කොටස් මිල දී ගැනීම.



(ඇ) UHF FM Base Station මිල දී ගැනීම.



(ඈ) ශ්‍රීලංගුහ පටිගත කිරීම් යන්ත්‍ර සඳහා PF SHT-8B/ PCI පටිගත කිරීම් කාඩ් මිල දී ගැනීම.



(ඉ) DHQC අකුරේගොඩ සඳහා S4 IP Controller (Park Air) මිල දී ගැනීම.



(ඊ) DHQC අකුරේගොඩ සඳහා RF කේබල් මිල දී ගැනීම.



(උ) ශ්‍රීලංගුහ ආයතනවල භාවිතය සඳහා බැටරි විශ්ලේෂක මිල දී ගැනීම.



(ඌ) Vector විශ්ලේෂක මිල දී ගැනීම.



(එ) අතේ ගෙන යාහැකි බැටරි මිල දී ගැනීම.



ඊ. සැපයුම් අධ්‍යක්ෂකය.

2022 වර්ෂය තුළ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම.

අනු/අංකය	විස්තරය	මුදල (ලං.රු.මි.)
01	බැරැක්ක උපකරණ මිලදී ගැනීම	38.27
02	ආහාර සැපයුම් උපකරණ මිලදී ගැනීම	29.88
03	වෙනත් භාණ්ඩ මිලදී ගැනීම	2.38

වගුව – 9

උ. පරිපාලන අධ්‍යක්ෂකය

2022 දී ශ්‍රීලංගුහ පරිපාලන අධ්‍යක්ෂකයේ තත්‍ය කාර්ය සාධනය පහත පරිදිය, සාමාන්‍ය පරිපාලනය සඳහා වෙන් කරන ලද මුළු මුදල ලං.රු.මි. 34,095.31.

අනු/අංකය	ක්‍රියාකාරකම	වෙන් කළ මුදල (ලංරුමි)
01	වැටුප් හා වේතන	15,706.73
02	වෙනත් දීමනා	15,139.33
03	දේශීය ගමන් වියදම්	20.63
04	තැපැල් ගාස්තු	2.14
05	විදුලිය හා ජලය	707.65
06	ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ ප්‍රවේශ පත්‍ර	22.26
07	දේපළ ණය පොළී	41.44
08	වන්දි/රක්ෂණ	18.22
09	රණවිරු මාපිය දීමනා	290.95
10	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	459.21
11	අවමංගල්‍ය සේවා/ නීති සේවා ගෙවීම්	1.79
12	කාර්යාල උපකරණ අලුත්වැඩියාව	0.45
13	සාමාන්‍ය කාර්යාල උපකරණ	1.75
14	ලිපි ද්‍රව්‍ය	10.76
15	වෙනත් සැපයුම්	0.23
16	දේශීය අධිකාරී සඳහා කුලී/ගාස්තු/කතෘභාග/බදු ගෙවීම	4.50
එකතුව		**32,428.04**

වගුව – 10

ඌ. සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂකය

(1) 2022 වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ තථ්‍ය කාර්ය සාධනය සංසන්දනය කිරීම පහත පරිදි වේ. පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා වියදම් වෙන් කිරීමට සාපේක්ෂව තථ්‍ය වියදම.

විස්තරය	ප්‍රතිපාදනය (ලං.රු.මි)	වියදම (ලං.රු.මි)
පුනරාවර්තන වියදම්	201.20	107.95
ප්‍රාග්ධන වියදම්	391.56	226.36
එකතුව	**592.76**	**334.31**

වගුව – 11

(2) 2022 වර්ෂය තුළ දී සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂකය මඟින් පහත සඳහන් ව්‍යාපෘති/ කාර්යයන් සිදු කර ඇත.

විස්තරය	නිම කරන ලද ව්‍යාපෘති	සිදු කරමින් පවතින ව්‍යාපෘති	තාවකාලිකව අත් හිටවන ලද ව්‍යාපෘති	කළ් දමන ලද ව්‍යාපෘති	එකතුව
2021 සිට කරගෙන එන ව්‍යාපෘති	10	-	03	01	14
2022 -නව ව්‍යාපෘති	-	02	-	25	27

වගුව – 12

(අ) අංක 02 ප්‍රවාහන මූලික බලඝනය සඳහා ගුවන්යානා අංගනය යාබද දෙමහල් ගොඩනැගිල්ල ඉදි කිරීම - අදියර II ඉතිරි වැඩ ශ්‍රීලංගුහ මූලික කඳවුර කටුනායක පිරිවැය ලං.රු.මි 10.50.



(ආ) ලං.රු.මි 15.95ක වියදමින් ශ්‍රීලංගුහ ඒකළ වෘත්තීය පුහුණු පාසැලේ නිලධාරීන් සඳහා නිවස්න සංකීර්ණය - අදියර II සාදා නිම කිරීම. (ඉතිරි වැඩ)



(ඇ) ලං.රු.මි 5.05 වියදමින් ශ්‍රීලංගුහ කටුකුරුන්ද කඳවරේ නිලධාරීන් සඳහා නිවස්න 02ක් සාදා නිම කිරීම (ඉතිරි වැඩ). කඳවුර තුළ වාසී ගුවන් භටයින් සඳහා නිවස්න සංකීර්ණ ඉදිකිරීම.



(ඈ) ලං.රු.මි 6.92 වියදමින් පිදුරුතලාගල ශ්‍රීලංගුහ කඳවුර මඟින් විශ්‍රාමික නිලධාරීන්ගේ නුවරඑළිය, නිවාඩු නිකේතනය ඉදිකර නිමකිරීම (ඉතිරි වැඩ).



(ඉ) ලං.රු.මි. 5.78 වියදමින් ශ්‍රීලංගුහ කොග්ගල කඳවුරේ විශ්‍රාමික නිලධාරීන්ගේ නිවාඩු නිකේතනය ඉදිකර නිමකිරීම. (ඉතිරි වැඩ)



(ඊ) ලං.රූ.මී. 7.85 වියදමින් ඒකළ වෘත්තීය පුහුණු පාසැල සඳහා දෙමහල් පන්තිකාමර ගොඩනැගිල්ල ඉදිකර නිමකිරීම. (ඉතිරි වැඩ)



(3) ග්‍රාමීය සංවර්ධනය සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග.

විස්තරය	නිම කරන ලද ව්‍යාපෘති	සිදු කරමින් පවතින ව්‍යාපෘති	එකතුව
2021 සිට කරගෙන එන ව්‍යාපෘති	08	-	08
2022 -නව ව්‍යාපෘති	06	03	09

වගුව – 13

(අ) නාගරික සංවර්ධන අධිකාරියේ සම්බන්ධීකරණය යටතේ බණ්ඩාරවෙල නගරයේ පදික වේදිකාව සංවර්ධනය කිරීමේ කටයුතු නිම කිරීම.



(ආ) ගම සමග පිළිසඳර වැඩසටහන යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් "මානා වැව" ප්‍රතිසංස්කරණය කර නිමවීම.



(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් ආනමඩුව මධ්‍ය මහා විද්‍යාලයේ ක්‍රීඩා පහසුකම් නගාසිටුවීම.



(4) ආගමික ස්ථාන ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය.

විස්තරය	නිම කරන ලද ව්‍යාපෘති	සිදු කරමින් පවතින ව්‍යාපෘති	එකතුව
2021 සිට කරගෙන එන ව්‍යාපෘති	02	03	05
2022 - නව ව්‍යාපෘති	06	05	11

වගුව – 14

(අ) ආරක්ෂක අමාත්‍යාංශයේ සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් ලාහුගල "නීලගිරි සෑය" ප්‍රතිසංස්කරණය කිරීම (සිදු කරමින් පවතින ව්‍යාපෘතිය).



(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකරණයෙන් 'දීඝවාපිය' විහාරස්ථානයේ ධාතු මන්දිරය ඉදිකිරීමේ කටයුතු සිදු කිරීම (සිදු කරමින් පවතින ව්‍යාපෘතිය).



(ඇ) ආරක්ෂක අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් "සඳහිරු සෑය සඳහා කෞතුකාගාරයක් ඉදි කිරීම (සිදු කරමින් පවතින ව්‍යාපෘතිය).



(5) වන අලි ගැටුමෙන් සිදුවන හානි අවම කිරීම සඳහා ගෙන ඇති පියවර.

කැබිතිගොල්ලෑව, කණුගහවැව අලිවැට ඉදිකිරීම හා ස්ථාපිත කිරීම සඳහා තාක්ෂණික සහාය සහ ශ්‍රම දායකත්වය සැපයීම.

එ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකය

(1) වර්ෂය තුළ පහත කාර්යයන් සාර්ථකව අවසන් කර ඇත.

අනු අංකය	කාර්යය	මුදල (ලං.රු.මි)
01	ඖෂධ සහ සැරහුම් අයිතම, එන්නත්, එක්ස්රේපට, රසායනාගාර රසායන ද්‍රව්‍ය සහ පරීක්ෂණ කට්ටල, පුද්ගල ආරක්ෂණ උපකරණ, ශල්‍ය උපකරණ, භෞතචිකිත්සක ප්‍රතිකාර සඳහා අවශ්‍ය ඉවතලන අයිතම, ඇස් කණ්නාඩි සඳහා කාච, රසායනාගාර පරීක්ෂණ සේවා සහ කෘමිනාශක මිලදී ගැනීම.	145.11
02	ශ්‍රීලංගුහ රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය ප්‍රාග්ධන වෛද්‍ය උපකරණ මිලදී ගැනීම.	83.52
03	ප්‍රාග්ධන වෛද්‍ය උපකරණ අලුත්වැඩියා කිරීම/ යාවත්කාලීන කිරීම, ප්‍රාග්ධන වෛද්‍ය උපකරණවල සේවා ගිවිසුම් පවත්වාගෙන යාම.	10.20
එකතුව		**238.83**

(2) අන්තරායකර මත්ද්‍රව්‍යවලින් තොර රටක් සඳහා ක්‍රියාකාරී උපායමාර්ග.

(අ) 2022 තුළ පරීක්ෂා කළ සංඛ්‍යාව. සේවා පුද්ගලයින් 1,450 දෙනෙකු මත්ද්‍රව්‍ය අනිසි භාවිතය පරීක්ෂා කර ඇත.

(ආ) ඒ සඳහා අයවැය වියදම්. රුපියල් මිලියනය 1.38 ආසන්න පිරිවැයක් මේ සඳහා වැය වේ.

(ඇ) මනෝවිද්‍යාඥයින් විසින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන. සේවා පුද්ගලයින් 1,200 දෙනෙකු දැනුවත් කිරීමේ වැඩසටහනට සහභාගී විය.

එ. පුහුණු අධ්‍යක්ෂකය.

(1) මානව සම්පත් සංවර්ධනය ඉහළ නැංවීම සහ සේවා පුද්ගලයින්ගේ ශක්‍යතා ගොඩනැංවීම අරමුණු කරගෙන 2022 වර්ෂය තුළ දේශීය හා විදේශීය පුහුණු සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පහත වියදම් දරා ඇත.

අනු අංකය	පුහුණු වර්ගය	තත්‍ය පිරිවැය (ලං.රු.මි)
01	විදේශීය පුහුණු	287.84
02	දේශීය පුහුණු	10.43
එකතුව		**298.27**

වගුව – 16



රූපසටහන - 4

ඔ. සුභසාධන අධ්‍යක්ෂකය.

(1) සුභසාධන අධ්‍යක්ෂකයේ 2022 වර්ෂය සඳහා කාර්යසාධනය පහත පරිදිය.

(අ) ශ්‍රීලංගුහ ආයතන සඳහා සුභසාධන පහසුකම් සැපයීම.

i. ශ්‍රීලංගුහ සේවා පුද්ගලයින්ගේ සහ සිවිල් සේවා පුද්ගලයින්ගේ පාසැල් යන දරුවන් සඳහා නොමිලේ පාසැල් පොත් 23,847 සැපයීම.

ii. ක්‍රියාන්විතයේදී මිය ගිය සේවා පුද්ගලයින් 341 ගේ පවුලේ සාමාජිකයින් සඳහා රු. 10,000.00 ත්‍යාග පාර්සල් ද රැගෙන ඔවුන් හමුවීමට යාම.

iii. ශ්‍රීලංගුහ දින පොත් සහ දින දර්ශන සියළුම සේවා පුද්ගලයින්, සිවිල් කාර්යමණ්ඩල, යුද්ධයෙන් මියගිය සහ ආබාධිත වූ සේවා පුද්ගලයින්ගේ ළඟම ඥාතීන් වෙත බෙදා හැරීම.

iv. 2022 අප්‍රේල් මාසයේදී ගුවන් හමුදා වාර්ෂික අවුරුදුපොළ සංවිධානය කිරීම.

v. මීගමුව කළාප අධ්‍යාපන කාර්යාලය හා ඒකාබද්ධව කටුනායක මූලික කඳවුරෙහි ඉදි කෙරෙන පාසැල් ගොඩනැගිල්ලෙහි පළමුවන හා දෙවන අදියර

vi. විශ්‍රාමික සේවා පුද්ගලයින් සඳහා රැකියා බැංකුවක් පවත්වාගෙන යාම.

vii. ආබාධිත වූ සේවා පුද්ගලයින් සඳහා පහත සඳහන් වෛද්‍යාධාර පරිත්‍යාග කරන ලදි.

(i)	කෘතිම ඇස්	- 01
(ii)	කෘතිමපාද	- 30
(iii)	රෝද පුටු	- 04
(iv)	කිහිලිකරු	- 02

viii. සේවා පුද්ගලයින්ගේ සමීප ඥාතීන්ට ස්ථාන මාරු ලබා ගැනීම සඳහා නිර්දේශ ලබාදීම.

ix. ආරක්ෂක අමාත්‍යාංශය හා ඒකාබද්ධව කොළඹ සහ කුරුණෑගල පිහිටි ආරක්ෂක සේවා විද්‍යාල සඳහා ළමුන් 92 ඇතුළත් කිරීම සම්බන්ධීකරණය කිරීම.

x. ශ්‍රීලංගුහ ආයතන වල සාමාන්‍ය ජනතාවට සුභසාධන පහසුකම් ඉහළ නැංවීම සඳහා සහය ලබාදීම.

xi. ඉල්ලීම් කරන ලද සේවා පුද්ගලයින්ට බාහිර රැකියා සඳහා අයදුම් කිරීමට සේවා සහතික නිකුත් කිරීම.

xii. ශ්‍රීලංගුහ සේවා පුද්ගලයින් 35 දෙනෙකුගේ නිවාස ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා ශ්‍රම දායකත්වය ලබාදීම.

xiii. රණවිරු සේවා අධිකාරිය හා ඒකාබද්ධව ශ්‍රීලංගුහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හා බලලත් නිලධාරීන් අතර විරුසර ප්‍රසාද දීමනා කාඩ් පත් 53ක් බෙදා හැරීම.

xiv. ශ්‍රීලංගුහ පෙර පාසැල් ගුරුවරියන් 59 දෙනෙක් සඳහා නොමිලේ සාරි ලබාදීම.

(ආ) සාමාන්‍ය ජනතාවට සුභසාධන පහසුකම් ලබාදීම.

i. මාර්තු මාසයේ දී ශ්‍රී පාදස්ථානය පිරිසිදු කිරීමේ වැඩ සටහනක් පවත්වන ලදි.

ii. ආරක්ෂක අමාත්‍යාංශය සහ ත්‍රිවිධ හමුදාව සම්බන්ධ කර ගනිමින් කුරගල රජමහා විහාරයේ සහ බෞද්ධාලෝක වෙසක් කළාපය සඳහා අවශ්‍ය සහය ලබා දෙන ලදී.

iii. ආරක්ෂක අමාත්‍යාංශය සහ අනෙකුත් සහෝදර සේවා සමග එක්ව බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති ජය පිරිත සජ්ඣායනා මහෝත්සවය පැවැත්වීම සඳහා සහය ලබා දෙන ලදී.

vi. ගංගාරාම විහාරස්ථානයේ මහා පෙරහැර සහ බෙල්ලන්විල රජමහා විහාරයේ මහා පෙරහැර පැවැත්වීම සඳහා පිළිවෙළින් සහය ලබා දෙන ලදී.

v. අම්පාර දීඝවාපිය චෛත්‍යයේ ධාතු තැන්පත් කිරීම සඳහා අවශ්‍ය සහය ලබා දෙන ලදී.

(ඇ) දිළිඳුකම තුරන් කිරීම සඳහා සුභ සාධන සහය ලබාදීම.

i. තෝරාගත් සේවා පුද්ගලයන්ට මූල්‍ය සහනයක් ලෙස ශ්‍රීලංගුහ දේපළ වලින් ඉඩම් කැබලි 26ක් බෙදාදීම.

ii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ඉඩම් බලපත්‍ර ලබා ගැනීම සඳහා නිර්දේශ ලබා දීම.

ඕ. ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය.

(1) 2022 වර්ෂය තුළ ගුවන් බුද්ධි අධ්‍යක්ෂකයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් පහත පරිදි වේ.

වැය ශීර්ෂ අංකය	ප්‍රධාන ක්‍රියාකාරකම	මුදල (ලං.රු.මි.)	වෙනත් කරුණු
ප්‍රාග්ධන වියදම්			
2002	පවතින විදුලි උපකරණ අලුත්වැඩියා කිරීම (ඩ්‍රෝන සහ කැමරා)	0.389	ඩ්‍රෝන් කැමරා 11ක් අලුත්වැඩියා කිරීම
පුනරාවර්තන වියදම්			
1205	විදුලි උපකරණ මිලදී ගැනීම	1.058	බුද්ධි රාජකාරි සඳහා ඉලෙක්ට්‍රොනික අයිතම සහ bugging devices මිලදී ගැනීම
1409	බුද්ධි දීමනාව (අග්‍රිමය)	3.576	බුද්ධි තොරතුරු රැස්කිරීම සඳහා
සමස්ත වියදම		**5.023**	

වගුව – 17

(2) බුද්ධි අංශ ශක්තිමත් කිරීම.

(අ) 2022 වර්ෂය තුළ ඩ්‍රෝන් මෙහෙයුම්කරු පාඨමාලාව සඳහා නිලධාරීන් 13 දෙනෙකු හා ගුවන් භටයින් 43දෙනෙකු පුහුණු කරන ලදී.
(ආ) 2022 වර්ෂය තුළ අනෙකුත් ශාඛාවල නිලධාරීන් 10 දෙනෙකුට සහ වෙනත් ආයතනවලින් ගුවන් භටයින් 39 දෙනෙකු සඳහා මූලික බුද්ධි පාඨමාලාවක් ලබා දෙන ලදී.

(ඇ) 2022 වර්ෂය තුළ ඩ්‍රෝන යානා 11ක් අලුත්වැඩියා කරන ලදී.
(ඈ) 2022 දී ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය සඳහා නිලධාරීන් 6ක් සහ ගුවන් භටයින් 100ක් බඳවා ගැනීම.

(3) රජය වෙනුවෙන් ඉටු කරන ලද විශේෂ සේවාවන් පිළිබඳ විස්තර.

මෙහෙයුමේ විස්තරය	පාර්ශවකරු	පියාසර පැය
බස්නාහිර පළාත් සභාව සඳහා ඩ්‍රෝන මෙහෙයුම් 55ක් පවත්වා ඇත.	බස්නාහිර පළාත් සභාව	පැය 46 මි.10

වගුව - 18

(4) ගෙවීම්වලට යටත්ව රජයට සපයන ලද විශේෂ සේවාවන් පිළිබඳ විස්තර.

මෙහෙයුමේ විස්තරය	පාර්ශවකරු	පියාසර පැය
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සඳහා ඩ්‍රෝන මෙහෙයුම් 04ක් සිදු කරන ලදි.	ටයිසෙයි සමාගම	පැය 35 මි. 10

වගුව - 19

ඔ෭. තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය.

(1) සමාලෝචන කාල සීමාව තුළ, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රක්ෂේපණය අනුව තොරතුරු තාක්ෂණ උපකරණ නඩත්තු කිරීම සහ තොරතුරු තාක්ෂණ උපකරණ මිලදී ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත ප්‍රධාන වියදම් දරා ඇත.

විස්තරය	මුදල (ලං.රු.මි.)
ප්‍රාග්ධන වියදම්	4.85
පුනරාවර්තන වියදම්	43.67
එකතුව	**48.52**

වගුව - 20

(2) 2022 වසරේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකයේ ව්‍යාපෘති විස්තර.

(අ) ගුවන් හමුදා සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානය පහත සඳහන් කාර්යයන් සිදු කරන ලදී.

i. ගුවන් හමුදා වෙබ් අඩවි තත්‍ය cloud වේදිකාවකට සංක්‍රමණය කිරීම ශ්‍රීලංකා ගුවන් හමුදාවට අයත් වෙබ් අඩවි 05ක් සංක්‍රමණය විය.

ii. සයිබර් තර්ජන අවම කිරීම වැඩි දියුණු කිරීම සඳහා කර්මාන්ත ප්‍රමිතීන් සමඟ cloud flare firewall ප්‍රශස්ත කිරීම සහ මනාව සුසර කිරීම.

iii. ජනාධිපති ලේකම් කාර්යාලයේ අවදානම් සහිත විද්‍යුත් තැපැල් සේවාදායකයක් පිළිබඳව එම පරිශ්‍රයට පැමිණි සයිබර් ආරක්ෂක නිලධාරීන් විසින් පරීක්ෂණයක් පැවැත්වීම. වැඩිදුර සයිබර් ප්‍රහාරවලින් විද්‍යුත් තැපැල් සේවාදායකය සුරක්ෂිත කිරීම සඳහා විමර්ශන වාර්තාව සහ නිසි නිර්දේශ භාරදෙන ලදී.

iv. ජනාධිපති ලේකම් කාර්යාලයේ විද්‍යුත් තැපැල් සේවාදායකයේ දෘඪාංග දෝෂයක් හඳුනාගෙන සයිබර් ආරක්ෂක නිලධාරීන්ගේ ස්ථානීය සංචාරයකින් පසුව එම දෝෂය නිවැරදි කරන ලදී.

v. DHQC අකුරේගොඩ සයිබර් මෙහෙයුම් මධ්‍යස්ථානයේ රූපවාහිනී අධීක්ෂණ පුවරුව සැකසීම.

vi. 24x7x365 ජනාධිපතිගේ වෙබ් අඩවිය සහ ආරක්ෂක අමාත්‍යාංශ වෙබ් අඩවිය ඇතුළු තීරණාත්මක රාජ්‍ය ආයතන වෙබ් අඩවි නිරීක්ෂණය කිරීම.



ක. නීති අධ්‍යක්ෂකය.

2022 වර්ෂය තුළ කාර්යසාධනය.

(අ) සාමාන්‍ය නෛතික කටයුතුවලට අමතරව, ගැටුම් සහ සාම කාලයන්හි දී ත්‍රිවිධ හමුදාවට සම්බන්ධ වීමේ නීතිරීති සකස් කිරීමේදී විධායක නීති දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළේය.

(ආ) ආරක්ෂක විද්‍යාල පනත් කෙටුම්පත, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යනාදී පවතින නීති සංශෝධන සඳහා ද විධායක නීති දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණ සපයන ලදී.

ඛ. මාධ්‍ය අධ්‍යක්ෂකය.

(1) 2022 වර්ෂය තුළ මුළු මාධ්‍ය ආවරණ ක්‍රියාකාරකම් සංඛ්‍යාව පහත පරිදි වේ.

(අ) පුවත්පත් ලිපි ගණන 2,875.
(ආ) වෙබ් පුවත් ගණන 498.
(ඇ) රූපවාහිනී පුවත් ගණන 1,406.
(ඈ) විශේෂ අවස්ථා සඳහා මාධ්‍ය ආරාධනා සංඛ්‍යාව 30.
(ඉ) ඡායාරූප සහ වීඩියෝ ආවරණ ගණන 189.
(ඊ) වයිබර් ගුවන් නිවුස් ඇලර්ට් ගණන 226.
(උ) සිදුවීම් මෙහෙයවීම් ගණන 61.
(ඌ) වීඩියෝ වාර්තා චිත්‍රපට ගණන 31.
(එ) ප්‍රවෘත්ති ක්ලිප් 82.

(2) මාධ්‍ය අධ්‍යක්ෂකය පුළුල් කිරීම.
වැඩ පරිසරයෙහි ඉතිරි අවශ්‍යතා 2022 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලදි.

(3) සියලුම තොරතුරු කළමනාකරණය සහ නිකුත් කිරීම.
2022 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අභ්‍යන්තර/ බාහිර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ගුවන් හමුදා වෙබ් අඩවිය ඇතුළුව ජන මාධ්‍ය තුළ ප්‍රවෘත්ති ලිපි 2,875ක් ප්‍රකාශයට පත් කර ඇත. මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් 2022 වසර තුළ සෘජුවම ප්‍රවෘත්ති ලිපි 123ක් පමණ බාහිර මාධ්‍ය ආයතන වෙත යවා ඇති අතර සියලුම ප්‍රාදේශීය පුවත්පත් ආයතන ඔවුන්ගේ ප්‍රකාශනවල ඒවා ප්‍රකාශයට පත් කර ඇත.

(4) ශ්‍රීලංගුහ ප්‍රතිරූපය ගොඩනැංවීමේ ක්‍රියාකාරකම්.

වෙළෙඳ දැන්වීම් ප්‍රචාරණය හැරුණු කොට පොදු මාධ්‍ය හරහා තම ප්‍රතිරූපය ගොඩනැංවීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කළ ක්‍රියාකාරකම් පහත පරිදි ය.

(අ) විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය හරහා මාධ්‍ය ප්‍රචාරණයක් ලබාගැනීම සඳහා ගුවන් හමුදා ආයතන තුළ පවත්වන ලද සමස්ත උත්සව 30ක් සඳහා සිවිල් මාධ්‍ය නිලධාරීන්ට ආරාධනා කරන ලදී.

(ආ) සියලුම මාධ්‍යවේදීන් නිසි ලෙස පිළිගෙන නිසි සැලකිල්ලෙන් සලකන ලදී.

(5) ගුවන් හමුදා වෙබ් අඩවිය කළමනාකරණය.

මාධ්‍ය අධ්‍යක්ෂකවරයා විසින් ගුවන් හමුදාපතිගේ සෘජු උපදෙස් ඇතිව වසර තුළ ගුවන් හමුදා වෙබ් අඩවියේ ගුවන් හමුදා පුවත් ලිපි 498ක් ප්‍රකාශයට පත්කරන ලදී.

(6) තොරතුරු බෙදාහැරීම.

විද්‍යුත් මාධ්‍ය භාවිත කරමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ/ රජයේ වැදගත් සිදුවීම් සම්බන්ධයෙන් අභ්‍යන්තරව තොරතුරු බෙදාහැරීම පහත පරිදි සිදුකරන ලදී.

(අ) මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් www.airforce.lk හි පළ කරන ලද අභ්‍යන්තර වෙබ් (intraweb.slaf.int) හි සියලුම වෙබ් ප්‍රවෘත්ති එකවර ප්‍රකාශයට පත් කරන ලදී.

(ආ) වසර තුළ කිසියම් වැදගත් පණිවිඩයක් දැනුම් දීමට අවශ්‍ය වූ ගුවන් හමුදා නිලධාරීන්ට Viber Guwan News දැනුම්දීම් 226ක් යවන ලදී.

(7) සුහද සබඳතා පවත්වා ගැනීම.

දේශීය හා ජාත්‍යන්තර මාධ්‍ය සමඟ සුහද සබඳතා පැවැත්වීම පහත පරිදි කටයුතු කරන ලදී.

(අ) 2022 වර්ෂය තුළ ‘අරගලය’ සිදුවීම හේතුවෙන් බාහිර සමාජ මාධ්‍ය වෙතින් සෘණාත්මක අදහස්/ ප්‍රතිපෝෂණ අත්දැකීමක් ලැබීය.

(ආ) මෙම අධ්‍යක්ෂකය විසින් ආසන්න වශයෙන් ප්‍රවෘත්ති ලිපි 151ක් පමණ බාහිර මාධ්‍ය ආයතන වෙත යවා ඇති අතර ඒ සියල්ල ඔවුන්ගේ අදාළ ප්‍රකාශනවල පළ කිරීමට එයට හැකි විය.

(8) ජාත්‍යන්තර/ දේශීය මාධ්‍ය අධීක්ෂණය.

මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් වෙබ් අඩවිය ඇතුළුව ගුවන් හමුදාව පිළිබඳ ජාත්‍යන්තර/දේශීය මාධ්‍ය මතය අධීක්ෂණය කරයි.

(අ) මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් සියලුම දේශීය පුවත්පත්, සියලුම රූපවාහිනී නාලිකා සහ ජාත්‍යන්තර වෙබ් අඩවි දිනපතා අධීක්ෂණය කරන අතර මාධ්‍ය ප්‍රතිචාර සහ ප්‍රවණතා ගුවන් හමුදාපතිවරයා වෙත දැනුම් දෙයි.

(ආ) මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අදාළව ප්‍රකාශයට පත් කරන ලද සියලුම ලිපි විශ්ලේෂණය, එහි ක්‍රියාකාරකම් සහ සුදුසු ප්‍රතිචාර ආඥාපතිවරයාගේ විධානයන් සමඟ සම්බන්ධීකරණය කරයි.

(ඇ) මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් දෛනික පුවත් ලිපි පහසුවෙන් උඩුගත කිරීමට සහ ප්‍රවෘත්ති පහසුවෙන් සමාලෝචනය කිරීමට හැකි වන පරිදි දත්ත ගබඩාවක් පවත්වාගෙන යයි.

(9) සිදුවීම් නිවේදනය සම්බන්ධීකරණය.

අධ්‍යක්ෂකය විසින් ගුවන් හමුදාව තුළ නිවේදක සංචිතය සම්බන්ධීකරණය කිරීම සහ 2022 දී ගුවන් හමුදා ආයතන තුළ සියලුම ගුවන් හමුදා ඉසව් 53ක් සහ ගුවන් හමුදා මූලස්ථානයෙ හි සිදුවීම් 10ක් සඳහා සවිස්තරාත්මක නිවේදකයින් අඛණ්ඩව සම්බන්ධීකරණය කරන ලදී.

(10) වීඩියෝ වාර්තා චිත්‍රපට නිෂ්පාදනය.

ගුවන් හමුදාවට අවශ්‍ය පරිදි සහ අවශ්‍ය විට වීඩියෝ වාර්තා චිත්‍රපට, රූපවාහිනී වෙළඳ දැන්වීම් නිෂ්පාදනය කිරීම. ඉතිහාස වාර්තා චිත්‍රපට, ගුවන් හමුදා සංවත්සර තේමා ගීත ආයෝජන උත්සවය සහ ක්‍රීඩාව සම්බන්ධ වාර්තා චිත්‍රපට ඇතුළුව වාර්තා චිත්‍රපට 31ක් 2022 දී නිෂ්පාදනය කරන ලදී.

(11) වීඩියෝ සහ ඡායාරූප ආවරණ සහාය.

වීඩියෝ සහ ඡායාරූපකරණය ගුවන් හමුදාව තුළ සහ පිටත ගුවන් හමුදා විශේෂ සිදුවීම් 189 සඳහා ආවරණ සහාය ලබා දෙන ලදී.

(12) පෙළපාලිවල මාධ්‍ය ආවරණය හැසිරවීම.

මාධ්‍ය අධ්‍යක්ෂකය විසින් වීඩියෝ සහ ඡායාරූප ආවරණය සහිත ප්‍රධාන පෙළපාලි තුනක් මෙහෙයවීය. මෙම අධ්‍යක්ෂකය විසින් 2022 නිදහස් උළෙල වෙනුවෙන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට නිවේදන කටයුතු සැපයීය.

(13) පුහුණුව හා සංවර්ධනය

නිවේදන 25ක කටයුතු සිදු කරන ලදි. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ නිවේදන කටයුතු පිළිබඳ සහතික පත් පාඨමාලාව සාර්ථකව නිම කරන ලදි.

ග. විනයාරක්ෂක අධ්‍යක්ෂකය.

(1) 2022 වර්ෂය තුළ කාර්යසාධනය පහත පරිදිය.

(අ) ශ්‍රීලංගුහ ගොඩබිම් පුහුණු පක්ෂාංගය, විද්‍යාපීඨය, චීන වරාය යටතේ පවතින විනයාරක්ෂක වෘත්තීය පුහුණු පාසලෙහි පොලිස් භටයින්ගේ/ පොලිස් කාන්තාවන්ගේ විනයාරක්ෂක මූලික සහ උසස් පාඨමාලා පවත්වනු ලැබේ. 2022 දී පොලිස් නිලධාරීන්/පොලිස් කාන්තාවන් සඳහා පවත්වනු ලබන පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර පහත පරිදි වේ.

i. පොලිස් මූලික පාඨමාලාව 1/2021 (ගුවන් භටයින් 20/ ගුවන් කාන්තාවන් 06).

ii. පොලිස් උසස් පාඨමාලාව 1/2021 (ගුවන් භටයින් 18/ ගුවන් කාන්තාවන් 06).

(ආ) ඒකළ වෘත්තීය පුහුණු පාසැලේ පවත්වන ලද උපදේශන ක්‍රම පාඨමාලාව අධිකාරී නොලත් විනයාරක්ෂක නිලධාරීන් දෙදෙනෙක් විසින් සම්පූර්ණ කරන ලදි.

(ඇ) ශ්‍රීලංගුහ උත්සව යතුරුපැදිකරුවන් සඳහා විශේෂ නවමු පුහුණුවක් පැවැත්වීම.

(ඈ) 2022 වර්ෂයේදී පොලිස් වෘත්තීය පුද්ගලයින් විසින් පහත සඳහන් විදේශීය පුහුණු වැඩසටහන් සම්පූර්ණ කරන ලදී.

පාඨමාලාව	රට	සහභාගිවන්නන් සංඛ්‍යාව
වෘත්තීය පුහුණු උසස් පාඨමාලාව	බංගලදේශය	02

වගුව – 21

(ඉ) 2022 වර්ෂයේදී පොලිස් වෘත්තීය පුද්ගලයින් විසින් පහත සඳහන් දේශීය පුහුණු වැඩසටහන් සම්පූර්ණ කරන ලදී.

අනු අංකය	පාඨමාලාව	ආයතනය	සහභාගිවන්නන් සංඛ්‍යාව
01	ඉංග්‍රිසි භාෂා පුහුණු පාඨමාලාව	JSLTI මාවතුට	04
02	දෙමළ භාෂා පුහුණු පාඨමාලාව	JSLTI මාවතුට	02
03	ප්‍රංශ භාෂා පුහුණු පාඨමාලාව	JSLTI මාවතුට	02

වගුව – 22

(ඊ) පොලිස් භටයන් යොදවා තිබූ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

මෙහෙයුම	ස්ථානගත කිරීම් ගණන
මධ්‍යම අප්‍රිකානු ජනරජයේ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම (MINUSCA)	02

වගුව – 23

(2) 2022 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන්හි සාරාංශය.

විස්තරය	නඩුවේ ස්වභාවය							එකතුව
	විනයාරක්ෂක අධ්‍යක්ෂකය විසින් ආරම්භ කරන ලද විමර්ශන	පෙත්සම් පදනම් කරගත් විමර්ශන	හදිසි පරීක්ෂා	වාහන පරීක්ෂා	ඉදිරිපත් කළ F.252 පෝරම	කැඩෙට් නිලධාරීන් නිෂ්කාශනය	නිවාඩු ලබා නොගෙන සේවයට වාර්තා නොකළ නිලධාරීන් අත්අඩංගුවට ගැනීම	
නඩු සංඛ්‍යාව	147	88	13	266	430	-	01	945

වගුව – 24

ඝ. ප්‍රාසාංගික කළා අධ්‍යක්ෂකය.

(1) සමාලෝචන කාල සීමාව තුළ, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ (AAP) ප්‍රක්ෂේපණය අනුව රංග කළා අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පහත සඳහන් ප්‍රධාන වියදම් දරා ඇත.

විස්තරය	ප්‍රමාණය (රු.මි.ලි)
ප්‍රාග්ධන වියදම්	
ගුවන් හමුදා තූර්ය වාදක කණ්ඩායම සඳහා සංගීත භාණ්ඩ සහ උපකරණ මිලදී ගැනීම	6.38
SVP වෙන් කිරීම (අලුත්වැඩියා කිරීම)	0.15
එකතුව	**6.53**

වගුව - 25

ණ. ක්‍රීඩා අධ්‍යක්ෂකය.

2022 වර්ෂය තුළ අත්පත් කරගත් ක්‍රීඩා අයිතමයන් පහත සඳහන්ය.

විස්තරය	ප්‍රමාණය (රු.මි.ලි)
ක්‍රීඩා අයිතම	5.10
ක්‍රීඩා සේවා	13.10
ක්‍රීඩා උපකරණ	2.10
එකතුව	**20.30**

වගුව - 26

ත. දන්ත සෞඛ්‍ය සේවා කාර්යාලය.

(1) 2022 වර්ෂය තුළ අත්පත් කරගන්නා ලද ප්‍රාග්ධන හා පුනරාවර්තන වත්කම් පහත පරිදිය.

අනු අංකය	අයිතම	මුදල (ලං.රු.මි)
01	දන්ත ශල්‍ය වෛද්‍ය උපකරණ	7.29
02	දන්ත ශල්‍ය වෛද්‍ය උපකරණ අළුත්	0.46
03	දන්ත ශල්‍ය වෛද්‍ය උපකරණ මිල දී ගැනීම	3.82
එකතුව		**11.57**

වගුව - 27

(2) 2022 වසර තුළ ප්‍රතිකාර සාරාංශය.

විස්තරය	කරන ලද ප්‍රතිකාර ප්‍රමාණය	රෝගීන් ප්‍රමාණය
සේවා පුද්ගලයන්, සේවා පුද්ගලයන් ගේ පවුල්, හා සිවිල් පුද්ගලයන්	37,190	21,402

වගුව - 28

(3) 2022 වසරේ සංවර්ධනයන්.

(අ) දන්ත ප්‍රතිකාර සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා දන්ත මධ්‍යස්ථාන වෙත යන (මුඛ සෞඛ්‍ය කළමනාකරණ පද්ධතිය) හරහා රෝගීන් කළමනාකරණය කිරීම.

(ආ) දන්ත ප්‍රතිකාර සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා කොළඹ දන්ත රෝහල වෙත යන (මුඛ සෞඛ්‍ය කළමනාකරණ පද්ධතිය) හරහා රෝගීන් කළමනාකරණය කිරීම.

(ඇ) මාසික සහ ත්‍රෛමාසික ප්‍රතිකාර ප්‍රතිලාභ කඩදාසි භාවිත නොකර (දන්ත ප්‍රතිලාභ කළමනාකරණ පද්ධතිය) කළමනාකරණය කරනු ලබයි.

(ඈ) වෛද්‍ය කළමනාකරණ පද්ධතිය හරහා ශ්‍රීලංකා ගුවන් හමුදා දන්ත වෛද්‍ය මධ්‍යස්ථානවල RPC/ SVP අධිකාරී නිකුත් කිරීමට පද්ධතියක් නිර්මාණය කර ඇත.

(4) මුඛ සෞඛ්‍ය නිවාරණ වැඩසටහන්.

මුඛ රෝග බොහෝ විට සැඟවී ඇති අතර නොපෙනී යයි, නැතහොත් ඒවා ජීවිතයේ හා වයසට යාමේ නොවැළැක්විය හැකි ප්‍රතිවිපාකයක් ලෙස පිළිගනු ලැබේ. කෙසේ වෙතත්, මුඛ රෝග නොවැළැක්විය හැකි බවට පැහැදිලි සාක්ෂි ඇත. නමුත් තනි පුද්ගල හා ජනගහන මට්ටමින් පාඨමාලාවේ සෑම අදියරකදීම සරල හා ඵලදායී පියවරයන් මඟින් අඩු කිරීම හෝ වළක්වා ගත හැකිය. එබැවින් පහත වැඩසටහන් සකස් කර ඇත.

(අ) වාර්ෂික දන්ත පරීක්ෂාව.
(ආ) වැළැක්වීමේ සත්කාර වැඩසටහන.
(ඇ) විශේෂ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන්.
(ඈ) පුහුණු.
(ඉ) පුද්ගලයින්/ මුඛ පිළිකා සහිත/ OPMDs/ ඉහළ දිරාපත් වීමේ අවදානම සහිත පුද්ගලයින් සඳහා විශේෂ ලේඛනය.
(ඊ) වාර්ෂික දන්ත පරීක්ෂාව, ගුවන් කාර්ය මණ්ඩල දන්ත පරීක්ෂාව සහ පූර්ව මරණ දත්ත සඳහා දත්ත පදනම්ව.

ද. අභ්‍යන්තර විගණන අංශය.

(1) වර්ෂය තුළ විධායක අභ්‍යන්තර විගණක (සේවා) කාර්යසාධනය.

(අ) මූල්‍ය විගණනය.

i. 2022 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් විශේෂයෙන් පහත සඳහන් ක්ෂේත්‍රවල රාජ්‍ය මූල්‍ය විගණනය ආවරණය වන පරිදි විගණන කටයුතු සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදා ඇකඩමිය, කඳවුරු සහ ස්ථානවල හදිසි විගණන චාරිකා සිදු කර ඇත.

(i) රාජ්‍ය පරිපාලනය.
(ii) මහජන අග්‍රිමය හැසිරවීම.
(iii) සැපයුම්.
(iv) යාන්ත්‍රික ප්‍රවාහනය.
(v) මූල්‍ය පද්ධති සංවර්ධනයේ වැඩිදියුණු කිරීම්.

ii. 2022 වර්ෂයට අදාළව අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද හදිසි විගණන චාරිකා පිළිබඳ විස්තර පහත දැක්වේ.

අනු අංකය	විද්‍යාපීඨය/මූලික කඳවුර/කඳවුර	විගණන සංචාරයේ දිනය	වාර්තාව යැවූ දිනය
01	ගුවන් හමුදා කඳවුර මඩකළපුව	2022 මාර්තු 14 සිට 2022 මාර්තු 18 දක්වා	2022 මාර්තු 07
02	ගුවන් හමුදා මූලික කඳවුර අනුරාධපුර	2022 පෙබරවාරි 14 සිට 2022 පෙබරවාරි 25 දක්වා	2022 මාර්තු 11
03	මොරවැව ගුවන් හමුදා කඳවුර	2022 පෙබරවාරි 28 සිට 2022 මාර්තු 04 දක්වා	2022 මාර්තු 18
04	ගුවන් හමුදා කඳවුර බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ	2022 මාර්තු 30 සිට 2022 අප්‍රේල් 06 දක්වා	2022 අප්‍රේල් 21

අනු අංකය	විද්‍යාපීඨය/මූලික කඳවුර/කඳවුර	විගණන සංචාරයේ දිනය	වාර්තාව යැවූ දිනය
05	ගුවන් හමුදා කඳවුර අම්පාර	2022 අප්‍රේල් 04 සිට 2022 අප්‍රේල් 08 දක්වා	2022 මැයි 20
06	පාලවි ගුවන් හමුදා කඳවුර	2022 අප්‍රේල් 18 සිට 2022 අප්‍රේල් 22 දක්වා	2022 මැයි 25
07	මුලතිව් ගුවන් හමුදා කඳවුර	2022 මැයි 09 2022 සිට මැයි 13 දක්වා	2022 මැයි 31
08	ඉරණමඩු ගුවන් හමුදා කඳවුර	2022 මැයි 23 සිට 2022 27 දක්වා	2022 ජුනි 28
09	කොළඹ ගුවන් හමුදා කඳවුර	2022 මැයි 30 සිට 2022 ජූනි 10 දක්වා	2022 ජුලි 04
10	වීරවිල ගුවන් හමුදා කඳවුර	2022 ජූලි 04 සිට 2022 ජූලි 08 දක්වා	2022 අගෝස්තු 03
11	දියතලාව ගුවන් හමුදා කඳවුර	2022 ජූලි 12 සිට 2022 ජූලි 15 දක්වා	2022 අගෝස්තු 03
12	පිදුරුතලාගල ගුවන් හමුදා කඳවුර	2022 ජූලි 18 සිට 2022 ජූලි 20 දක්වා	2022 අගෝස්තු 03
13	මීරිගම ගුවන් හමුදා කඳවුර	2022 අගෝස්තු 08 සිට 2022 අගෝස්තු 12 දක්වා	2022 අගෝස්තු 29
14	ඒකළ ගුවන් හමුදා කඳවුර	2022 අගෝස්තු 08 සිට 2022 අගෝස්තු 16 දක්වා	2022 සැප්තැම්බර් 07
15	ගුවන් හමුදා ඇකඩමිය චීන වරාය	2022 අගෝස්තු 16 සිට 2022 අගෝස්තු 26 දක්වා	2022 සැප්තැම්බර් 21
16	පලාලි ගුවන් හමුදා කඳවුර	2022 සැප්තැම්බර් 05 සිට 2022 සැප්තැම්බර් 09 දක්වා	2022 සැප්තැම්බර් 30
17	රත්මලාන මූලික ගුවන් හමුදා කඳවුර	2022 අගෝස්තු 29 සිට 2022 සැප්තැම්බර් 09 දක්වා	2022 ඔක්තෝබර් 03
18	කටුකුරුන්ද ගුවන් හමුදා කඳවුර	2022 ඔක්තෝබර් 03 සිට 2022 ඔක්තෝබර් 07 දක්වා	2022 නොවැම්බර් 09
19	කොග්ගල ගුවන් හමුදා කඳවුර	2022 සැප්තැම්බර් 20 සිට 2022 සැප්තැම්බර් 23 දක්වා	2022 නොවැම්බර් 10
20	ගුවන් හමුදා කඳවුර සීගිරිය	2022 ඔක්තෝබර් 26 සිට 2022 ඔක්තෝබර් 31 දක්වා	2022 නොවැම්බර් 14
21	ගුවන් හමුදා මූලික කඳවුර වව්නියාව	2022 නොවැම්බර් 08 සිට 2022 නොවැම්බර් 14 දක්වා	2022 නොවැම්බර් 24
22	කටුනායක මූලික ගුවන් හමුදා කඳවුර	2022 ඔක්තෝබර් 26 සිට 2022 නොවැම්බර් 18 දක්වා	2022 දෙසැම්බර් 21
23	වන්නි ගුවන් හමුදා රෙජිමේන්තු පුහුණු පාසල	2022 නොවැම්බර් 29 සිට 2022 දෙසැම්බර් 02 දක්වා	2022 දෙසැම්බර් 23
24	ගුවන් හමුදා මූලික කඳවුර හිඟුරක්ගොඩ	2022 දෙසැම්බර් 05 සිට 2022 දෙසැම්බර් 09 දක්වා	2022 දෙසැම්බර් 30

iii. අභ්‍යන්තර විගණන අංශය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදා විද්‍යාපීඨ/ මූලික කදවුරු සහ කදවුරුවල සියලුම අග්‍රිම ගිණුම් විගණන මාසිකව සිදු කරන ලද අතර, එක්සත් ජාතීන්ගේ සාම සාධක උප අග්‍රිම ඇතුළුව (සියලු ගෙවීම්, රිසිට්පත් සහ බැංකු සැසඳුම් ප්‍රකාශන) මහජන මුදල් යෙදවීමේදී රාජ්‍ය මූල්‍ය ආවරණය වන පරිදි සිදු කර නිර්දේශ ඉදිරිපත් කර රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ සඵලතාවය වැඩිදියුණු කිරීම සඳහා පවතින අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා පරිපාලන අධ්‍යක්ෂ ජනරාල් (ගිණුම්) වෙත යොමු කරන ලදී.

iv. අභ්‍යන්තර විගණන ඒකකය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගෙවීම් වවුචර සහ ශ්‍රී ලංකා ගුවන් හමුදා ප්‍රධාන ගිණුමේ බැංකු සැසඳුම් ප්‍රකාශයන් පිළිබඳ වවුචර විගණන සිදු කරන ලදී.

(i) ගුවන් හමුදා ගෙවීම් වවුචර පිළිබඳ වවුචර විගණනය.

කාල පරිච්ඡේදය	වාර්තාව යැවූ දිනය
2022 මාර්තු සහ ජූනි	2022 සැප්තැම්බර් 26

වගුව - 30

(ii) ශ්‍රී ලංකා ගුවන් හමුදා ප්‍රධාන ගිණුමේ බැංකු සැසඳුම් ප්‍රකාශයන්.

කාල පරිච්ඡේදය	වාර්තාව යැවූ දිනය
2022 මාර්තු	2022 මැයි 31
2022 ජූනි	2022 සැප්තැම්බර් 16
2022 සැප්තැම්බර්	2022 දෙසැම්බර් 23

වගුව - 31

v. අභ්‍යන්තර විගණන අංශය විසින් 2022 වර්ෂය තුළ පහත ප්‍රසම්පාදන විගණනය සිදු කර ඇත.

කාල පරිච්ඡේදය	විස්තරය	වාර්තාවේ දිනය
2022 වසර 1 වන කාර්තුව	දේශීය ප්‍රසම්පාදනය	2022 අගෝස්තු 10
2022 වසර 1 වන කාර්තුව	දේශීය ප්‍රසම්පාදනය	2022 ජූනි 03
2022 වසර 2 වන කාර්තුව	දේශීය ප්‍රසම්පාදනය	2022 සැප්තැම්බර් 29
2022 වසර 2 වන කාර්තුව	විදේශීය ප්‍රසම්පාදනය	2022 දෙසැම්බර් 01
2022 වසර 3 වන කාර්තුව	දේශීය ප්‍රසම්පාදනය වාර්තාව	2022 දෙසැම්බර් 30

වගුව - 32

vi. අභ්‍යන්තර විගණන අංශය විසින් 2022 වර්ෂය තුළ පහත තොග සමීක්ෂණය සිදු කර ඇත.

අනු අංකය	විද්‍යාපීඨය/ මූලික කඳවුර/ කදවුර	විගණනය සඳහා පැමිණෙන දිනය	වාර්තාව යැවූ දිනය
01	කටුනායක මූලික ගුවන් හමුදා කඳවුර - සැපයුම් හා නඩත්තු ඩිපෝව	2022 ජනවාරි 06 සිට 2022 ජනවාරි 21 දක්වා	2022 පෙබරවාරි 28
02	හිඟුරක්ගොඩ මූලික ගුවන් හමුදා කඳවුර - සැපයුම් හා නඩත්තු ඩිපෝව	2022 පෙබරවාරි 08 සිට 2022 පෙබරවාරි 11 දක්වා	2022 මාර්තු 07
03	කටුනායක මූලික ගුවන් හමුදා කඳවුර - සැපයුම් හා නඩත්තු ඩිපෝව	2022 මාර්තු 07 සිට 2022 මාර්තු 21 දක්වා	2022 මාර්තු 31
04	කටුනායක මූලික ගුවන් හමුදා කඳවුර - සැපයුම් හා නඩත්තු ඩිපෝව	2022 ජූනි 06 සිට 2022 ජූනි 17 දක්වා	2022 ජූලි 15

වගුව - 33

vii. අභ්‍යන්තර විගණන අංශය විසින් 2022 වර්ෂය තුළ වැටුප් සම්බන්ධ පහත විගණනය සිදු කර ඇත.

විස්තරය	වාර්තාව යැවූ දිනය
ගුවන් හමුදා වැටුප් සහ මානව සම්පත් කළමනාකරණ පද්ධතිය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව	2022 ජූනි 22
වැටුප් ගෙවීමේ සැසඳුම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව	2022 අගෝස්තු 23
2022 ජූලි මාසය සඳහා විදේශීය ගෙවීම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව	2022 දෙසැම්බර් 01

වගුව - 34

viii. ගුවන් හමුදා අත්තිකාරම් 'බී' ගිණුම විගණනය කරන ලදී.

විගණනය කළ කාල සීමාවේ දිනය	වාර්තාව යැවූ දිනය
2022 මැයි 19 සිට 2022 මැයි 27 දක්වා	2022 ජූනි 09
2022 ඔක්තෝබර් 20 සිට 2022 ඔක්තෝබර් 21 දක්වා	2022 නොවැම්බර් 10

වගුව - 35

ix. මූල්‍ය වාර්තා.

විස්තරය	වාර්තාව යැවූ දිනය
2020 අගෝස්තු සිට 2022 සැප්තැම්බර් දක්වා කාලය තුළ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් මඟින් ඉපැයූ ආදායම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව.	2022 ජනවාරි 18
ආදායම් ගිණුම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව (ආදායම් ශීර්ෂය 20.03.02.16) 2022 ජනවාරි සිට 2022 මාර්තු දක්වා වරලත් පියාසැරි ආදායම.	2022 ජූනි 28

2021 මූල්‍ය ප්‍රකාශය සඳහා අභ්‍යන්තර විගණන වාර්තාව.	2022 අගෝස්තු 12
එක්සත් ජාතීන්ගේ සාම සාධක දූත මණ්ඩල විසින් දරන ලද ආදායම් සහ වියදම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව.	2022 සැප්තැම්බර් 02
ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පාඩු හා හානි පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව.	2022 සැප්තැම්බර් 14
ලංකා බැංකුවේ ගිණුම් අංක 3947119 දරන විදේශ මුදල් බැංකු ඒකකයේ වියදම් විගණනය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව.	2022 නොවැම්බර් 25
එක්සත් ජාතීන්ගේ සාම සාධක දූත මණ්ඩල විසින් දරන ලද ආදායම් සහ වියදම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව.	2022 නොවැම්බර් 30

වගුව - 36

(ආ) අනුකූලතා විගණනය.

i. 2021 ජූනි 19 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක: DMA/AMC/2017/5/5 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශය විසින් 2022 වර්ෂය සඳහා වන වාර්ෂික විගණන සැලැස්ම සකස් කර ඊට විගණන සහ කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබා ගෙන විගණකාධිපතිවරයා හට පිටපතක්ද සහිතව මුදල් අමාත්‍යාංශයේ විගණන කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

ii. DMA/01-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, අභ්‍යන්තර විගණන අංශය විසින් 2022 වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට (AAP) සහ ප්‍රසම්පාදන සැලැස්මට සාපේක්ෂව තත්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රගති සමාලෝචනය කාර්තුවකට වරක් සිදු කර ඇත.

iii. 2021 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන අංශය විසින් භාණ්ඩාගාර චක්‍රලේඛ සහ මුදල් රෙගුලාසි ප්‍රකාරව මාසික විගණන වාර්තා සකස් කර පහත ආයතන වෙත යොමු කර ඇත.

(i) විගණකාධිපති
(ii) ලේකම්, මුදල් අමාත්‍යාංශය

iv. 2022 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන අංශය විසින් කාර්තුමය ඇගයීම් වාර්තාව සැකසීම සහ අංක DMA/RIAR/AQ/L/2021/01 හා 2021 මාර්තු 19 දිනැති ලිපිය අනුව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීම සිදු කරන ලදි.

v. 2021 වර්ෂය සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක/ අභ්‍යන්තර විගණන අංශය විසින් කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුමය ඇගයීම් වාර්තාව සැකසීම සහ පහත ආයතන වෙත යොමුකරන ලදි.

(i) කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
(ii) ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය

(ඇ) ශ්‍රීලංගුහ විශේෂ විගණනය.

විස්තරය	වාර්තා යැවූ දිනය
2019, 2020 සහ 2021 වසර සඳහා කටුනායක ගුවන් හමුදා කඳවුරේ ගුවන් භටයන්ගේ වියළි ආහාර ද්‍රව්‍ය සඳහා නිකුත් කරන ලද සලාක භාණ්ඩ පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව	2022 පෙබරවාරි 18
දීඝවාපිය ධාතුමන්දිරය ඉදිකිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව	2022 ජූලි 26

වගුව – 37

(ඇ) විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම ත්‍රෛමාසිකව පැවැත්වීම.

i. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක DMA/01/2019 මඟින් නියම කර ඇති පරිදි අභ්‍යන්තර විගණන අංශය විසින් 2022 වර්ෂය සඳහා ත්‍රෛමාසික විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පහත පරිදි පවත්වා ඇත.

කාර්තුව	විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වූ දිනය
පළවන කාර්තුව 2022	2022 අප්‍රේල් 01
දෙවන කාර්තුව 2022	2022 අගෝස්තු 19
තුන්වන කාර්තුව 2022	2022 දෙසැම්බර් 05
සිව්වන වන කාර්තුව 2022	2023 ජනවාරි මස පැවැත්වීමට නියමිතය

වගුව – 38

ii. 2022 වර්ෂය තුළ පැවැත්වූ ඉහත විගණන සහ කළමනාකරණ කමිටුවල රැස්වීම් වාර්තා අභ්‍යන්තර විගණන අංශය විසින් පිළියෙළ කිරීම, ඒවා සියලුම කමිටු සාමාජිකයින් අතර බෙදාහැරීම සහ රාජ්‍ය මුල්‍යය සම්බන්ධයෙන් ලබා දී ඇති නිර්දේශයන් කමිටුව විසින් සමාලෝචනය කිරීම.



iii. 2022 වර්ෂය තුළ ආරක්ෂක අමාත්‍යාංශය විසින් පවත්වන ලද කාර්තුමය විගණන කළමනාකරණ කමිටු රැස්වීම සඳහා විධායක අභ්‍යන්තර විගණක (සේවා) ත්‍රෛමාසිකව සහභාගී වීම පහත පරිදි වේ.

කාර්තුව	විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වූ දිනය
පළවන කාර්තුව 2022	2022 ජූනි 30
දෙවන වන සහ තුන්වන කාර්තුව 2022	2022 ඔක්තෝබර් 13

වගුව - 39

(ඉ) ශ්‍රීලංගුහ අභ්‍යන්තර පාලන සංවර්ධන අංශයේ සහාය.

i. 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (AAP) සහ 2021 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව (APR) සකස් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය සහාය සහ වැදගත් දායකත්වය ලබා දී ඇත.

ii. <u>අභ්‍යන්තර විගණන තොරතුරු පද්ධතියක් (IAIS) සංවර්ධනය කිරීම</u> ශ්‍රීලංකා ගුවන් හමුදාවේ අභ්‍යන්තර විගණනයේ තොරතුරු ලබා ගැනීමේ පහසුකම සඳහා අදාළ රේඛීය අධ්‍යක්ෂකවරුන්ගේ නිර්දේශ මත ප්‍රක්ෂේපිත අභ්‍යන්තර විගණන තොරතුරු පද්ධතියක් (IAIS) සංවර්ධනය කිරීම ප්‍රධාන මාණ්ඩලික ප්‍රධානියා විසින් අනුමත කර ඇත.

(ඊ) විගණකාධිපති යොමු කරන ලද විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ ප්‍රගතිය.

2022 වර්ෂයේදී විගණකාධිපති විසින් යොමු කරන ලද විගණන විමසුම් සහ ඊට පිළිතුරු සැපයීම පිළිබඳ සාරාංශය පහත පරිදිය.

විස්තරය	විගණන විමසුම් ගණන
2022 වර්ෂය ආරම්භයේදී පිළිතුරු නොදුන් විගණන විමසුම් ගණන	02
2022 වර්ෂය තුළ ලැබුණු විගණන විමසුම් ගණන	22
2022 වර්ෂය තුළ පිළිතුරු සපයන ලද විගණන විමසුම් ගණන	(21)
2022 වර්ෂය අවසානයේදී පිළිතුරු ලබා දීම සිදු කෙරෙමින් පවතින විගණන විමසුම් ගණන	03

වගුව - 40

(උ) කාර්ය මණ්ඩල පුහුණුව.

අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන් සහ ගුවන් භටයින් 06 දෙනෙකු ශ්‍රීලංකා ගුවන් හමුදාව විසින් පවත්වන ලද ආයතනගත කාර්ය මණ්ඩල පුහුණුවට සහ බාහිර ආයතන මඟින් මාර්ගගතව පවත්වන ලද පුහුණුව සඳහා සහභාගි විය.

(2) <u>වර්ෂය තුළ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ (සිවිල්) කාර්යසාධනය</u>

(අ) විගණනය - මූල්‍ය කළමනාකරණය.
(ආ) විගණනය - වැටුප් ක්‍රියාකාරකම් සහ සිවිල් කාර්ය මණ්ඩලයේ එහි අභ්‍යන්තර පාලනය පිළිබඳව.
(ඇ) විගණනය - ශ්‍රීලංකා ගුවන් හමුදාවේ බැංකු ගිණුම්වල බැංකු සැසඳුම් ප්‍රකාශන.
(ඈ) වවුචර් පරීක්ෂාව - අදාළ පොත් සහ ගිණුම් සමඟ.
(ඉ) විගණනය - පාඩු හා හානි පිළිබඳ නියැදිය - මෝටර් වාහන සහ අනෙකුත්.
(ඊ) රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම විගණනය - 2021 ණය ගොනු විගණනය.
(උ) අත්තිකාරම් බී ගිණුමේ හිඟ ශේෂයන් පිළිබඳ ප්‍රගති සමාලෝචනය.
(ඌ) විගණනය - අවසාන ගිණුම් - 2021 තැන්පතු ගිණුම් සහ ආදායම් ගිණුම් සමඟ.
(එ) විගණනය - එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් ගිණුම සහ ක්‍රියාකාරකම්.
(ඒ) විගණනය - වාහන නඩත්තු කිරීම වාහන අනතුරු සහ පාඩු සහ නිදහස් කිරීම්.

(ඔ) විගණනය - සුළු මුදල් කළමනාකරණය සහ ප්‍රසම්පාදනය.
(ඕ) විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් ප්‍රගති සමාලෝචනය සමඟ පවත්වන ලදී.
(ඖ) විශේෂ විමර්ශනය භාණ්ඩාගාරය සමඟ.
(ක) විගණනය - සිවිල් පරිපාලන කටයුතු රත්මලාන.
(බ) පුහුණු විගණන කාර්ය මණ්ඩලය සඳහා දෙමළ පාඨමාලාව.
(ග) කාර්යාල කළමනාකරණ කටයුතු.

න. විධායක බඳවා ගැනීමේ කාර්යාලය.

2022 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට පුද්ගලයින් 1,172 ක් බඳවාගෙන ඇති අතර ඉන් එක් අයෙකු නිලධාරී වන අතර 1,171ක් සෙසු නිලයන් වේ. එනම් සෘජු ඇතුළ්වීමේ වෘත්තීය නිලධාරීයා සෘජු ඇතුළුවීම යටතේ සහ සෙසු නිලයන් සාමාන්‍ය ප්‍රවේශ වශයෙන් වේ.

බඳවා ගැනීමේ වර්ගය	බඳවාගත් සංඛ්‍යාව
ඉදුරාම බඳවාගත් නිලධාරීන්	01
ගුවන් භටයන්	938
ගුවන් කාන්තාවන්	233
එකතුව	**1,172**

වගුව - 41

ප. විධායක පර්යේෂණ හා සංවර්ධන ඒකකය

(1) විධායක පර්යේෂණ හා සංවර්ධන ඒකකයේ වාර්ෂික කාර්යසාධනය 2022 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා සමාලෝචනය කරන ලද අතර ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

අනු අංකය	අවශ්‍යතාව	වටිනාකම (රු.)
01	ගලවා ගැනීමේ භාණ්ඩ ප්‍රවාහනය සහ පැටවීමේ වේදිකාවක් නිෂ්පාදනය කිරීම මිලදී ගැනීම	200,085.00
02	400v සිට 220v 3ph ට්‍රාන්ස්ෆෝමර් සඳහා M&E අයිතම මිලදී ගැනීම	673,200.00
03	400v සිට 220v 3ph ට්‍රාන්ස්ෆෝමර් සඳහා M&E අයිතම මිලදී ගැනීම	453,875.00
04	ලිහිණියා Mk 1E UAV ගුවන් යානා සඳහා DLE-120cc Twin UAV එන්ජිමක් කටුකුරුන්ද ශ්‍රීලංගුහ කඳවුරේහි AR&DW හි මිලදී ගැනීම	1,796,000.00
05	විදුලි බයිසිකල් ව්‍යාපෘතිය සඳහා බැටරි මිලදී ගැනීම	15,000.00
06	අලි වැට සඳහා සුහුරු පූර්ව අනතුරු ඇඟවීමේ සහ වැළැක්වීමේ පද්ධතියේ මූලාකෘති සඳහා ද්‍රව්‍ය අවශ්‍යතාවය	50,840.00
07	අලි වැට සඳහා සුහුරු පූර්ව අනතුරු ඇඟවීමේ සහ වැළැක්වීමේ පද්ධතියේ මූලාකෘති සඳහා ද්‍රව්‍ය අවශ්‍යතාවය	21,500.00
08	අලි වැට සඳහා සුහුරු පූර්ව අනතුරු ඇඟවීමේ සහ වැළැක්වීමේ පද්ධතියේ මූලාකෘති සඳහා ද්‍රව්‍ය අවශ්‍යතාවය	5,730.00

වගුව - 42

(2) 2022 වර්ෂයේදී ආරම්භ කරන ලද ශ්‍රීලංගුහ විධායක පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති පහත දැක්වේ.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	උත්පාදකයා	අධ්‍යක්ෂකය
01	Cessna-150 ගුවන් යානා VR පරීක්ෂකය සේවා හැකියාව නැවත ස්ථාපිත කිරීම	No 1 FTW	ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය
02	PT-6 ගුවන් යානා ප්‍රති-කොලිසන් ආලෝක පද්ධතිය-ප්‍රති-ගැටුම් ආලෝක දේශීයව අලුත්වැඩියාව	No 1 FTW	
03	AN-32B ගුවන් යානා එන්ජින් ඔයිල් මික්සර්	No 2 Sqn	
04	AN-32B ගුවන් යානා සඳහා ප්‍රධාන ගොඩබෑමේ ආම්පන්න අගුලු දැමීමේ ආරක්ෂිත උපාංගය	No 2 Sqn	
05	සහායක බල ඒකකය ස්වයං පාලන ඒකක පරීක්ෂණ උපාංගය	No 4 Sqn	
06	F-7 Aircraft Drop Tank Breeze Plug ස්ථාපනය සඳහා විශේෂ මෙවලම	No 5 Sqn	
07	ගලවා ගැනීමේ අයිතම ප්‍රවාහනය සහ පැටවීමේ වේදිකාව නිෂ්පාදනය කිරීම	No 6 Sqn	
08	අතේ ගෙන යා හැකි ප්‍රධාන රෝටර් හබ් නඩත්තු කිරීම සහ ප්‍රවාහන වේදිකාව නිෂ්පාදනය කිරීම	No 6 Sqn	
09	ඇඟවුම් සහ සිසිලන පද්ධතිය සහිත අතේ ගෙන යා හැකි හයිඩ්‍රොලික් පරීක්ෂණ-රිග් වේදිකාව නිෂ්පාදනය කිරීම	No 6 Sqn	
10	Bell 206 හෙලිකොප්ටර් සම්ප්‍රේෂණ බිම් හැසිරවීමේ කරත්තය නිෂ්පාදනය කිරීම	No 7 Sqn	
11	P3 Filter Pressure Drop Check Test Kit	No 7 Sqn	
12	බිම් ගොඩබෑමේ ආම්පන්න මෙහෙයුම සඳහා B-200 ගුවන් යානා සඳහා වායු පීඩන නියාමකය නිෂ්පාදනය කිරීම	No 8 Sqn	
13	පරිගණකගත මෙවලම් කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීම	No 61 Flight	
14	සකස් කළ හැකි යාන්ත්‍රික ක්‍රීපර් නිර්මාණය කිරීම	No 61 Flight	
15	ජල සක්‍රීය ආලෝක ඒකක බැටරි පරීක්ෂක සැලසුම් කිරීම සහ සැකසීම	AEW Safety Bay	
16	Bleed Valve Functional Checking Fixture (PT 6T Series Engine) සැලසුම් කිරීම සහ සැකසීම	AEW Engine Bay	
17	ට්‍රාන්සිස්ටර පරීක්ෂක	AEW Electrical Bay	
18	උපකරණ පරීක්ෂණ ආධාරකය	AEW Instrument Bay	
19	Houchin බිම් බල ඒකකය සඳහා නව ආරක්ෂණ සහ වෝල්ටීයතා නියාමක මණ්ඩලයක් සැලසුම් කරන්න	GEW SLAF Base Kat	සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය
20	වාහන වාහක ට්‍රේලරය නිෂ්පාදනය කිරීම	MTROW SLAF Base Kat	

අනු අංකය	ව්‍යාපෘතියේ නම	උත්පාදකයා	අධ්‍යක්ෂකය
21	ගුවන් ගමනාගමන පාලනය සඳහා ඇල්ඩිස් ලාම්පුව සැකසීම	M&EEW	සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂකය
22	Aerodrome Beacon සැලසුම් කිරීම සහ සැකසීම		
23	Growler නිෂ්පාදනය (ආමේචර පරීක්ෂණ උපකරණ)		
24	ගුවන් තොටුපල ආලෝකකරණ පද්ධතිය සඳහා තීව්‍රතා පාලන ඒකකය සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම (ධාවන පථයේ ආලෝක දීප්තියේ පාලකය)		
25	වායු සමීකරණ ස්වයං ක්‍රියාකාරී ඒකකයක් සැලසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීම. (AC Cut off and Restart Module)		
26	Fused Deposition Modeling (FDM) තාක්ෂණය සහිත අඩු වියදම් ත්‍රිමාණ මුද්‍රණ යන්ත්‍රයක් සංවර්ධනය කිරීම මත අනුකරණය කිරීම	ITW SLAF Base RMA	තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය
27	කෘතිම ස්නායු ජාලය භාවිත කරන වීඩියෝ නිරීක්ෂණ යෙදුම්වල වස්තු හඳුනාගැනීම සහ ඇඟවීම		
28	MI-17 සහ බෙල් 212 හෙලිකොප්ටර් යානා සඳහා ආපදා සහන වායු ඩ්‍රෝපින් යාත්‍රාවක් සැලසුම් කිරීම	DAI	ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය
29	ගුවන් යානා ඩිජිටල් ඔරලෝසුව	R&DW	විධායක පර්යේෂණ හා සංවර්ධන ඒකකය
30	පුද්ගලයන් දෙදෙනෙකු ටැන්ඩම් ඊ-බයික්	R&DW	පර්යේෂණ හා සංවර්ධන පක්ෂාංගය
31	සුළං බලැති ජල පොම්ප කිරීම සහ වාරිමාර්ග පද්ධතිය		
32	භූමි ආරක්ෂක අරමුණ සඳහා දුරස්ථ වෙඩි තැබීමේ යාන්ත්‍රණය	AR&DW SLAF Stn Ktk	ගගන පර්යේෂණ හා සංවර්ධන පක්ෂාංගය
33	සෞඛ්‍ය සම්පන්න ගුවන් හමුදාවක් සඳහා ශ්‍රීලංකා ගුවන් හමුදා භටයින්ගේ වාර්ෂික භෞතික තක්සේරුව සඳහා සම නැමීමේ කැලිපරය භාවිතයෙන් ශරීර මේද ප්‍රතිශතය මැනීම හඳුන්වාදීමේ යෝජනාව	ප්‍රසම්පාදන අංශය (PD Section)	ප්‍රසම්පාදන අංශය (PD Section)
34	විදුලි බයිසිකල් ව්‍යාපෘතිය	අංක 28 රෙජිමේන්තු පක්ෂාංගය Cbo	අංක 28 රෙජිමේන්තු පක්ෂාංගය Cbo
35	විවේක සහ විනෝදාස්වාද පක්ෂාංග සඳහා නව කොටස් ප්‍රතිසන්ධාන පද්ධතිය ක්‍රියාත්මක කිරීම	CAD	CAD

(3) 2022 වර්ෂයේදී විධායක පර්යේෂණ හා සංවර්ධන ඒකකය මඟින් මුදල් ලබා දුන් පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘතියේ නම	අධ්‍යක්ෂකය
01	28VDC සහ 115V AC බල ඒකකය සැලසුම් කිරීම සහ සැකසීම	ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂකය
02	FOD එකතු කිරීමේ යන්ත්‍රය	
03	ගුවන් කාර්ය මණ්ඩලය සඳහා බැලිස්ටික් ආරක්ෂණ ඇඳුම සැලසුම් කිරීම සහ සැකසීම	සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂකය
04	ඩ්‍රෝන සඳහා ඩොප්ලර් රේඩාර් පදනම් කරගත් හඳුනාගැනීමේ පද්ධතිය	විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂකය
05	න්‍යෂ්ටික, ජීව විද්‍යාත්මක, රසායනික (NBC) කැනිස්ටර් සැලසුම් කිරීම සහ සැකසීම	ගොඩබිම් මෙහෙයුම් අධ්‍යක්ෂකය
06	ශ්‍රීලංකා ගුවන් හමුදා නිරීක්ෂණ වීඩියෝවේ මානව හැසිරීම් සහ විෂමතා හඳුනාගැනීමේ විශ්ලේෂණය	තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂකය

වගුව - 44

(4) 2022 වර්ෂය තුළ විධායක පර්යේෂණ හා සංවර්ධන ඒකකය මඟින් සිදු කරන ලද ව්‍යාපෘති

අනු අංකය	ව්‍යාපෘතියේ නම	අධ්‍යක්ෂකය/ අංශය
01	පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය - SLAF Base Kat හි සූර්ය බලශක්තිය	R&DW and M&EEW
02	පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය - ජීව වායු බලාගාරය	CMD Agro Officer
03	පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය - සුළං බලාගාරය	R&DW and M&EEW
04	Drone Jammer නිෂ්පාදනය කිරීම	CRDC and CDRD
05	ගල්අඟුරු උදුන්	R&DW
06	පාසලට ඇතුළත් කිරීමේ අයදුම්පත් කළමනාකරණ පද්ධතිය	CRDC/ Dte of IT
07	බලශක්ති පරිභෝජන දත්ත කළමනාකරණ පද්ධතිය	CRDC/ Dte of IT

වගුව - 45

ඛ. එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් අංශය.

(1) 2022 දී එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා යොදවන ලද ශ්‍රීලංගුහ සාමාජිකයින් පිළිබඳ විස්තර පහත පරිදිය.

පුද්ගලයින්	පුද්ගලයින් සංඛ්‍යාව
මාණ්ඩලික නිලධාරීන්	03
නිලධාරීන්	20
සෙසු නිලයන්	90
එකතුව	**113**

වගුව - 46

(2) මෙහෙයුම් මඟින් උත්පාදනය කරන ලද ආදායම (මධ්‍යම අප්‍රිකාව) - 2022.

විස්තරය	ලැබුණු ආදායම (ඇ.ම.ඩො)	ලැබීමට ඇති ආදායම (ඇ.ම.ඩො)
පියාසර පැය	3,595,660.00	3,506,607.00
ප්‍රධාන උපකරණ/ ස්වයං පැවැත්ම සඳහා	702,661.44	236,138.94
එකතුව	**4,298,321.44**	**3,742,745.94**

වගුව - 47

(3) එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් සඳහා වූ මූලධන හා පුනරාවර්ථන වියදම් පිළිබඳ විස්තර.

වියදම් වර්ගය	ප්‍රමාණය (ඇ.ම.ඩො)
මූලධන	51,997,880.45
පුනරාවර්ථන	99,325.00

වගුව - 48

2.1.2 දීපව්‍යාප්තව පිහිටා ඇති ශ්‍රීලංගුහ ගුවන් හමුදා විද්‍යායතන/ මූලික කඳවුරු සහ කඳවුරු විසින් ක්‍රියාත්මක කරන ලද ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතීන් පහත සඳහන් පරිදි වේ.

අ. ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලික කඳවුර රත්මලාන.

(1) ශ්‍රමදාන ව්‍යාපාරය - රත්මලාන දුම්රිය ස්ථානය.





(2) දිළිඳු පවුල් පහක් සඳහා පාසල් දව්‍ය සහ වියළි සලාක මල්ලක් පරිත්‍යාග කිරීම.





ආ. ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලික කඳවුර අනුරාධපුර.

(1) කැකිරාව පලාගල විද්‍යාලයේ සනීපාරක්ෂක සංකීර්ණය ඉදිකිරීම.
(2) අනුරාධපුර ශික්ෂණ රෝහලේ ශල්‍යාගාරයේ තීන්ත ආලේප කිරීම.
(3) අලගොල්ලෑව දේවස්ථානයේ විශේෂ වෛද්‍ය, දන්ත සහ අක්ෂි සායනයක් පැවැත්වීම.
(4) උට්ටිමඩුව විද්‍යාලයේ සනීපාරක්ෂක සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම.
(5) සිවිල් සේවා පුද්ගලයින්ගේ අඩක් ඉදිකරන ලද නිවාස දෙකක් ඉදිකිරීම.

ඇ. ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලික කඳවුර වවුනියාව.

No 2 MTR & OW හි 08 වැනි සංවත්සරය සඳහා ශ්‍රී ජයසුමනාරාමය, පරණ හල්මිල්ලෑව විහාර ප්‍රතිසංස්කරණය කිරීම.





ඈ. ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලික කඳවුර හිඟුරක්ගොඩ.

අනු අංකය	විස්තරය	ස්ථානය	දිනය
01	තාප්පය සහ පොකුණ ඉදිකිරීම	බෞද්ධ මද්‍යස්ථානය, හිඟුරක්ගොඩ	22.02.2022
02	ශ්‍රමදාන ව්‍යාපාරය	ධර්මරාජ මහ පිරිවෙන, දිවුලංකඩවල	23.02.2022
03	ගොඩනැගිල්ලක් ඉදිකිරීම	බිම්බාරාම විහාරස්ථානය, හිඟුරක්ගොඩ	24.02.2022
04	ශ්‍රමදාන ව්‍යාපාරය	ධර්මපාල බෝසත් ළමා නිවාසය, හිඟුරක්ගොඩ	25.02.2022
05	වැසිකිලි සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම	ධර්මපාල බෝසත් ළමා නිවාසය, හිඟුරක්ගොඩ	08.03.2022
06	පඩිපෙළ ඉදිකිරීම	ජිනේන්ද්‍රාරාම විහාර ස්ථානය, වෙහෙරගල	09.08.2022
07	වෛද්‍ය සහ දන්ත වෛද්‍ය කඳවුර	හිඟුරක්ගොඩ ශ්‍රී රාහුල විද්‍යාලය	02.11.2022
08	වැසිකිළි සංකීර්ණය අලුත්වැඩියා කිරීම	සරණ බෞද්ධ පදනම මාපිය සෙවණ - මැදිරිගිරිය	12.11.2022

වගුව - 49

ඉ. ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර කොළඹ.

(1) බොරැල්ල අතුළ දක්ෂිණාරාමයේ ප්‍රතිසංස්කරණ කටයුතු.
(2) මුල්ලේරියා රෝහලේ වාට්ටුවේ ප්‍රතිසංස්කරණ කටයුතු.
(3) බොරැල්ල තනියාගම් දෙමළ පාසලේ ළමා උද්‍යානය සහ නැටුම් කාමරය ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු.
(4) මහරගම පිළිකා රෝහලේ වහල ප්‍රතිසංස්කරණය කිරීම.

ඊ. ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර අම්පාර.

(1) 2022 ජනවාරි 17 වන දින ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ත්‍රිවිධ හමුදාපතිවරුන් සහ අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් දීඝවාපිය සර්වඥ ධාතූන් වහන්සේලා තැන්පත් කිරීම සහ නීලගිරිය මහා සෑයට ගල් තැබීම.





(2) 2022 පෙබරවාරි 01 වන දින සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ සහභාගීත්වයෙන් ගුවන් මිතුදම් ව්‍යාපෘතිය යටතේ අභයපුර විද්‍යාලයේ නර්තන ශාලාව විවෘත කිරීම.





(3) 2022 මැයි 23 වන දින දීඝවාපිය විහාරස්ථානයේදී දානමය පිංකමක් පවත්වන ලදී.




(4) 2022 ජූනි 02 දින අරන්තලාව විහාරස්ථානයේදී දානමය පිංකමක් පවත්වන ලදී.




(5) සිවිල් වැසියන් සඳහා පරිත්‍යාග වැඩසටහනක් සේවා වනිතා ඒකකය විසින් පවත්වන ලද අතර වියළි සලාක පාර්සල් 50ක් 2022 මාර්තු 02 දින පරිත්‍යාග කරන ලදී.




(6) 2022 ඔක්තෝම්බර් 07 වන දින නාමල්ඔය විහාරස්ථානයේ දී ගම්වාසීන්ට පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.




(7) 2022 ඔක්තෝම්බර් 25 වන දින හෙන්නානිගල රජමහා විහාරයේ දී, ශ්‍රමදාන වැඩසටහනක් පවත්වන ලදී.




(8) 2022 ඔක්තෝබර් 29 වන දින නීලගිරිය විහාරස්ථානයේ, කඨින පූජාව, පවත්වන ලදී.




(9) 2022 ඔක්තෝබර් 31 වන දින හිමිදුරුව විහාරස්ථානයේ, කඨින පූජාව, පවත්වන ලදී .




(10) ශ්‍රී ලංකා ගුවන් හමුදා අම්පාර කඳවුරේ 33 වන සංවත්සරය නිමිත්තෙන් කඳවුරු රෝහලේදී රුධිර පරිත්‍යාග වැඩසටහනක් පවත්වන ලද අතර 2022 නොවැම්බර් 25 වන දින අම්පාර - උහන මාර්ගයේ පිරිසිදු කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.




ඌ. ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර පාලවි.

2023 පෙබරවාරි 07 වන දින පු/එරුක්කළම්පිඩ්ඩි මුස්ලිම් මහා විද්‍යාලයේ පාසල් ගොඩනැගිල්ලේ පින්තාරුව ප්‍රතිසංස්කරණය කිරීම සහ මේස පුටු අලුත්වැඩියා කිරීම සිදු කරන ලදී.



ඌ. ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර ඉරණමඩු.

(1) 2022 මාර්තු 01 ශ්‍රමදාන කඳවුර.




(2) 2022 සැප්තැම්බර් 30 වන දින ජල පිරිපහදු පද්ධතිය.





එ. ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර මුලතිව්.

අනු අංකය	දිනය	විස්තරය	ප්‍රතිලාභීන්
01	2022 මාර්තු 01	71 වන ගුවන් හමුදා දිනය නිමිත්තෙන් මුල්ලිවේලි - කේප්පාපිලව් දෙමළ පාසලේදී ශ්‍රමදාන වැඩසටහනක් පවත්වන ලදී.	කාර්ය මණ්ඩලය සහ සිසුන්
02	2022 මැයි 03	මුලතිව් කුරුඳුමල්ල විහාරස්ථානයේ ශ්‍රමදාන වැඩසටහනක් පවත්වන ලදී.	බැතිමතුන්
03	2022 සැප්තැම්බර් 30	සේවා වනිතා "ගුවන් මිතුදම් ව්‍යාපෘතිය" 2022 මුල්ලියාවලෙයි දෙමළ ප්‍රාථමික විද්‍යාලයේ සිසුන්ගේ පානීය අවශ්‍යතා සඳහා ජල පිරිපහදු පද්ධතියක් ස්ථාපිත කිරීම	කාර්ය මණ්ඩලය සහ සිසුන්

වගුව - 50

ඒ. ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර මඩකළපුව.

(1) ගුවන් ගුණදම්, සේවා වනිතා ව්‍යාපෘතිය යටතේ සිවිල් රවීන්ද්‍රන් මහතා වෙනුවෙන් අභිනවයෙන් ඉදිකරන ලද නිවස විවෘත කිරීම සහ භාරදීම මඩකළපුව ගුවන් හමුදා කඳවුරේ අණදෙන නිලධාරී විසින් සිදු කරන ලදී.





(2) "ගුවන් මිතුදම්" සේවා වනිතා ව්‍යාපෘතියේ 45 වන අදියර "මන්තිව් සිත්තිරෙයිබ්" වේලායන ස්වාමි කෝවිලේදී සාර්ථකව නිමකර ගම්වාසීන්ට භාරදීම සිදුකෙරුණි.





(3) 2022 මැයි 04 දින ලේ දන්දීමේ වැඩසටහනක් පවත්වන ලදී.



(4) 2022 මාර්තු 02 වන දින මඩකළපුව නගරයේ කළපු ප්‍රදේශය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහනක් පවත්වන ලදී.



(5) 2022 මැයි 15 දින ඩෙංගු මර්දන වැඩසටහනක් පවත්වන ලදී.



(6) 2022 මාර්තු 27 වන දින වීචුකල්මුනේ ශාන්ත ආනා විද්‍යාලය පිරිසිදු කිරීමේ ශ්‍රමදාන වැඩසටහනක් පවත්වන ලදී.



(7) 2022 මැයි 06 සිට 2022 නොවැම්බර් දක්වා මඩකළපුව ප්‍රදේශයේ දිළිඳු පවුල් (පවුල් 70) සඳහා ගව පරිත්‍යාග වැඩසටහනක් පවත්වන ලදී (ගවයන් 140).



(8) 2022 දෙසැම්බර් 03 වන දින වෙග්නේෂ්වරම් විද්‍යාලයේ භාවිතයට ගත නොහැකි පුටු සහ මේස අලුත්වැඩියා කිරීම.



ඒ. ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර මොරවැව.

(1) ගුවන් හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනිගේ මගපෙන්වීම යටතේ 2022 අප්‍රේල් 04 වන දින ගුවන් මිතුදම් ව්‍යාපෘතියක් ලෙස සමගිපුර, මහදිවුල්වැව ප්‍රදේශයේ ජල පිරිපහදු පද්ධතිය සාර්ථකව නිම කරන ලදී.





(2) මොරවැව සහ කණුගහවැව (කුඹුරු ගොවි පවුල් 60) ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී වී ගොවීන්ගේ වී අස්වනු නෙළීම, අස්වනු පිරිවැය අඩුකර ඔවුන්ගේ ඉපැයීම් වැඩිකර ගැනීමට දිරිදීමනා ලබා දීම.





(3) කණුගහවැව අලිවැට ව්‍යාපෘතිය 2022 මැයි 10 වන දින වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන ලදී.





(4) එළවළු වගා කිරීමේ ව්‍යාපෘතිය 2022 ජුනි 09 දින කඳවුරු පරිශ්‍රයේ දී පැවැත්විණි.





(5) RSF පිහිටුවීමේ 19 වන සංවත්සරය වෙනුවෙන් දානමය පිංකම 2022 ජූලි 07 වන දින රේවතී ළමා නිවාසයේදී පවත්වන ලදී.





(6) කඳවුරෙහි 49 වැනි සංවත්සර දිනය නිමිත්තෙන් 2022 ජූලි 28 වැනි දින රේවතී ළමා නිවාසයේදී ශ්‍රමදාන වැඩසටහනක්, දානමය පිංකමක් සහ තෑගි පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් පවත්වන ලදී.





ඔ. ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ.

(1) 2022 ජනවාරි 25 ආඬිඅම්බලම ඩේවිඩ් ද සිල්වා පාසලේ ශ්‍රමදාන වැඩසටහන.





(2) 2022 ජනවාරි 25 දින දුම්රිය කඳවුරු පරිශ්‍රයේ ලේ දන්දීමේ වැඩසටහන.





(3) 2022 මාර්තු 01 මීගමුව වෙරළේ ශ්‍රමදාන වැඩසටහන.





(4) 74 වන නිදහස් දිනය නිමිත්තෙන් වැඩිහිටි පුද්ගලයින් සඳහා වියළි සලාක මල්ලක් බෙදා දීම.





(5) ආඬිඅම්බලම ඩේවිඩ් ද සිල්වා පාසලේ ජල ටැංකිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ තණකොළ කපන යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම.





ඕ. ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර පිදුරුතලාගල.

(1) 2022 ජනවාරි 04 වන දින නුවරඑළිය ග්‍රෙගරි ලේක් හි ශ්‍රමදාන වැඩසටහන.





(2) 2022 මාර්තු 02 දින Paynter ළමා නිවාසයේ ශ්‍රමදාන වැඩසටහන.





(3) රුක් රෝපණ වැඩසටහන 2022 මාර්තු 02.





(4) "ගුවන් මිතුදම්" ව්‍යාපෘතියේ 36 වන අදියර 2022 ජූලි 12 වන දින හඟුරන්කෙත දෙණිකේ විද්‍යාතිලක ප්‍රාථමික විද්‍යාලයේදී නිම කරන ලදී.





ඔ). ශ්‍රීලංකා ගුවන් හමුදා සටන් පුහුණු පාසල දියතලාව.

දිනය	විස්තරය	ප්‍රතිලාභීන්
2022.02.23 සිට 2022.02.24 දක්වා	කහගොල්ල කෝප් සිටි රෙස්ට් පරිශ්‍රයේදී ශ්‍රමදාන ව්‍යාපාරය පැවැත්වුණි.	කෝප් සිටි රෙස්ට් භාවිත කරන ජනතාව
2022.03.18 සිට 2022.03.19 දක්වා	ශ්‍රී පාදස්ථානයේ පිරිසිදු කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.	සිවිල් සමාජය
2022.04.01 සිට 2022.04.30 දක්වා	ශාන්ත ඉමාඩ් සෙමනේරිය (හවඩන්) ක්‍රිස්තියානි දේවස්ථානයේ ශ්‍රමදාන ව්‍යාපාරයක් පවත්වන ලද අතර සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සහ දේවස්ථාන ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම.	සිවිල් සමාජය
2022.06.01 සිට 2022.06.03 දක්වා	දියතලාව ජාතික පාසලේ දෙමහල් ගොඩනැගිල්ල සේවා වනිතා ඒකකයේ ගුවන් මිතුදම් ව්‍යාපෘතිය යටතේ ප්‍රතිසංස්කරණය කර ඇත.	පාසල් ළමුන්
2022.10.08	කහගොල්ල විහාරස්ථානයේ ශ්‍රමදාන වැඩසටහනක් පවත්වන ලදී.	සිවිල් සමාජය
2022.10.08	විහාරකැලේ විහාරස්ථානයේ ශ්‍රමදාන වැඩසටහනක් පවත්වන ලදී.	සිවිල් සමාජය
2022.10.11	දියතලාව ගුවන් හමුදා සටන් පුහුණු පාසලේ 70 වැනි සංවත්සරය වෙනුවෙන් ශ්‍රමදාන වැඩසටහනක් දියතලාව නගරයේදී පවත්වන ලදී.	සිවිල් සමාජය
2022.10.12	දියතලාව ගුවන් හමුදා සටන් පුහුණු පාසලේ 70 වැනි සංවත්සරය නිමිත්තෙන් ශ්‍රමදාන වැඩසටහනක් දියතලාව මහ රෝහලේදී පවත්වන ලදී.	සිවිල් සමාජය
2022.10.13	දියතලාව ගුවන් හමුදා සටන් පුහුණු පාසලේ 70 වැනි සංවත්සරය නිමිත්තෙන් ශ්‍රමදාන වැඩසටහනක් දියතලාව ආයුර්වේද රෝහලේදී පවත්වන ලදී.	සිවිල් සමාජය

දිනය	විස්තරය	ප්‍රතිලාභීන්
2022.10.14	දියතලාව ගුවන් හමුදා සටන් පුහුණු පාසලේ 70 වැනි සංවත්සර උත්සවය නිමිත්තෙන් වෛද්‍ය සායනය සහ දන්ත සායනය දෝව ශ්‍රී සුදර්ශි විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ පාසලේදී පවත්වන ලදී.	සිවිල් සමාජය
2022.10.17	දියතලාව කතෝලික දේවස්ථානයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වුණි.	සිවිල් සමාජය
2022.12.10	ගල්කන්ද විහාරස්ථානයේ ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වුණි.	සිවිල් සමාජය
2022.12.22	කහගොල්ල මුස්ලිම් දේවස්ථානයේදී ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වුණි.	සිවිල් සමාජය

වගුව - 51

2.2 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

***2021-2023* කාල පරාසය සඳහා වන සංයුක්ත සැලැස්මෙහි** අන්තර්ගත ඉලක්ක හා අරමුණු වෙත ලඟා වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව පහත කාර්යයන් ආරම්භ කර ඇත.

උපාය මාර්ගික ඉලක්ක	උපාය මාර්ගික අරමුණු
ඉලක්කය 01 **ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු පියාසර හා මෙහෙයුම් ශක්‍යතාවයන් ඉහළ නැංවීම හා ශක්තිමත් කිරීම.**	**අරමුණු 1.1** ශ්‍රී ලංකා ගුවන් සීමාව තුළ ඕනෑම ආකාරයේ ගුවනින් පැමිණෙන සතුරු තර්ජනයක් අනාවරණය, හඳුනාගැනීම හා විනාශකිරීමට ඇති ගුවන් ආරක්ෂක හැකියාවන් වැඩිදියුණු කිරීම.
	අරමුණ 1.2 රේඩාර් ආවරණයේ හිඩැස් පියවීම සඳහා උපායමාර්ගික වශයෙන් වැදගත් ස්ථානවල අමතර රේඩාර් ඒකක පිහිටුවා දැනට පවතින රේඩාර් ආවරණය තවදුරටත් පුළුල් කිරීම.
	අරමුණ 1.3 ගුවන් හා සමුද්‍රීය යුධ උපාය සම්බන්ධීකරණ මධ්‍යස්ථානය (AMSCC) සමඟ ගුවන් ආරක්ෂණ හා ගුවන් ගමන් පාලන රේඩාර් තිර ඇතුළත් තත්කාලීන දත්ත හුවමාරු/ සන්නිවේදන පද්ධතිය වැඩිදියුණු කිරීම.
	අරමුණු 1.4 සිවිල් අධිකාරී මෙහෙයුම් සඳහා යුධ ආධාර දීම (MACA) මෙන්ම මිත්‍ර හමුදාවන් සඳහා දිවා/රාත්‍රී හා ඕනෑම කාලගුණික තත්ත්වයක් යටතේ මූලෝපායික, මෙහෙයුම් ගත හා උපායමාර්ගික ගුවන් ප්‍රවාහන කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ශක්‍යතාවයන් වැඩිදියුණු කිරීම.
	අරමුණ 1.5 ප්‍රභූ/ විශේෂ පුද්ගලයින් ගුවනින් ප්‍රවාහනය කිරීම සඳහා වන හැකියාව වර්ධනය කිරීම.
	අරමුණ 1.6 යුධෝපකරණ සඳහා අවශ්‍ය අවි අඛණ්ඩව පවතින බව සහතික කිරීම.
	අරමුණ 1.7 වාතයේ සිට ගොඩබිමට ප්‍රහාර එල්ල කිරීමේ ශක්‍යතාව නැවත ලබා ගැනීම.
	අරමුණ 1.8 ශ්‍රීලංගුහ පියාසර පුහුණුව වැඩිදියුණු කිරීම.
	අරමුණ 1.9 ගුවන්යානා නඩත්තු හා සේවා කටයුතු සඳහා අවශ්‍ය ගොඩබිම් සහයක සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යන බවට තහවුරු කිරීම.
	අරමුණ 1.10 බිම් සංචලනය අඛණ්ඩව පවත්වාගෙන යන බවට තහවුරු කිරීම.
ඉලක්කය 02 **අනන්‍ය ආර්ථික කළාපය ද ඇතුළුව ශ්‍රී ලංකා භූමිය තුළ උපායමාර්ගික හා උපායශීලි ගුවන් නිරීක්ෂණ හා සෝදිසි හැකියාවන් වර්ධනය කිරීම.**	**අරමුණ 2.1** රේඩාර් ආවරණයේ හිඩැස් පියවීම සඳහා උපායමාර්ගික වශයෙන් වැදගත් ස්ථානවල අමතර රේඩාර් ඒකක පිහිටුවා දැනට පවතින රේඩාර් ආවරණය තවදුරටත් පුළුල් කිරීම.
	අරමුණ 2.2 අනන්‍ය ආර්ථික කළාපය ද ඇතුළුව ශ්‍රී ලංකා භූමිය තුළ දිවා/ රාත්‍රී හා සියලුම කාලගුණික තත්ත්වයන් යටතේ ක්‍රියාත්මක කළ හැකි සමුද්‍රීය ආවේක්ෂණ හැකියාවන් අත්පත් කර ගැනීම.
	අරමුණ 2.3 ආවේක්ෂණ හා නිරීක්ෂණ කාර්යයන්ට සහය වීම සඳහා නියමුවන් රහිත ගුවන්යානා අත්පත් කරගැනීම/ දේශීයව නිෂ්පාදනය කිරීම.
	අරමුණ 2.4 දත්ත කළමනාකරණය/ තත්කාලීන තොරතුරු සැපයීමට සාපේක්ෂව BMC සහ ගුවන් ආරක්ෂණ අණ සහ පාලන මධ්‍යස්ථානවල ශක්‍යතා මට්ටම් ඉහළ නැංවීම.
ඉලක්කය 03	**අරමුණ 3.1** ගුවන හා ගොඩබිම පාදක කරගත් ඉලෙක්ට්‍රොනික යුධ පද්ධති (EW Suite) අත්පත් කරගැනීම.

උපාය මාර්ගික ඉලක්ක	උපාය මාර්ගික අරමුණු
ඉලෙක්ට්‍රොනික යුධ කටයුතු පිළිබඳ ඒකකය පිහිටුවීම හා ජාල කේන්ද්‍රීය යුධ මෙහෙයුම් හඳුන්වා දීම.	**අරමුණ 3.2** මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හා සහෝදර සේවාවන්වල ගොඩබිම් හා ගුවන් සංවේදක ඒකාබද්ධ කිරීම.
	අරමුණ 3.3 ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඉලෙක්ට්‍රොනික යුධ කටයුතු සම්බන්ධ ක්‍රියාකාරකම්වල සමස්ත සම්බන්ධීකරණය සඳහා ඉලෙක්ට්‍රොනික යුධ කටයුතු කළමනාකරණය කිරීමේ ඒකකයක් පිහිටුවීම.
ඉලක්කය 04 **අත්‍යවශ්‍ය ගුවන් වත්කම්, ස්ථාපිතයන් සඳහා පුළුල් පිරිස් ආරක්ෂාවක් ලබා දීම හා VAs හා VPs සඳහා ආරක්ෂාව සැපයීම.**	**අරමුණ 4.1** ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන්/ ගොඩබිම් වත්කම් සහ ගුවන් හමුදාව තුළ හා ඉන් පිටත VAs හා VPs සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ දැනුම්දීම පරිදි ස්ථිරීය ආරක්ෂාව සැලසීම හරහා ගොඩබිම් ආරක්ෂණ හැකියාවන් වර්ධනය කිරීම.
	අරමුණ 4.2 වැදගත් ගුවන් වත්කම් හා ස්ථාපිතයන් සඳහා ගොඩබිම් පාදක කරගත් ගුවන් ආරක්ෂණ පද්ධති හරහා පුළුල් ගොඩබිම් පිරිස් බල ආරක්ෂාවක් ලබා දීම.
ඉලක්කය 05 **දිවා/රාත්‍රී/සියලුම කාලගුණික තත්ත්වවලදී මෙහෙයුම් අතිරික්තතාව අත්කර ගැනීම හා ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ධාවන පථ සංවර්ධනය කිරීම.**	**අරමුණ 5.1** වැදගත් ගුවන් වත්කම් හා ස්ථාපිතයන් සඳහා ගොඩබිම් පාදක කරගත් ගුවන් ආරක්ෂණ පද්ධති හරහා පුළුල් ගොඩබිම් පිරිස් බල ආරක්ෂාවක් ලබා දීම.
	අරමුණ 5.2 ගුවන් ගමන් සඳහා වන ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ධාවන පථවල පියාසර කිරීමේදී අවශ්‍ය සහයන්, ගොඩබෑමේදී අවශ්‍ය සහයන්, ගිනි නිවීමේ කටයුතු, ගුවන් ගමන් පාලනය සහ ගොඩබිම් සහායක පහසුකම් සංවර්ධනය කිරීම.
	අරමුණ. 5.3 අදාළ ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් ධාවන පථ වල පිහිටි ගෘහස්ථ ගුවන් ධාවන පථ නඩත්තු කිරීමේ පහසුකම් වැඩිදියුණු කිරීම.
ඉලක්කය 06 **මිත්‍ර හමුදාවන් හට සයිබර් අවකාශය භාවිතයේ දී නිදහස තහවුරු කිරීම හා සතුරු පාර්ශවයන් හට එය භාවිතය/ අයථා භාවිතය ප්‍රතික්ෂේප කරමින් සයිබර් අවකාශය උපරිම අයුරින් භාවිතයට ගැනීම.**	**අරමුණ. 6.1** සයිබර් ප්‍රහාරයන් සමඟ සටන් කිරීමට හා සයිබර් අවකාශය උපයෝජනය කිරීමට ඇති නිපුණත්වය වැඩි කිරීම.
	අරමුණ. 6.2 ශ්‍රී ලංකා ගුවන් හමුදා සයිබර් ජාලය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය සයිබර් ආරක්ෂණ ක්‍රමවේද වැඩිදියුණු කිරීම හා දැනට පවතින තොරතුරු තාක්ෂණ සේවාවන්වල විශ්වාසනීයත්වය වැඩි කිරීම මඟින් අවසර නොලත් සයිබර් පිවිසුම් වලක්වා ගැනීම.
	අරමුණ. 6.3 ශ්‍රී ලංකා ගුවන් හමුදා සයිබර් යුධ කටයුතු සඳහා වන හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා සයිබර් යුධ කටයුතු සඳහා වන යටිතල පහසුකම් හා විධාන ව්‍යුහය පුළුල් කිරීම.
ඉලක්කය 07 **අමතර සුභසාධන කටයුතු ඇති කිරීම මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව තුළ ප්‍රවාසතාව අවම කිරීම හා ඉහළ චිත්ත ධෛර්යයක් පවත්වාගෙන යාම.**	**අරමුණ. 7.1** ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයින්, ඔවුන්ගේ පවුලේ ළඟම සාමාජිකයින් හා විශ්‍රාමික සේවා පුද්ගලයින් සඳහා ආර්ථික හා සමාජීය රැකවරණයක් ලබා දීමේ ක්‍රියාවලියක් ඇති කිරීම.
	අරමුණ. 7.2 නව සංකල්පයන්, ක්‍රියාවලින් හා පද්ධතීන් හඳුන්වා දීම තුළින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පරිපාලන, නීති හා සැපයුම් පද්ධති වැඩිදියුණු කිරීම.
	අරමුණ. 7.3 වෛද්‍ය සේවාවන් හා පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම හරහා ශ්‍රී ලංකා ගුවන් හමුදා සේවා පුද්ගලයින් හා ඔවුන්ගේ පවුලේ ළඟම සාමාජිකයින් සඳහා වෛද්‍ය සේවාවන් ලබා දීම ඉහළ නැංවීම.
	අරමුණ. 7.4 ගෝලීය වශයෙන් සම්මත ප්‍රමිතීන්ට සමානව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වෘත්තීමය නිපුණතාවයන් ඉහළ නැංවීම.
ඉලක්කය 08	**අරමුණ. 8.1** රජය විසින් ඉල්ලා සිටින කිසියම් විටකදී ජාතිය ගොඩනැඟීමේ වැඩසටහන් සඳහා ක්‍රියාකාරී දායකත්වය ලබා දීම.

උපාය මාර්ගික ඉලක්ක	උපාය මාර්ගික අරමුණු
ජාතික අවශ්‍යතාවයට සහය වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු සම්පත් ප්‍රශස්තිකරණය.	**අරමුණ. 8.2** එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් වල ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ භූමිකාව වැඩිදියුණු කිරීම.
	අරමුණ. 8.3 පෞද්ගලික ගුවන් ගමන් මෙහෙය වන්නන් දිරිමත් කිරීමේ අරමුණින් වාණිජ මගී ගුවන් ගමන් මෙහෙයුම් වල අඛණ්ඩව නිරත වීම.
	අරමුණ. 8.4 ස්වභාවික විපත් අවම කිරීමට හා සිවිල් ප්‍රජාව උදෙසා ආධාර වීමට ගොඩබිම් සංචලතාව ඉහළ නැංවීම.
	අරමුණ. 8.5 රජය විසින් ඉල්ලා සිටින කිසියම් විටකදී රසායනික, ජීව විද්‍යාත්මක, විකිරණශීලී, න්‍යෂ්ටික, සය පුපුරන ද්‍රව්‍ය (CBRNE) මඟින් ඇතිවන තර්ජන වලට එරෙහිව ක්‍රියාකාරී ලෙස සහභාගි වීම.
	අරමුණ. 8.6 සම්ප්‍රදායික නොවන ආරක්ෂක තර්ජන වලට එරෙහිව රජය විසින් ඉල්ලා සිටින කිසියම් විටකදී රජයට සහය වීම සඳහා ක්‍රියාකාරී සහභාගිත්වය.
<u>ඉලක්කය 09</u> **කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා වෘත්තීමය දක්ෂතා වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ දැනට ක්‍රියාත්මක පුහුණු වැඩසටහන් පද්ධතිය හා එහි ක්‍රියාවලියන් සමාලෝචනය කිරීම.**	**අරමුණ. 9.1** සමාලෝචනය කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම හා අවශ්‍ය වෙනස්කම් ක්‍රියාවට නැංවීම.
	අරමුණ. 9.2 ජාතික හා ගෝලීය වශයෙන් පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පුහුණු වැඩසටහන් ප්‍රමිතිකරණය කිරීම.
<u>ඉලක්කය 10</u> **නව තාක්ෂණය හඳුන්වාදීම හා බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම මඟින් ශ්‍රී ලංකා ගුවන් හමුදා බලකා ව්‍යුහය නිරවද්‍ය ප්‍රමාණයට ගෙන ඒම.**	**අරමුණ. 10.1** ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ආයතනික ඉලක්ක හා අරමුණු සඵලදායිව ලගා කර ගැනීම සඳහා එහි මානව සම්පත නිවැරදි ප්‍රමාණයේ රඳවා ගැනීම.
	අරමුණ. 10.2 අනාගතයේදී නිවැරදි ප්‍රමාණයේ මානව සම්පතක් හිමි ආයතනයක් ගොඩ නැගීම සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලියන් සැලසුම් කිරීම.
<u>ඉලක්කය 11</u> **නවීන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හරහා ශ්‍රීලංගුහ තත්ත්වය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.**	**අරමුණ. 11.1** තත්කාලීන ඉලක්ක වර්ගීකරණ සහ හඳුනාගැනීමේ ශක්‍යතාවයන් සඳහා ආවේක්ෂණ සහ සෝදිසි හැකියාවන් වැඩි දියුණුව.
	අරමුණ 11.2 ක්‍රියාකාරී තීරණ (C2 සහ කළමනාකරණ සේවා, බුද්ධි සහ ආවේක්ෂණ, maneuver services, ප්‍රවර්ථන සේවා, පුද්ගල සේවා සහ ඉදිකිරීම් සේවා) සහ තොරතුරු අත්‍යවශ්‍ය සේවා (ආරක්ෂක ක්‍රමයන්, GI සේවා, තොරතුරු කළමනාකරණය, තොරතුරු ආරක්ෂාව, තොරතුරු හුවමාරුව, සහායක සේවා සහ සේවා කළමනාකරණය) අතර මුහුණත සීමාවන් වර්ධනය කිරීම.
	අරමුණ 11.3 හමුදා මෙහෙයුම් සහ සන්නිවේදන අරමුණු සඳහා උපාය මාර්ගික තොරතුරු කළමනාකරණ වේදිකාවක් ඇති කිරීම.

3. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

එසිඒ-එල්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	2021 රු.	
	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
100,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	14,591,537	10,574,308	
100,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		**14,591,537**	**10,574,308**	
	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අඹුම		36,887,567,000	39,161,497,000	එසිඒ-3
-	කැන්පතු		33,984,559	49,491,164	එසිඒ-4
320,000,000	අත්තිකාරම් ගිණුම්		313,978,254	316,009,728	එසිඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
320,000,000	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**37,235,529,813**	**39,526,997,892**	
420,000,000	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**37,250,121,350**	**39,537,572,200**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		31	2,810,324,026	
420,000,000	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**37,250,121,319**	**36,727,248,174**	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
32,216,160,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	30,926,058,286	29,322,342,568	
10,513,200,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	6,439,889,649	6,195,787,813	එසිඒ-2(ii)
118,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	68,557,245	112,452,856	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
42,847,360,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**37,434,505,180**	**35,630,583,238**	
	මූලධන වියදම්				
6,752,290,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	3,433,365,915	4,154,965,013	
4,307,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	785,281,868	1,265,628,114	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
500,000,000	හැකියා වර්ධනය	14	275,425,355	279,410,449	
713,000,000	වෙනත් මූලධන වියදම්	15	87,874,045	406,884,548	
12,272,290,000	**මුළු මූලධන වියදම් (උ)**		**4,581,947,183**	**6,106,888,124**	
	කැන්පතු ගෙවීම්		44,988,818	62,313,545	එසිඒ-4
400,000,000	අත්තිකාරම් ගෙවීම්		229,442,050	349,775,530	එසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
400,000,000	**ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)**		**274,430,868**	**412,089,075**	
55,519,650,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		42,290,883,231	42,149,560,437	
(55,099,650,000)	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(5,040,761,913)**	**(5,422,312,263)**	
	අඹුම් සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(5,040,761,913)	(5,422,312,263)	එසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අඹුම් ශේෂය		-	-	එසිඒ-3
			(5,040,761,913)	(5,422,312,263)	

1

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	116,796,997,161	116,426,145,442
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	217,066,523	301,602,727
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**117,014,063,684**	**116,727,748,169**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		132,975,439	206,507,384
දේපළ පිරියත හා උපකරණ සංචිතය		116,796,997,161	116,426,145,442
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	84,091,084	95,095,343
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**117,014,063,684**	**116,727,748,169**

පිටු අංක 01 සිට 61 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 62 සිට 97 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
ලේකම්	ගුවන් හමුදාධිපති	අධ්‍යක්ෂ (මුදල්)
ආරක්ෂක අමාත්‍යාංශය	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	ශ්‍රී ලංකා ගුවන් හමුදාව
දිනය : 21/02/2023	දිනය : 21-02-2023	දිනය : 21/02/2023
පෙනිපල් කමල් ගුණරත්න (විශ්‍රාමික) ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩයි පීඑස්සී එමෙලිල් ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ	එස් කේ පතිරණ එයාර් මාර්ෂල් ගුවන් හමුදාධිපති	එච්. ඩී. යූ. ජයලත් අධ්‍යක්ෂ (මුදල්) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය ශ්‍රී ලංකා ගුවන් හමුදාව

2

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒඑසී-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	14,591,537	10,574,308
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	3,270,441,883	4,683,480,928
අග්‍රිම ලැබීම්	36,887,567,000	39,161,497,000
අත්තිකාරම් අයකර ගැනීම්	312,132,406	313,460,593
තැන්පතු ලැබීම්	33,984,559	49,491,164
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	40,518,717,384	44,218,503,993
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	38,872,402,171	38,892,101,321
සහනාධාර සහ මාරුකිරීම්	-	-
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	809,537,609	909,508,455
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්	31	2,810,324,026
අත්තිකාරම් ගෙවීම්	227,988,366	347,877,131
තැන්පතු ගෙවීම්	44,988,818	62,313,545
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	39,954,916,996	43,022,124,477
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	563,800,388	1,196,379,516
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	11,001,344	13,363,145
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	989,698	8,065,092
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	11,991,041	21,428,237
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	575,791,429	1,217,811,753
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	575,791,429	1,217,811,753
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(563,800,388)	(1,196,383,516)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(0)	(4,000)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඒ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(එ)-(ඒ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	(4,000)
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	4,000
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය තත්ත්වය පිළිබඳ සාරාංශ විශ්ලේෂණය

අ. මූල්‍ය සමාලෝචනය

ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත 2022 වර්ෂයේ මුළු ආරක්ෂක වියදම් වෙනුවෙන් ලං.රු.මි 55,119.65 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් ආරම්භයේදීම ලැබී ඇත. අතිරේක මෙහෙයුම් වියදම් සඳහා ලං.රු.මි 116.06 ක අතිරේක ප්‍රතිපාදන ලබාදී ඇත. ඒ අනුව 2022 වර්ෂය සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදන ප්‍රමාණය ලං.රු.මි 55,235.71 කි. වර්ෂය සඳහා මුළු තත්‍ය ආරක්ෂක වියදම වුයේ ලං.රු.මි 42,016.45 කි. මෙය නියෝජනය වන්නේ ලං.රු.මි 37,434.51 පුනරාවර්තන වියදම් ලෙස හා ලං.රු.මි 4,581.95 ක් මූලධන වියදම් ලෙසයි. කෙසේ නමුත්, මුළු ශුද්ධ ප්‍රතිපාදනය 3.33% කින් අඩු වී ඇති අතර 2021 වර්ෂය සමඟ සැසඳීමේදී තත්‍ය වියදම ප්‍රතිශතයක් ලෙස 0.67% කින් වැඩි වී ඇත. එසේ වුවත් 2022 වර්ෂයේ සමස්ත ආරක්ෂක වියදම පාර්ලිමේන්තුවෙන් අනුමත මුළු ප්‍රතිපාදන තුළ පැවති අතර මුදල් අමාත්‍යාංශයේ මුළු පාලන වියදම් තුළද පැවතුනි.

පසුගිය වර්ෂයට එරෙහිව සමස්ත ආරක්ෂක වියදම සංසන්දනය කිරීම

මුළු ආරක්ෂක වියදම	වර්ෂය 2022	වර්ෂය 2021	විචල්‍යතාව
මුළු ශුද්ධ ප්‍රතිපාදන	55,235.71	57,140.85	(1,905.14)
මුළු වියදම	42,016.45	41,737.47	278.98

වගුව - 1



රූප සටහන - 1

ආ. මූල්‍ය කාර්ය සාධනය

2022 වර්ෂයේදී ශ්‍රීලංකා ගුවන් හමුදාවේ සමස්ත එකතුකළ ආදායම ලං.රු.මි 37,250.12 කි. මෙයට ආදායම් ලැබීම් ලෙස ලං.රු.මි 14.60 ක් සහ ආදායම් නොවන ලැබීම් ලෙස ලං.රු.මි 37,235.52 ක් ඇතුළත්ය. 2021 වර්ෂය හා සැසඳීමේදී සමස්ත එකතු කළ ආදායම ප්‍රතිශතයක් ලෙස 5.79% කින් අඩුවී ඇත.

පසුගිය වර්ෂයට එරෙහිව සමස්ත එකතුකළ ආදායම

ආදායම	වර්ෂය 2022	වර්ෂය 2021	විචල්‍යතාව
සමස්ත එකතුකළ ආදායම	37,250.12	39,537.57	(2,287.45)

වගුව - 2



රූප සටහන - 2

(1) ආදායම් ලැබීම්

2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හුදු ආදායම් ලැබීම් වන්නේ බදු නොවන ආදායම් හා වෙනත් ආදායම්ය. ගුවන්යානා කුලී ගාස්තු පමණක් බදු නොවන ආදායම් වලට ඇතුළත් වන අතර 2022 වර්ෂය ආරම්භයේදී එය ලං.රු.මි. 100.00 ක් ලෙස මුලිකවම ඇස්තමේන්තු කර තිබුණි. කෙසේ නමුත් 2022 වර්ෂය තුළදී ඇස්තමේන්තුගත වටිනාකම ලං.රු.මි. 15.00 ලෙස සංශෝධනය කර ඇත. හිඟ ආදායම් ද ඇතුළුව එකතු කළ සමස්ත ගුවන්යානා කුලී ආදායම ලං.රු.මි 14.59 ක් බවට සටහන් විය.

පුරෝකථනය කළ ආදායමට එරෙහිව තත්‍ය ආදායම

ආදායම් කේතය	2022 වර්ෂය සඳහා සංශෝධිත අයවැය ගත ආදායම (ලං.රු.මි)	2022 වර්ෂයේ තත්‍ය ආදායම (ලං.රු.මි)	වෙනස (ලං.රු.මි)
20-03-02-16	15.00	14.59	0.41

වගුව - 3



රූප සටහන - 3

(2) ආදායම් නොවන ලැබීම්

2022 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ලැබීම් බහුතරයක් ආදායම් නොවන ලැබීම් වන අතර එහි එකතුව ලං.රු.මි 37,235.53 එය 2021 වර්ෂය හා සැසඳීමේදී ලං.රු.මි 2,291.47 කින් අඩු වී ඇත. ආදායම් නොවන ලැබීම් ලෙස භාණ්ඩාගාර අග්‍රිම, තැන්පතු, අත්තිකාරම් ගිණුම ලෙස පිළිවෙලින් ලං.රු.මි 36,887.57, ලං.රු.මි 33.98, ලං.රු.මි 313.98 ඇත.

(3) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වියදම්

2022 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමස්ත වියදම ලං.රු.මි 42,290.88 (ප්‍රධාන ලෙජර් වියදම් ද ඇතුළුව) වන අතර එයින් ලං.රු.මි 37,434.51 පුනරාවර්තන වියදම් ලෙසත්, ලං.රු.මි 4,581.95 ක් මූලධන වියදම් ලෙසත් සහ ලං.රු.මි. 274.43 ක් ප්‍රධාන ලෙජර් වියදම් ලෙසත් වියදම් දරා ඇත. ඒ අනුව පෙර වර්ෂය හා සැසඳීමේදී 2022 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමස්ත වියදම 0.34% කින් වැඩි වී ඇත.

පවත්නා වර්ෂයේ සහ පෙර වර්ෂයේ මුළු වියදම (ප්‍රධාන ලෙජර් වියදම් ද ඇතුළුව)

වියදම	2022 වර්ෂය	2021 වර්ෂය	විචල්‍යතාව
තත්‍ය වියදම	42,290.88	42,149.56	141.32

වගුව - 4



රූපසටහන - 4

(4) පුනරාවර්තන වියදම්

2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පුනරාවර්තන වියදම් ලෙස ලං.රු.මි 42,847.36 ක මුදලක් වෙන් කර තිබෙන අතර ඊට පුද්ගල වැටුප් ලෙස ලං.රු.මි 32,216.16 ක් හා අනෙකුත් පුනරාවර්තන වියදම් ලෙස ලං.රු.මි 10,631.20 ක් ඇතුළත්ය. 2022 වර්ෂය තුළ අතිරේක ප්‍රතිපාදන ලෙස ලං.රු.මි 116.06 ලබාදී තිබෙන අතර ඒ අනුව මුළු ශුද්ධ ප්‍රතිපාදනය ලං.රු.මි 42,963.42 ක් වන අතර තත්‍ය වියදම ලං.රු.මි 37,434.51 කි. රජයේ ප්‍රතිපාදන මඟින් මුළු ඇස්තමේන්තුව සඳහා අරමුදල් සැපයීමට අපේක්ෂා කර ඇත. භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ මුළු ඇස්තමේන්තුගත වියදම පහත සඳහන් වියදම් අයිතමයන් සඳහා වේ.

	ලං.රු.මි
පුද්ගල වේතන	32,216.16
වෙනත් පුනරාවර්තන වියදම්	10,631.20
අතිරේක ප්‍රතිපාදනය	116.06
සංශෝධිත පුනරාවර්තන ප්‍රතිපාදනය	**42,963.42**

පවත්නා වර්ෂයේ සහ පෙර වර්ෂයේ පුනරාවර්තන වියදම්

පුනරාවර්තන වියදම්	2022 වර්ෂය සඳහා	2021 වර්ෂය සඳහා	විචල්‍යතාව
සමස්ත ශුද්ධ ප්‍රතිපාදනය	42,963.42	39,618.10	3,345.32
සමස්ත වියදම	37,434.51	35,630.58	1,803.93

වගුව - 5



රූප සටහන - 5

(5) ප්‍රාග්ධන වියදම්

(අ) අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සහ සේවා පුද්ගලයින්ගේ හා සිවිල් සේවක මණ්ඩලයේ හැකියාව වර්ධනය යනාදිය සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස ලං.රු.මි 12,272.29 ක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ලැබී ඇත. 2021 වර්ෂය සමඟ සැසඳීමේදී 2022 වර්ෂයේ සමස්ත ශුද්ධ ප්‍රතිපාදනය 29.96% කින් පහළ ගොස් ඇත.

පවත්නා වර්ෂයේ සහ පෙර වර්ෂයේ ප්‍රාග්ධන වියදම්

ප්‍රාග්ධන වියදම	2022 වර්ෂය සඳහා	2021 වර්ෂය සඳහා	විචල්‍යතාව
සමස්ත ශුද්ධ ප්‍රතිපාදනය	12,272.29	17,522.75	(5,250.46)
සමස්ත වියදම	4,581.95	6,106.89	(1,524.94)

වගුව - 6



රූප සටහන - 6

(ආ) තවද, 2022 වර්ෂයේ තත්‍ය වියදම ලං.රු.මි. 4,581.95 ක් වන අතර එය 2021 වර්ෂය හා සැසඳීමේදී 24.97% ක පහළ යාමකි.

(ඇ) ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාව මෙම වර්ෂය තුළ ස්ථාවර වත්කම් නඩත්තු කිරීමේ සහ ඒවායේ නිසි ක්‍රියාකාරිත්වය අරමුණු කොට ගෙන ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා ලං.රු.මි 6,752.29 ක මුදලක් ආරම්භයේදී පුරෝකථනය කර ඇත. 2022 වර්ෂයේ තත්‍ය වියදම ලං.රු.මි 3,433.37 කි.

(ඈ) ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ප්‍රධාන වශයෙන්ම වාහනවල ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ හා බඩු භාණ්ඩ සපයා ගැනීම හා බර යන්ත්‍රෝපකරණ අත්පත් කර ගැනීම හා ගොඩනැගිලි ඉදිකිරීම් වැනි ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා ආරම්භයේදී ලං.රු.මි 4,307.00 ක වටිනාකමින් යුත් ප්‍රතිපාදන සලසා දී තිබුණි. 2022 වර්ෂයේ තත්‍ය වියදම ලං.රු.මි 785.28

(ඉ) හැකියා වර්ධනය

මූලධන වියදම් යටතේ, ශ්‍රී ලංකා ගුවන් හමුදාව හැකියා වර්ධනය සඳහා ලං.රු.මි 500.00 ක මුදලක් ආරම්භයේදී පුරෝකථනය කර ඇත. 2022 වර්ෂය තුළ තත්‍ය වියදම ලං.රු.මි. 275.43 කි.

(ඊ) වෙනත් ප්‍රාග්ධන වියදම්

ප්‍රාග්ධන වියදම් යටතේ, ලං.රු.මි 713.00ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයට සාපේක්ෂව වෙනත් ප්‍රාග්ධන වියදම් ලෙස ලං.රු.මි 87.87 මුදලක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වියදම් දරා ඇත.

(උ) වියදම් වර්ග කිරීම් යටතේ ප්‍රතිපාදනවලට එරෙහිව පුනරාවර්තන වියදම්

කාර්ය විස්තරය	ශුද්ධ ප්‍රතිපාදනය (ලං.රු.මි)	වියදම (ලං.රු.මි)	වෙනස
පුද්ගල චේතන	32,230.16	30,926.06	1,304.10
වෙනත් පුනරාවර්තන	10,733.26	6,508.45	4,224.81
එකතුව	**42,963.42**	**37,434.51**	**5,528.91**

වගුව - 7



රූප සටහන - 7

(ඌ) වාර්ෂික විසර්ජන ගිණුම්වලට අදාළව ප්‍රාග්ධන වියදම් වර්ග යටතේ ප්‍රතිපාදනවලට (එක් එක් වැය විෂය යටතේ) එරෙහිව වියදම් දැරීම.

වැය විෂය	කාර්ය විස්තරය	ශුද්ධ ප්‍රතිපාදන (ලං.රු.මි)	වියදම (ලං.රු.මි)	වෙනස (ලං.රු.මි)
	ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම			
2001	ගොඩනැඟිලි හා ඉදිකිරීම්	130.00	62.72	67.28
2002	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	6,462.29	3,286.27	3,176.02
2003	වාහන	160.00	84.37	75.63
	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම			
2101	වාහන	2,206.00	145.14	2,060.86
2102	ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ	61.00	36.30	24.70
2103	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	1,854.00	491.57	1,362.43
2104	ගොඩනැඟිලි හා ඉදිකිරීම්	186.00	112.27	73.73
	හැකියා වර්ධනය			

2401	කාර්ය මණ්ඩල පුහුණුව	500.00	275.43	224.57
	වෙනත් ප්‍රාග්ධන වියදම්			
2509	වෙනත්	713.00	87.88	625.12
එකතුව		**12,272.29**	**4,581.95**	**7,690.34**

වගුව - 8



රූප සටහන - 8

(එ) අත්තිකාරම් "බී" ගිණුම සම්බන්ධයෙන් නියම කළ සීමාවන්ට එරෙහිව තත්‍ය සීමාවන්

රාජ්‍ය නිලධාරීන්ට ණය ප්‍රදානය කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව එක් අත්තිකාරම් ගිණුමක් ඇත. 2022 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාව අත්තිකාරම් ගිණුමේ නියමිත සීමාවන්ට අනුකූලව කටයුතු කර ඇති අතර මෙම ගිණුමේ මෙහෙයුම් පහත පරිදිය.

විස්තරය	පවත්නා වර්ෂයේදී නිර්දේශිත සීමාවන් (ලං.රු.මි)	පවත්නා වර්ෂයේ තත්‍ය වියදම (ලං.රු.මි)	වෙනස (ලං.රු.මි)
අංක:22401 අත්තිකාරම් "බී" ගිණුම			
උපරිම වියදම් සීමාව	400.00	227.99	172.01
අවම ලැබීම් සීමාව	310.00	312.13	(2.13)
උපරිම හර සීමාව	400.00	217.07	182.93

වගුව - 9



රූප සටහන - 9

(ඒ) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ප්‍රකාශන

2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ප්‍රකාශන, ගිණුම් නිලධාරී හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පිළිවෙලින් 2023 පෙබරවාරි 21 හා 27 දිනවලදී අනුමත කරන ලදී.

3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි **01** සිට දෙසැම්බර් **31** දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් **31** දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය



2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

ආදායම් ගණන් දීමේ නිලධාරී : ගුවන් හමුදාධිපති
විෂයභාර ශීර්ෂ අංකය : 224

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	සටහන	ආදායම් ඇස්තමේන්තුව (1)		ආදායම් ලැබීම් (2)			(3)	ආදායමෙන් අඩුපඩු වෙවීම (4)			(5)
			මූලික ඇස්තමේන්තුව	සංශෝධිත ඇස්තමේන්තුව	අදාළ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුව විසින් ලැබීම්	වෙනත් අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තු විසින් ලැබීම් (SA-21)	එකතුව	ඉහත ආදායම් ලැබීම්	මුදලින්	වැරදි නිවැරදි කිරීම්	එකතුව	ඉද්ධ ආදායම්
			1(i)	1(ii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	(3)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	5=2(iii)+(3)-4(iii)
2003.02.16	ගුවන්යානා කුලී ආදායම්	4	100,000,000	15,000,000	14,604,398	-	14,604,398	-	-	12,862	12,862	14,591,537

වගුව - 10

3.7 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

(ලං.රු.මි)

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද ප්‍රතිපාදනයේ %
	මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
පුනරාවර්තන	42,847.36	42,963.42	37,434.51	87.13%
ප්‍රාග්ධන	12,272.29	12,272.29	4,581.95	37.34%

වගුව - 11

3.8 මුරෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස වියදම් දැරීම සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන (රු.)	තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
01	පාර්ලිමේන්තුව	M 300 RTK ඩ්‍රෝන 02 ක් මිල දී ගැනීම	9,724,000.00	7,000,000.00	71.99%
02	බුද්ධ ශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	දීඝවාපිය රජමහ විහාරය - අම්පාර අඩාලවිච්චිය	5,000,000.00	4,999,402.00	99.99%
03	ආරක්ෂක අමාත්‍යාංශය	ගිනි ආරක්ෂණ ව්‍යාපෘතිය - ආපදා කළමනාකරණ කොට්ඨාශය (ශීර්ෂ අංක 442 මඟින් මාරු කරන ලදි)	161,280.00	161,280.00	100%
		ස්ථානමාරු - සුභසාධන වැඩසටහන් රණවිරු මාපිය සුභසාධන වැඩසටහන	293,118,000.00	290,953,424.00	99.26%
04	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් අමාත්‍යාංශය	සංවර්ධන නිලධාරී සහ අභ්‍යාසලාභී උපාධිධාරී වැටුප	596,310.00	550,025.00	92.24%
		සංවර්ධන නිලධාරී සහ අභ්‍යාසලාභී උපාධිධාරී වැටුප	289,700.00	267,240.00	92.25%
05	ශ්‍රී ලංකා නාවික හමුදා දෙපාර්තමේන්තුව	නාවික හමුදා වාහන සඳහා ඉන්ධන නිකුත් කිරීම	44,500.00	44,500.00	100%
		නාවික හමුදා වාහන සඳහා ඉන්ධන නිකුත් කිරීම	44,500.00	44,500.00	100%
06	කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම්	ආරක්ෂක විද්‍යාලය - කොළඹ	1,580,000.00	-	-

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන (රු.)	තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය				
07	ආපදා කළමනාකරණ කොට්ඨාශය - ආරක්ෂක අමාත්‍යාංශය	ගිනි ආරක්ෂණ ව්‍යාපෘතිය - ආපදා කළමනාකරණ කොට්ඨාශය (ශීර්ෂ අංක 103 මඟින් මාරු කරන ලදි)	182,275.00	-	-
08	වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා, දුම්රිය මැදිරි සහ මෝටර් රථ කර්මාන්තය පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය	පුනරාවර්තන මාරුකිරීම් (නිවාඩු දුම්රිය බලපත්‍ර - ශීර්ෂ අංක 117 මඟින් මාරු කරන ලදි)	33,000,000.00	-	-
09	ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය	පුනරාවර්තන මාරුකිරීම් (නිවාඩු දුම්රිය බලපත්‍ර - ශීර්ෂ අංක 117 මඟින් මාරු කරන ලදි)	33,000,000.00	22,262,943.00	67.46%
10	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	මාරුවීම් - සුභසාධන වැඩසටහන් (මියගිය, ආබාධිත අය සඳහා දීමනාව)	473,650,000.00	459,207,846.00	96.95%
		මාරුවීම්- සුභසාධන වැඩසටහන් (පාරිතෝෂිකය)	24,046,449.50	24,046,450.00	100%

වගුව - 12

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

(ලං.රු.මි)

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ඉදිකිරීම්	භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකරමින් පවතී	14,829.93	නැත	100%
9152	යන්ත්‍රෝපකරණ		63,977.81	නැත	100%
9153	ඉඩම්		37,360.46	නැත	100%
9154	අස්පෘශ්‍ය වත්කම්		-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්		-	-	-
9160	කෙරීගෙන යන වැඩ		628.79	නැත	100%
9180	බදු දෙන ලද වත්කම්		-	-	-

වගුව - 13

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සීඊඑන්/සී/එස්එල්ඒඑන් /22/25 මඟෙ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 26 දින

ගුවන් හමුදාධිපති
ශ්‍රී ලංකා ගුවන් හමුදාව

ශීර්ෂය 224 - ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 224 -ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
2021 154(6) වාර්තාව 1.5 (ආ)	2011නොවැම්බර් 30 දිනැති අංක 852 දරන ගුවන් හමුදා නියෝගයේ අංක 5 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, විවිධ කඳවුරු හා ඒකකවල අභ්‍යන්තර අරමුදල් ආරම්භ කර තිබුණි.මෙම අරමුදල්වල මෙහෙයුම් කටයුතු සඳහා සහ අරමුදල් මගින් මෙහෙයවනු ලබන ලාභ උපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන තිබුණි .මුදල් රෙගුලාසි 154 අනුව මෙම අභ්‍යන්තර අරමුදල්, ව්‍යවස්ථාපිත අරමුදල් වශයෙන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් ඒවායේ කටයුතු මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පාලනයට යටත් නොවී පැවති බවද තවදුරටත් නිරීක්ෂණය විය.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි සහ 2016 ජූනි 24 දින පැවැත්වූ රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීමේ නියෝග ප්‍රකාර ලාභ උපයන ව්‍යාපෘති වල මෙහෙයුම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අධීක්ෂණ කටයුතු විධිමත් කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම අවශ්‍ය වේ.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

මු.රෙ.66/69 මාරු කිරීම් යටතේ පාකිස්ථාන ණය යෝජනා ක්‍රමය යටතේ යුධ ටැංකි (APC-15) මිලදී ගැනීමට ලද ප්‍රතිපාදන වලින් රු.15,795,903 ක් ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ රේඩාර් පද්ධතියට අමතර කොටස් මිලදී ගැනීම සඳහා යොදා ගෙන තිබුණි.

1.6.2 අත්තිකාරම් ගෙවීම්

ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් පරිදි රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ඩී ගිණුමට අදාල ණය මුදල් ගෙවා අවසන් කිරීමට පෙර විශ්‍රාම ගිය /මිය ගිය/සේවය හැර ගිය නිලධාරීන්ගේ අත්තිකාරම් ණය ශේෂ අයකර ගත නොහැකි අවස්ථා වලදී ඇපකරුවන්ගෙන් හෝ උරුමක්කාරයින්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කල යුතු වුවත්, එම නියමයන්ගෙන් බැහැරව නිළධාරීන් 207 කගේ වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟ හිටි ණය ශේෂය රු.8,267,831 ක් විය.

1.6.3 මූල්‍ය නොවන වත්කම්

මු.රෙ.109 යටතේ ගුවන් යානා 03 ක අලාභහානි කපා හැරීමට අනුමත වටිනාකම රු.453,434,468 ක් වුවත් කපා හරින ලද වටිනාකම රු.368,179,200 ක්වූ බැවින් රු.85,255,268 කින් අඩුවෙන් කපා හැර තිබුණි. එසේම තවත් ගුවන් යානාවක හානි පාඩු යටතේ කපා හැරීමට අනුමත වටිනාකම රු. 132,614,647ක් වුවද කපාහරින ලද වටිනාකම රු. 147,387,349 ක්වූ බැවින් රු.14,772,702 ක් වැඩියෙන් කපා හැර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 85 (1) (ඇ) ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාක් තාත්විකව හා නිවැරදි ලෙස ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට ගණන්දීමේ නිලධාරීන් කටයුතු කල යුතු වුවත්, ආදායම් ශීර්ෂ 20.03.02.16 - ගුවන්යානා කුලී ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයේ මෙන්ම ඉකුත් වර්ෂ 06 ක් තුල ආදායම් ඇස්තමේතුවෙන් සියයට 33 සිට සියයට 91 දක්වා අවකරණය කර සංශෝධනය කර තිබුණි.එමෙන්ම 2016 වර්ෂයට සාපේක්ෂකව සියයට 24 ත් සියයට 94 ත් ලෙස ආදායම් ඉපැයීම අභිතකර අවකරණයකින් යුතුව විචලනය වී පැවතුණි.

(ආ) මුදල් රෙගුලාසි 128 (2) (ඉ) ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවත්, වර්ෂ 4 ත් 19ත් අතර කාල ප්‍රමාදයකින් යුතුව ගුවන් යානා කුලී හිඟ ආදායම් එකතුව රු.12,674,073 ක් අයකර ගෙන නොතිබුණි. එමෙන්ම හිඟ ආදායම් තුල ඇතුලත් පෞද්ගලික ආයතන 02 කින් ලැබිය යුතු හිඟ මුදල වූ එකතුව රු. 3,612,665 ක් අයකර ගැනීම සදහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමේදී ඒ වෙනුවෙන් සාක්ෂි නොමැති වීම නිසා එම කටයුතු සීමා වී පැවතුණි.

(ඇ) රත්මලාන ගුවන් හමුදා මූලික කඳවුර තුල පවතින ගුවන් හමුදා කෞතුකාගාරයේ 2022 වර්ෂයේ ඉපයූ රු.21,303,078 ක ආදායමින් රජයට අභිමිවූ ආදායම් රු.18,912,131 ක් විය.

2.2 වියදම් කළමනාකරණය

රාජ්‍ය වියදම් පාලනය කිරීම වෙනුවෙන් 2022 අප්‍රේල් 26 දිනැති මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම්ගේ ජාතික අයවැය වක්‍රලේඛ අංක 3/2022 හි 02 ඡේදය ප්‍රකාරව රාජ්‍ය වියදම් පාලනය කිරීමට සියළුම රාජ්‍ය ආයතනයන් දැඩිව ක්‍රියාමාර්ග ගත යුතු බව දන්වා ඇතත් විදේශ අධ්‍යයන චාරිකා හා පුහුණු වෙනුවෙන් වැය ශීර්ෂ 224-1-1-1102 යටතේ රු.8,342,043 ක් වූ වැය දරා තිබුණි. එමෙන්ම වැය ශීර්ෂ 224-1-1-2401 යටතේ විදේශ පුහුණු සංචාර වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ මැයි සිට අගෝස්තු දක්වා රු.31,246,205 ක් වැය කර තිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව	නිරීක්ෂණය
(අ)රාජ්‍ය ගිණුම් දෙපාර්තුමේන්තුවේ 2021 ඔක්තෝබර් 26 දිනැති 2021/02 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 4.5	වාර්තා නොකරන ලද කිසිදු බැඳීමක් හෝ බැරකමක් 2022 වර්ෂය තුළ නිරවුල් නොකල යුතු වුවත් එම නියමයෙන් බැහැරව ඉකුත් වර්ෂයේ බැඳීම් ලේඛණයේ ඇතුළත් කර නොතිබුණු අවස්ථා 04 කට අදාළව එකතුව රු.1,703,403 ක් වූ බැරකම් 2022 වර්ෂයේදී ගෙවා තිබුණි.
(ආ) මුදල් රෙගුලාසි 128 (2) ඒ	රජයේ ආදායම් පිළිබඳව ගණන්දීමේ නිලධාරි විසින්, අවශ්‍යතැන්හි ආර්ථික ක්‍රමයේ හා වෙනත් තත්ත්වයන්ගේ වෙනස්වීම් ගැන සැලකිලිමත්ව බදු ගාස්තු අයකිරීම් සමාලෝචනය කොට ඒවා ප්‍රතිශෝධන කිරීමේ පියවර ගත යුතුය. නමුත් එයින් බැහැරව රත්මලාන මූලික කඳවුර තුල ගොඩනැගිලි 4ක් බදු දීම වෙනුවෙන් අයවූ මුළු බදු කුලී ආදායම රු.1,511,000 කින්, රු.161,200 ක් පමණක් රජයට බැර කර තිබූ අතර මුළු එකතුව රු.1,349,200 ක්වූ ගොඩනැගිලි කුලී ආදායම් රජයට අහිමි වී තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 ප්‍රසම්පාදනයන්

2022 වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදා මොරවැව කඳවුරේ රජයේ ආදායම් වෙනුවෙන් ක්‍රියාත්මක නොවන ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් වන කෘෂිකර්ම ව්‍යාපෘතියක් සඳහා රු.5,290,000 ක් වටිනා ගොයම් කපන යන්ත්‍රයක් රජයේ මුදලින් මිලදී ගෙන තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

(අ) මුදල් රෙගුලාසි 128 (2) (ඊ) අනුව රජය සතු වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් වූ විධිමත් විධිවිධාන යෙදිය යුතු බව ගණන් දීමේ නිලධාරීගේ වගකීම වුවත් එයින් බැහැරව ACA 6 ආකෘතිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව එකතු වටිනාකම රු.53,846,539,763 ක්වූ ගුවන් යානා 110 කින් වර්ෂ 1 සිට වර්ෂ 23ක් දක්වා වූ දීර්ඝ කාලයක සිට මෙහෙයුම් කටයුතුවලින් බැහැරව පැවති ගුවන් යානා ගණන 66 ක් විය.

(ආ) කටුනායක ගුවන් හමුදා මූලික කඳවුර පිහිටි භූමියෙන් අක්කර 96 ක ඉඩම් කොටසක් තුල ආරක්ෂාවට අහිතකර අයුරින් අනවසරව පවුල් 13 ක් පදිංචි වී සිටින අතර මෙම තත්ත්වය නිරවුල් කරගෙන නොතිබුණි.

(ඇ) කටුනායක ගුවන් හමුදා කඳවුරෙහි රථ වාහන අංශය තුල රු.5,016,000 වටිනා ලැන්ඩ් රෝවර් ඩිෆෙන්ඩර් 08 ක් වසර 3 කට අධික කාලයක් අළුත්වැඩියා නිම නොකර පැවතුණි.

(ඈ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කටුනායක, හිඟුරක්ගොඩ, රත්මලාන යන මූලික කඳවුර තුල පැවති විවිධ ගබඩා අංශයන් හි නිල ඇදුම්, ගොඩනැගිලි ද්‍රව්‍ය , විදුලි උපකරණ ඇතුළු භාණ්ඩ වර්ග 31 කට අදාල එකතු වටිනාකම රු.29,209,872 ක් තොග භාවිතයකින් තොරව වසර 01 ත් 09 ත් අතර කාලයක සිට නිෂ්කාර්යව ගබඩා තුල පැවතුණි.

3.3 පාඩු හා හානි

(අ) 2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2022/5 හි 06 ඇමුණුම (1) අනුව ඉදිරිපත් කල යුතු පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය තුල අනාවරණය කල යුතු වුවත්, පාඩු

සිද්ධි 190 කට අදාල මුළු එකතුව රු. 577,625,395 ක් මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) 2022 වර්ෂයට අදාල අවස්ථා 5 කදී එකතු වටිනාකම රු.38,625,367 ක්වූ හානි,පාඩු මු.රෙ.109 යටතේ අලාභයන් කපාහැරීමට අනුමැතිය ලැබී තිබූ නමුත් ඇමුණුම (ii) මු.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනයේ ඇතුලත් කර නොතිබුණි.

3.4 අනාරක්ෂිත ගනුදෙනු

(අ) සාම සාධක හමුදාවට යැවීම සඳහා 2022 අප්‍රේල් 01 දින රු.මිලියන 41.9 ක් ගෙවා ලැන්ඩ් රෝවර් ඩිෆෙන්ඩර් ජීප් රථයක් මිලදී ගෙන තිබුණි. නමුත් 2023 මැයි 19 දින වන විටත් එම ජීප් රථය සාම සාධක හමුදාව වෙත යවා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු පුහුණු ගුවන් යානා බලගනය වර්ධනය සඳහා 2018 ඔක්තොබර් 17 දින රු.මිලියන 946.32 ක් ගෙවා චීනයෙන් මිලදී ගන්නා ලද ප්‍රාථමික පුහුණු ගුවන්යානා 06 කින් එකක් 2020 දෙසැම්බර් 15 දින අනතුරට ලක්වී සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණි.මිලදී ගන්නා ලද ඉතිරි ගුවන් යානා 05 ද එන්ජින් පිරිවැඩියාව ප්‍රමාද වීම හේතුවෙන් වසර 2කට අධික කාලයක් නිස්සේ පුහුණු කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. ඒ අනුව දරණ ලද මුළු වියදම අනාරක්ෂිත වියදමක් වී තිබුණි.

3.5 කළමනාකරණ දුර්වලතා

(අ) සමාලෝචිත වර්ෂයේදී "මෙත් සෙවන" සහ "අපි වෙනුවෙන් අපි" නිවාස ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලද රු.36,572,648ක් රජයේ ගිණුම් වලින් බැහැරවූ ගුවන් හමුදාවේ මධ්‍යම සුභසාධන හා පුනරුත්ථාපන අරමුදල (ලංකා බැංකුව ගි.අ.716731) වෙත බැර කරවාගෙන පසුව ඊට අදාල ප්‍රතිලාභීන් වෙනුවෙන් ගෙවීම් කර තිබුණි.

(ආ) 2008,2011 සහ 2015 වර්ෂ වලදී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් අවස්ථා 04 කදී විදේශයන්වෙත අළුත්වැඩියාවන් සඳහා යවන ලද වටිනාකම USD 46,893 ක්වූ ගුවන් යානා අමතර කොටස් 04 ක් වර්ෂ 7 සිට 14 දක්වා කාලයක් ගත වී තිබුණද ඒවා අළුත්වැඩියා කර ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ රත්මලාන පිහිටි සිවිල් පරිපාලන අධ්‍යක්ෂක කාර්යාලය මගින් පාලනය වන සිවිල් කාර්ය මණ්ඩලයේ තත්‍ය සේවක සංඛ්‍යාව 2385 ක් වුවද, ඊට අදාල පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම සේවකයින්/නිලධාරීන් 2288 කට පමණක් සීමා වී තිබුණි. ඒ අනුව තත්‍ය කාර්ය මණ්ඩලයේ සේවකයින්/නිලධාරීන් 97 ක් වෙනුවෙන් පෞද්ගලික ලිපිගොනු නඩත්තු කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ගුවන් හමුදාවේ අධිකාරීලත් නිලධාරීන් අනුමත සංඛ්‍යාව 2557 ක් වූ අතර ඉන් පුරප්පාඩු 464 ක් පැවතුණි. අධිකාරී නොලත් (සෙසු නිලයන්) නිලධාරීන් අනුමත සංඛ්‍යාව 34,381 ක්වූ අතර ඉන් පුරප්පාඩු 5324 ක් විය.

(ආ) 2022 දෙසැම්බර් 31 දින වන විට සිවිල් කාර්ය මණ්ඩලයේ (ජ්‍යෙෂ්ඨ/ තෘතිය/ද්විතිය/ ප්‍රාථමික) අනුමත සේවක සංඛ්‍යාව 3057 කින් පුරප්පාඩු 769 ක් පැවතුණි.

ජේ.සුනිල් ශාන්ත
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4. කාර්යසාධන දර්ශක

4.1 ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාර්යසාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ය නිමැවුම		
		90% - 100%	75% - 89%	50% - 74%
01	ආරක්ෂක පරිභෝජන භාණ්ඩ සහ ගුවන් සුනඛ උපකරණ මිලදී ගැනීම			✓
02	ආරක්ෂක පරිභෝජන භාණ්ඩ, අශ්ව සහ ගුවන් සුනඛ අයිතම මිලදී ගැනීම			✓
03	වෙනත් සේවා (රක්ෂණ)		✓	
04	ආරක්ෂක, EOD, Para, DART සහ RSF උපකරණ මිලදී ගැනීම			✓
05	ආපදා කළමනාකරණ උපකරණ මිලදී ගැනීම		✓	
06	Y-12 ගුවන්යානා 2 මිලදී ගැනීම		✓	
07	බෙල් 206 හෙලිකොප්ටර් 2 ක් මිලදී ගැනීම			✓
08	PT-6 ගුවන්යානා 6 ක් මිලදී ගැනීම	✓		
09	AN-32B ගුවන්යානා 3 ක පූර්ණ අළුත්වැඩියාව	✓		
10	MI-17 හෙලිකොප්ටර් 2 (SMH-4417 & SMH-4418) පූර්ණ අළුත්වැඩියාව	✓		
11	MI-17 හෙලිකොප්ටර් 1 (SMH - 4428) පූර්ණ අළුත්වැඩියාව		✓	
12	SJT-749 K-8 ගුවන්යානාවල යුධමය උපාංග පූර්ණ අළුත්වැඩියාව	✓		
13	SFI-708 F-7BS ගුවන්යානාවල යුධමය උපාංග පූර්ණ අළුත්වැඩියාව	✓		
14	ගුවන්කරණම් දුම් බෝම්බ 160 මිලදී ගැනීම	✓		
15	9x19mm රවුම් මූණිස්සම් 1000 මිලදී ගැනීම	✓		
16	177 එයා රයිෆල් 10 ක් මිලදී ගැනීම	✓		
17	9x19mm රවුම් මූණිස්සම් 800 මිලදී ගැනීම	✓		
18	පිපිරුම් ලණු මීටර් 2000 මිලදී ගැනීම	✓		
19	අංක 10 බලසණය සඳහා වායු රෝධක පද්ධතියක් මිලදී ගැනීම හා ස්ථාපිත කිරීම	✓		
20	බෙල් 206 හෙලිකොප්ටර් බිම්රෝද ටයර් 12 ක් මිලදී ගැනීම	✓		
21	බෙල් 212/ 412 හෙලිකොප්ටර් බිම්රෝද ටයර් 12 ක් මිලදී ගැනීම	✓		
22	මහන යන්ත්‍ර මිලදී ගැනීම	✓		
23	ටොන් 05 දරන fork lift 01 මිලදී ගැනීම	✓		
24	4x4 SUV Jeep Defender 110 D240 ඩිෆෙන්ඩර් ජීප් රථයක් මිලදී ගැනීම	✓		
25	මගී වෑන් රථ 09 ක ප්‍රධාන අළුත්වැඩියා සිදු කිරීම	✓		
26	ඩබල් කැබ් 05 ක ප්‍රධාන අළුත්වැඩියා සිදු කිරීම	✓		

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ය නිමැවුම		
		90% - 100%	75% - 89%	50% - 74%
27	බොලේරෝ කැබ් 04 ක ප්‍රධාන අළුත්වැඩියා සිදු කිරීම	✓		
28	මගී වෑන් රථ 05 ක ප්‍රධාන අළුත්වැඩියා සිදු කිරීම	✓		
29	Sedan cars 14 ක ප්‍රධාන අළුත්වැඩියා සිදු කිරීම	✓		
30	තෙල් බවුසර් 01 ප්‍රධාන අළුත්වැඩියා සිදු කිරීම	✓		
31	ගිලන් රථ 04 ක ප්‍රධාන අළුත්වැඩියා සිදු කිරීම	✓		
32	LRD Jeep රථ 11 ක ප්‍රධාන අළුත්වැඩියා සිදු කිරීම	✓		
33	Car Carrier 1 ක ප්‍රධාන අළුත්වැඩියා සිදු කිරීම	✓		
34	යතුරු පැදි 16 ක ප්‍රධාන අළුත්වැඩියා සිදු කිරීම	✓		
35	වාහන එන්ජින් 30 ක පූර්ණ අළුත්වැඩියාව හා සංරක්ෂණය	✓		
36	වෘත්තිමය උපදේශනයෙහි නියමයන්ට අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සපයන නිෂ්පාදන සහ පුහුණු ශ්‍රමය දායකත්වය වැනි විශේෂිත කාර්යයන් සඳහා ප්‍රවාහන සහසුකම් සහ අවශ්‍ය වන සාමාන්‍ය ඉංජිනේරු සහය සපයා ඇත	✓		
37	එක්සත් ජාතීන්ගේ දූත මණ්ඩල පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන නිපුණ වෘත්තිකයින් සහ සාමාන්‍ය ඉංජිනේරු සම්පත් ලබාදීම	✓		
38	අනපේක්ෂිත ස්වාභාවික විපත් සහ අනෙකුත් ජාතික අවශ්‍යතා ඇතුළුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අවශ්‍යතා සපුරාලීමට දැනට පවතින ප්‍රවාහන/ විශේෂිත වාහන ඉහළ මට්ටමේ සේවා තත්ත්වයකින් පවත්වා ගැනීම	✓		
39	රත්මලාන ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරේ Helitours SCM-3501(4R-HTN) MA 60 ගුවන්යානයේ EFIS-85N පද්ධතිය සඳහා අමතර කොටස් මිලදී ගැනීම	✓		
40	ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ඩිජිටල් හඬ පටිගත කරනයන් සඳහා SHT-8B/ PCI හඬ පටිගත කරන කාඩ්පත් මිලදී ගැනීම	✓		
41	අකුරේගොඩ DHQC හි භාවිතය සඳහා S4 IP Controller (Park Air) මිලදී ගැනීම	✓		
42	අකුරේගොඩ DHQC හි භාවිතය සඳහා RF රැහැන් මිලදී ගැනීම	✓		
43	ගුවන් හමුදා ආයතනවල භාවිතය සඳහා බැටරි විශ්ලේෂක මිලදී ගැනීම	✓		
44	ජාල දිශා විශ්ලේශක මිලදී ගැනීම	✓		
45	අතින් ගෙනයා හැකි බැටරි මිලදී ගැනීම	✓		
46	ඉංජිනේරු යන්ත්‍ර අළුත්වැඩියාව			✓
47	ගොඩනැගිලි ඉදිකිරීම			✓
48	Dump Truck නඩත්තුව			✓

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්ත්ය නිමැවුම		
		90% - 100%	75% - 89%	50% - 74%
49	සිවිල් ඉංජිනේරු යන්ත්‍ර නඩත්තුව			✓
50	ගොඩනැගිලි නඩත්තුව			✓
51	ඖෂධ සහ සැරහුම් අයිතම, එන්නත්, X කිරණ කඩදාසි, රසායනාගාර ද්‍රව්‍ය සහ පරීක්ෂණ කට්ටල පුද්ගලික ආරක්ෂණ අයිතම, ශල්‍ය අයිතම, භෞත චිකිත්සක භාවිතය සඳහා බැහැර කිරීම් අයිතම, උපැස් කාච, රසායනාගාර පරීක්ෂණ සේවා හා කෘමි නාශක මිලදී ගැනීම			✓
52	ශ්‍රී ලංකා ගුවන් හමුදා රෝහල් සහ වෛද්‍ය මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය වන ප්‍රධාන වෛද්‍ය උපකරණ මිලදී ගැනීම			✓
53	ප්‍රධාන උපකරණ නඩත්තු කිරීම සඳහා වන සේවා ගිවිසුම අනුව ප්‍රධාන වෛද්‍ය උපකරණ අළුත්වැඩියා/ වැඩිදියුණු කිරීම			✓
54	දේශීය පුහුණු පාඨමාලා - 2022	✓		
55	විදේශීය පුහුණු පාඨමාලා - 2022	✓		
56	සයිබර් තර්ජන සහ සයිබර් අවකාශය අවභාවිතා කිරීමට එරෙහිව සටන් කිරීම සඳහා නිපුණතා වර්ධනය කිරීම		✓	
57	ක්‍රියාකාරී තීරණ (C2 සහ කළමනාකරණ සේවා, බුද්ධි සහ ආවේක්ෂණ, මෙහෙයුම් සේවා, ප්‍රවර්තන සේවා, පුද්ගල සේවා සහ ඉදිකිරීම් සේවා) සහ තොරතුරු සමසේවා (සුරක්ෂිත වේදිකා, GIS සේවා තොරතුරු කළමනාකරණය, තොරතුරු ආරක්ෂාව, තොරතුරු හුවමාරුව, සහයෝගිතා සේවා සහ සේවා කළමනාකරණය) අතර අතුරු මුහුණතක් වර්ධනය කිරීම			✓

වගුව- 1

5. තිරසාර සංවර්ධන අරමුණු (SDGs) සපුරාගැනීමේ කාර්යසාධනය

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	ඉලක්ක/ දර්ශක	භෞතික ප්‍රගතිය 2022	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2022		
					0%-49%	50%-74%	75%-100%
අරමුණ 03 නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම ශුභසාධනය ප්‍රවර්ධනය කිරීම.	3.4 2023 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මඟින් හා වළක්වා ගැනීමේ ක්‍රම මඟින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍යය සහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම.	5. කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථාන පැවැත්වීම.	v. අධි සත්කාර ඒකක පහසුකම් ලබාදීම.	e. යාවත්කාලීන තොරතුරු - ශ්‍රී ලංකා ගුවන් හමුදාව මඟින් කොවිඩ් 19 ප්‍රතිකාර මධ්‍යස්ථාන 08 කදී රෝගීන්ට නේවාසිකව ප්‍රතිකාර ලබා දුන් අතර 2022 මැයි මස 17 වන දින සිට එම මධ්‍යස්ථාන ක්‍රියාත්මක නොවන ලදි.			✓
		6. නව ගුවන් හමුදා රෝහල් ඉදිකිරීම.	vii. නව ගුවන් හමුදා රෝහල් ඉදිකිරීම.	f. ප්‍රතිලාභී පුද්ගලයින් සංඛ්‍යාව - දළ වශයෙන් ගුවන් හමුදා සාමාජිකයින්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් 100,000 ක පමණ ප්‍රමාණයකට. g. ඉදිකිරීම් ප්‍රතිශතය - (1) යෝජිත භූමියේ පාංශු පරීක්ෂාව අවසන් කොට ඇත. (2) යෝජිත භූමියේ මායිම් බැම්මෙහි ඉදිකිරීම් සිදුකරමින් පවතින අතර 80% පමණ ප්‍රගතියක් ලබා ඇත. (3) යෝජිත ඉදිකිරීම් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් යටතේ ගොඩනැගිලි 03ක ඉදිකිරීම් කටයුතු මේ වන විට සම්පූර්ණ කර ඇත. (4) 2023 වර්ෂය සඳහා යෝජිත රෝහල් ගොඩනැගිල්ලේ මූලික සැලසුම් නිරාකරන අයදුම්පත (Preliminary	✓		

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	ඉලක්ක/ දර්ශක	භෞතික ප්‍රගතිය 2022	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2022		
					0%-49%	50%-74%	75%-100%
				Planning Certificate) සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු සම්පාදන කරමින් පවතී.			
	3.5 හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළැක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම.	7. මත්ද්‍රව්‍ය ජාවාරම ක්‍රියාත්මක වීම වැළැක්වීම.	i. මත්ද්‍රව්‍ය වැටලීම් සිදු කිරීම.	a. සිදු කරන ලද මත්ද්‍රව්‍ය වැටලීම් සංඛ්‍යාව - 1,312 b. <u>අත්අඩංගුවට ගන්නා ලද මත්ද්‍රව්‍ය ප්‍රමාණය</u> - අයිස් - 583.57g හෙරොයින් - 131.977g ගංජා - 17.397kg ගංජා පැළෑටි - 5,014 නීති විරෝධී මත්පැන් - ලීටර් 5,749.225 විදේශීය මත්පැන් - ලීටර් 600.26 නීති විරෝධී දුම් වැටි - 9,565 මත් පෙති - 1,831 මාවා - 2.24kg පෙති - 62,335 විදේශීය දුම්කොළ - 4kg c. අත්අඩංගුවට පත් සංඛ්‍යාව - 342 d. වාර්ෂිකව පුනරුත්තාපනය කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව - නැත	-	-	-

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	ඉලක්ක/ දර්ශක	භෞතික ප්‍රගතිය 2022	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2022		
					0%-49%	50%-74%	75%-100%
අරමුණ 04 පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම.	4.4 2030 වන විට සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් ඇතුළුව අදාළ කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම.	1. මානව සම්පත් දැනුම සහ කුසලතා පෝෂණය කිරීම.	i. වෘත්තීමය වශයෙන් සේවක පුහුණුව ලබා දීම (ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවක පුහුණුව).	a. වෘත්තීමය වශයෙන් සේවක පුහුණුව ලත් සේවක සංඛ්‍යාව - 162			✓
අරමුණ 09 සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම.	9.1 ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශය වියහැකි වීම අවධානයට ගෙන කළාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායි තිරසර සහ ආපදාවන්ට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.	1. ජාතික ආරක්ෂාව සම්බන්ධ ආයතන කළමනාකරණ / පරිපාලන ව්‍යුහය කාර්යක්ෂම හා ශක්තිමත් කිරීම.	xii. භාවිතා කරන ලද පුහුණු කිරීම් හෙලියානා 04 ක් මිලදී ගැනීම.	u. මිලදී ගන්නා ලද හෙලියානා සංඛ්‍යාව (1) Bell 206 jet ranger වර්ගයේ හෙලිකොප්ටර් 02 ක් පමණක් මිලදී ගැනීම - මූල්‍ය ඇගයීම් වාර්තාව 2022 පෙබරවාරි මස 28 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරනු ලබන ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) අනුමැතිය සඳහා යොමු කරන ලදී. එහිදී මෙම ඇණවුමෙන් හෙලිකොප්ටර්යානා 02 ක් පමණක් මිලදී ගැනීමට අනුමැතිය ලබාදුන් අතර එය කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. (2) MI-17 වර්ගයේ හෙලිකොප්ටර්යානා 04 ක් මිලදී ගැනීම - The M/s JSC	✓		

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	ඉලක්ක/ දර්ශක	භෞතික ප්‍රගතිය 2022	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2022		
					0%-49%	50%-74%	75%-100%
				Rosoboron export සැපයුම්කරුගෙන් ලැබුණු මූලික යෝජනාවලිය ආරක්ෂක අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත යොමුකර ඇත. අදාළ යෝජනාව දැනට සක්‍යතා අධ්‍යනය පිණිස ගුවන්යානා ඉංජිනේරු අධ්‍යක්ෂක වෙත යොමුකර ඇත. මු.රෙ 136 අනුමැතිය හා ඇගයීම් කමිටුව අනුමත කර ගැනීමට ප්‍රසම්පාදන අංශය විසින් ආරක්ෂක අමාත්‍යාංශයෙන් 2022 ජුනි මස 22 වන දින ඉල්ලුම් කර ඇත. තවද මෙම ප්‍රසම්පාදනය කර ගෙන යාම සඳහා වූ කැබිනට් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොමැත.	✓		
			xiii. 100km ක් පියාසර කළ හැකි UAV නිරීක්ෂණ යානා ගුවන් හමුදාව මඟින් නිෂ්පාදනය කිරීම.	v. නිෂ්පාදනය කරන ලද ගුවන් යානා ගණන - 03 කිලෝමීටර් 20 ක් පියාසර කළ හැකි UAV නිරීක්ෂණ ගුවන් යානා 03 ක් නිෂ්පාදනය කර ඇති අතර පියාසර කළහැකි දුර කිලෝමීටර් 100 ක් දක්වා දිගු කිරීමට පර්යේෂණ සිදු කරමින් පවතී.		✓	
අරමුණ 15 භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට	15.2 2020 වන විට සියලුම වර්ගවල වනාන්තර තිරසර අන්දමින් කළමනාකරණය කිරීම ප්‍රවර්ධනය, වන විනාශය	1. වසර 2030 වන විට දැනට පවතින හරිත ආවරණය 27% සිට 32% දක්වා වැඩි කිරීමට දායක වීම	i. වගා ආවරණය ඉහළ නැංවීම සඳහා බීජ බෝම්බ හෙලීම.	a. හෙලන ලද බීජ බෝම්බ සංඛ්‍යාව - 417,000 b. ආවරණය කරන ලද භූමි ප්‍රමාණය - අක්කර 375			

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	ඉලක්ක/ දර්ශක	භෞතික ප්‍රගතිය 2022	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2022		
					0%-49%	50%-74%	75%-100%
එරෙහිව ක්‍රියාකිරීම, ඉඩම්භායනය නැවැත්වීම සහ පුනරුත්තාපනය හා ජෛව විවිධත්වය විනාශය නැවැත්වීම.	නැවැත්වීම, විනාශවූ වනාන්තර යථා තත්ත්වයට පත්කිරීම, ජගත් මට්ටමින් වන රෝපණය සහ නැවත වන වගාව වර්ධනය කිරීම.	සමඟ එක්ව ගුවන් හමුදාව ක්‍රියාකාරීව සම්බන්ධ වීම.		c. මේ වන විට බීජ බෝම්බ හෙලා ආවරණය කරන ලද භූමි ප්‍රමාණයන්හි ගුවන් හමුදා විධායක කෘෂි ඒකකය සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා එක්ව කරන ක්ෂේත්‍ර පරීක්ෂාවන්හිදී බීජ බෝම්බ මඟින් වන පැල ප්‍රරෝහණ ප්‍රතිශතය 35% - 40% වන බව තහවුරු වී ඇත. තවද, නිර්දේශිත භූමි ප්‍රමාණයේ සිවිල් පුද්ගලයන් විසින් සිදු කරගෙන ගිය විවිධ ක්‍රියාකාරකම් මගහැරි රක්ෂිතය තුළ ජල මූලාශ්‍ර, වනවගාව, සතාසිවුපාවුන්, සහ ස්වභාවික පරිසර පද්ධතියක් නිර්මාණය වීමේ ප්‍රගමනයක් පෙන්නුම් කරයි.	✓		
අරමුණ 16 තිරසාර සංවර්ධනය උදෙසා පරිපූර්ණ සාමකාමී සමාජ කණ්ඩායම් ප්‍රවර්ධනය, සියලු දෙනාට සාධාරණත්වයත් නීතියේ රැකවරණයත් ස්ථාපිත කිරීම, සියළු මට්ටම් වලින් වගකීම ස්ථාපිත කිරීම.	16.a. අන්තර්ජාතික සහයෝගීතාවද ලබාගෙන ප්‍රචණ්ඩතාවය වැළැක්වීම සහ ත්‍රස්තවාදය සහ අපරාධ තුරන්කිරීම සඳහා විශේෂයෙන්ම දියුණු වෙමින් පවත්නා රටවල්ද ඇතුළුව සියලුම මට්ටම්වල අදාල ජාතික ආයතනවල ධාරිතාවන් ශක්තිමත් කිරීම.	1. සියලුම විධායකයන් ආවරණය වන පරිදි විශේෂ කාර්යබලකාය අනුයුක්ත කිරීම සහ අදාළ ප්‍රදේශවල ආරක්ෂාව තහවුරු කිරීම. තෝරාගත් ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් වැටලීම් සහ සෝදිසි කිරීම් සිදු කිරීම.	i. පොලීසිය සහ අනෙකුත් හමුදාවන් සමඟ සම්බන්ධීකරණය වී සිදු කළ විශේෂ මෙහෙයුම්.	a. සිදු කරන ලද වැටලීම් සංඛ්‍යාව - නැත. b. <u>ක්‍රියාත්මක කරන ලද විශේෂ ආරක්ෂක වැඩසටහන් සංඛ්‍යාව</u> - (1) කොළඹ, රත්මලාන, කටුනායක යන ගුවන් හමුදා ආරක්ෂක කළාපයන් තුළ පිහිටා ඇති මර්මස්ථාන සඳහා ආරක්ෂාව සැපයිම. (2) කොළඹ, රත්මලාන, කටුනායක යන ගුවන් හමුදා ආරක්ෂක කළාපයන් තුළ නීතිය සහ සාමය	-	-	-

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	ඉලක්ක/ දර්ශක	භෞතික ප්‍රගතිය 2022	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2022		
					0%-49%	50%-74%	75%-100%
				පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලීසියට සහය වීම. (3) ශ්‍රී ලංකා පොලීසිය මඟින් කරනු ලබන ඉල්ලීම මත ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා අවශ්‍ය පිරිස් බලය ලබා දීම. (4) රට තුළ, ඉන්ධන හිඟය හේතුවෙන් ඇති වූ නොසන්සුන්කාරී තත්ත්වය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව මඟින් ඉන්ධන පිරවුම්හල් 125 සඳහා ආරක්ෂාව ලබාදීම. c. වෙරළ තීරය ආවරණය වන පරිදි අනියුක්ත කරන ලද වෙරළ ආරක්ෂක කණ්ඩායම් සංඛ්‍යාව. d. <u>වාර්ෂික ඩ්‍රෝන මෙහෙයුම්</u> - (1) කොළඹ දිස්ත්‍රික්කයේ උද්ඝෝෂණ සහ වැඩවර්ජන ආවරණය කිරීම සඳහා සිදුකරන ලද ගුවන් ගමන් කාලය පැය 60 යි විනාඩි 40 ක් වූ ඩ්‍රෝන මෙහෙයුම් 174 කි. (2) කොළඹ නගරයේ ඉන්ධන පිරවුම්හල් අසල වාහන තදබදය ආවරණය කිරීම සඳහා පියාසර කාලය පැය 01 යි මිනිත්තු 45 වන ඩ්‍රෝන මෙහෙයුම් තුනක්.			

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	ඉලක්ක/ දර්ශක	භෞතික ප්‍රගතිය 2022	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2022		
					0%-49%	50%-74%	75%-100%
		2. අභ්‍යන්තර ආරක්ෂාව සම්බන්ධයෙන් ඕනෑම අවශ්‍යතාවයක දී සහය වීම සඳහා ත්‍රිවිධ හමුදාව සූදානම් කර තිබීම.	i. ත්‍රිවිධ හමුදාවේ ආයුධ/ ගුවන්යානා/ නෞකා යනාදිය අත්පත් කර ගැනීම.	a. වර්ෂයක් තුළ අත්පත් කරගත් ආයුධ/ ගුවන්යානා/ නෞකා සංඛ්‍යාව. b. <u>නගා සිටුවන ලද අධි තාක්ෂණයෙන් යුත් ඩ්‍රෝන කැමරා සහිත ඒකක</u> - (1) DJIM 300 RTK ඩ්‍රෝන කැමරා තුනක් ගුවන් බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මිලදී ගෙන ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අංක III UAV බලඝණයේ ඩ්‍රෝන අංශය වෙත භාර දෙන ලදී. (2) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විධිවිධාන මත DJIM 300 RTK ඩ්‍රෝන කැමරා මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කර පාර්ලිමේන්තුවට ලබා දෙනු ඇත.	-	-	-
			ii. විශේෂ පුහුණු ලබා දීම.	c. මිත්‍ර රටවල් සමඟ සහයෝගීතාව වර්ධනය කිරීම සඳහා පවත්වනු ලබන අභ්‍යාස, පුහුණු වැඩමුළු - මිත්‍ර රටවල් සමඟ සම්බන්ධව විශේෂයෙන් පුහුණු වූ පුද්ගලයන් සංඛ්‍යාව 361 දෙනෙකි.			✓
			iii. අන්තවාදී/ දැඩිමතධාරී කණ්ඩායම්/ සංවිධාන හඳුනා ගැනීම සහ පසුවිපරම.	a. <u>යොදන ලද මාර්ග බාධක.</u> - (1) කටුනායක ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර මඟින් කොච්චිකඩේ පාලමේ මාර්ග බාධකයක් ස්ථානගත කර ඇත. (2) රත්මලාන ශ්‍රී ලංකා ගුවන් හමුදා			

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	ඉලක්ක/ දර්ශක	භෞතික ප්‍රගතිය 2022	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2022		
					0%-49%	50%-74%	75%-100%
				කඳවුර මඟින් කටුබැද්ද මාර්ග බාධකය. (3) ඒකළ ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල මඟින් කොටුගොඩ සහ දඬුගම මාර්ග බාධකය. (4) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුර මඟින් මල්ගස් හංදිය, වැරැල්ලවත්තහංදිය, කුළුණ හංදිය හා ආඩිඅම්බලම හංදිය මාර්ග බාධකය. b. <u>ප්‍රධාන නගර ආශ්‍රිතව ක්‍රියාත්මක කරන ලද විශේෂ ආරක්ෂක වැඩසටහන්</u> - (1) ශ්‍රී ලංකා ගුවන් හමුදා ආරක්ෂක කළාප අංක 04 (කොළඹ) අංක 07 (රත්මලාන) අංක 12 (කටුනායක/ මීගමුව අයත් කළාපයන් තුළ ආරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් යතුරුපැදි/ වාහන මඟින් ජංගම මුරසංචාර ක්‍රියාත්මක කිරීම, ක්ෂණික මාර්ගබාධක යෙදවීම සහ ස්ථානීය ආරක්ෂාව සඳහා භට පිරිස් යෙදවීම. (2) ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරු පිහිටා ඇති දිස්ත්‍රික්ක හා ප්‍රදේශයන් ආවරණය වන පරිදි ආරක්ෂාව තහවුරු කිරීම සඳහා පිරිස් සූදානම් කර තිබීම හා යෙදවීමට අවශ්‍ය කටයුතු කරන ලදි.	-	-	-

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	ඉලක්ක/ දර්ශක	භෞතික ප්‍රගතිය 2022	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2022		
					0%-49%	50%-74%	75%-100%
		5. සියළුම ආකාරයේ ත්‍රස්තවාදී හා අන්තවාදී ක්‍රියා මැඩ පැවැත්වීම.	ix. අන්තවාදී/ දැඩිමතදාරී කණ්ඩායම්/ සංවිධාන හඳුනාගැනීම.	e. අත්අඩංගුවට ගන්නා අන්තවාදී හා ත්‍රස්තවාදී සංවිධානවල සාමාජිකයින් ගණන - (1) ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය විසින් සෘජුව අත්අඩංගුවට ගැනීම් සිදු නොකරන අතර අන්තවාදී හා ත්‍රස්තවාදී සංවිධාන හා සම්බන්ධ තොරතුරු අන්තර්ගත වන බුද්ධි වාර්තා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා පහත සඳහන් ආයතන වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. (a) ජාතික බුද්ධි ප්‍රධානී කාර්යාලය. (b) අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව. (c) ප්‍රතිත්‍රස්ත මර්ධන සහ විමර්ශන ඒකකය. (d) රාජ්‍ය බුද්ධි සේවාව. (2) ගුවන් හමුදාව මඟින් අන්තවාදී හා ත්‍රස්තවාදී සංවිධානවල සාමාජිකයින් අත්අඩංගුවට ගැනීමක් සිදු නොකරන අතර එම ආයතන හා පුද්ගලයින් සම්බන්ධව ලැබෙන තොරතුරු ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, විශේෂ කාර්යබලකාය සහ අනෙකුත් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සඳහා යොමු කෙරේ.	-	-	-
			x. අන්තවාදී හා ත්‍රස්තවාදී සංවිධානවල සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම.	f. ග්‍රාම නිලධාරී හා එම ප්‍රදේශයන්හී ආරක්ෂක කමිටු සමාජිකයින් සම්බන්ධ කරගනිමින් අන්තවාදී හා ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලට සම්බන්ධ යැයි සැක කරනු ලබන පුද්ගලයින් හඳුනා			

අරමුණ	ප්‍රතිපත්ති ඉලක්ක	උපාය මාර්ග	ඉලක්ක/ දර්ශක	භෞතික ප්‍රගතිය 2022	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය 2022		
					0%-49%	50%-74%	75%-100%
				ගැනීම සහ ඔවුන් පිළිබඳව ආරක්ෂක අංශ දැනුවත් කිරීමට අදාළව කඳවුරු රෙජිමේන්තු පක්ෂාංග සම්බන්ධීකරණ කටයුතු ගුවන් බුද්ධි අධ්‍යක්ෂකය විසින් සිදුකරනු ලැබේ.	-	-	-

වගුව - 1

6. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

2022 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත වගුව 1 සහ 2 හි දක්වා ඇත.

අ. **සේවා කාර්ය මණ්ඩලය**

විස්තරය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	අතිරික්ත (ඌනතා)
නිලධාරීන් (නිත්‍ය/ ස්වේච්ඡා)	2,557	2,090	(467)
සෙසු නිලයන් (නිත්‍ය/ ස්වේච්ඡා)	34,381	29,039	(5,342)
එකතුව	**36,938**	**31,129**	**(5,809)**

වගුව - 1

ආ. **සිවිල් කාර්ය මණ්ඩලය**

විස්තරය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	අතිරික්ත (ඌනතා)
ජ්‍යෙෂ්ඨ මට්ටම	8	6	(2)
තෘතීය මට්ටම	3	2	(1)
ද්විතීය මට්ටම	192	104	(88)
ප්‍රාථමික මට්ටම	2,854	2,176	(678)
තාවකාලික/ කොන්ත්‍රාත්	333	97	(236)
එකතුව	**3,390**	**2,385**	**(1,005)**

වගුව - 2

ඇ. **2022 දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලයද ඇතුළත් වන පරිදි එක් එක් අංශවල සිටින නිලධාරීන් සංඛ්‍යාව (දැනට සේවයේ නියුතු කාර්ය මණ්ඩලය).**

අංශයේ නම	අනුමත සේවක සංඛ්‍යාව (මුළු නිලධාරීන් සංඛ්‍යාව)	තත්‍ය සේවක සංඛ්‍යාව			
		නිත්‍ය නිලධාරීන්	ස්වේච්ඡා නිලධාරීන්	කෑඩෙට් නිලධාරීන්	නිත්‍ය නිලධාරීන්
සාමාන්‍ය රාජකාරී - ගුවන් නියමු	394	216	-	37	**253**
ගුවන්යානා සහ සාමාන්‍ය ඉංජිනේරු	285	205	05	30	**240**
විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු	135	97	-	17	**114**
තොරතුරු තාක්ෂණ ඉංජිනේරු	80	66	09	05	**80**
ගුවන් මෙහෙයුම්	138	104	-	14	**118**

රෙජිමේන්තු	547	346	03	60	**409**
සැපයුම්	245	201	-	26	**227**
පරිපාලන	276	206	-	43	**249**
සිවිල් ඉංජිනේරු	138	97	08	04	**109**
වෛද්‍ය	110	62	06	90	**158**
දන්ත	43	19	-	-	**19**
නීති	17	15	-	01	**16**
පශු	11	08	-	-	**08**
විනයාරක්ෂක	37	25	-	02	**27**
වෛද්‍ය/ මනෝ	06	06	-	-	**06**
අතුරු වෛද්‍ය	04	04	01	-	**05**
කෘෂි	17	17	-	-	**17**
ප්‍රසාංගික කළා	27	13	01	-	**14**
අධ්‍යාපන	26	-	13	-	**13**
විගණන	08	08	-	-	**08**
සංචිත	13	-	-	-	**-**
එකතුව	**2,557**	**1,715**	**46**	**329**	**2,090**

වගුව - 3

ඇ. **2022 දෙසැම්බර් 31 දිනට නිත්‍ය ගුවන්භට/ ගුවන් කාන්තා අනුමත සේවක සංඛ්‍යාව සහ තත්‍ය සේවක සංඛ්‍යාව.**

සෙසු නිල	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	
		ස්වේච්ඡා (ගුවන්භට/ ගුවන් කාන්තා)	නිත්‍ය (ගුවන්භට/ ගුවන් කාන්තා)
ප්‍රධාන බලලත් නිලධාරී	168	05	119
බලලත් නිලධාරී	1,066	48	855
බලපත්‍රි සැරයන්	2,215	157	1,886
සැරයන්	3,990	532	3,237
කෝප්‍රල්	7,569	1,820	5,074
නායක ගුවන්භට/ ගුවන්භට	19,373	7,314	7,992
එකතුව	**34,381**	**9,876**	**19,163**

වගුව - 4

ඈ. **2022 වර්ෂයේ නිලධාරී උසස්වීම් පිළිබඳ තොරතුරු.**

(1) 2022 වර්ෂයේ නිත්‍ය නිලධාරී උසස්වීම් පිළිබඳ තොරතුරු පහත පරිදිය.

අනු අංකය	උසස් කරන ලද නිලය	නිලධාරීන් සංඛ්‍යාව
01	ස්ථිර එයාර් වයිස් මාර්ෂල් නිලයට	11
02	තාවකාලික එයාර් වයිස් මාර්ෂල් නිලයට	5
03	ස්ථිර ගුවන් කොමදෝරු නිලයට	16
04	තාවකාලික ගුවන් කොමදෝරු නිලයට	13
05	ස්ථිර ගෘප් කපිතාන් නිලයට	33
06	තාවකාලික ගෘප් කපිතාන් නිලයට	24
07	ස්ථිර විංග් කමාන්ඩර් නිලයට	79
08	තාවකාලික විංග් කමාන්ඩර් නිලයට	28
09	ස්ථිර බලඝන නායක නිලයට	79
10	තාවකාලික බලඝන නායක නිලයට	124

11	පියාසර ලුතිනන් නිලයට	52
12	පියාසර නිලධාරී නිලයට	159
එකතුව		**623**

වගුව - 5

(2) 2022 වර්ෂය තුළ ස්වේච්ඡා නිලධාරීන්ගේ උසස්වීම් පිළිබඳ තොරතුරු පහත පරිදිය.

අනු අංකය	උසස් කරන ලද නිලය	නිලධාරීන් සංඛ්‍යාව
01	තාවකාලික විංග් කමාන්ඩර්	01
02	පියාසර නිලධාරී	01
එකතුව		**02**

වගුව - 6

ඊ. **2022 වර්ෂය තුළ නිලධාරීන් විශ්‍රාම ගැන්වීම/ සේවයෙන් නිදහස් කිරීම පිළිබඳ තොරතුරු.**

(1) 2022 වර්ෂය තුළ නිත්‍ය නිලධාරීන් විශ්‍රාම ගැන්වීම/ සේවයෙන් නිදහස් කිරීම පිළිබඳ තොරතුරු පහත පරිදිය.

විශ්‍රාම ක්‍රමය	එයාර් වයිස් මාර්ෂල්	ග්‍රුප් කැප්ටන් හොමෙදෝරු	ග්‍රුප් කැප්ටන්	විංග් කමාන්ඩර්	බලඝන නායක	පියාසර ලුතිනන්	පියාසර නිලධාරී	සැලසුම් නිලධාරී	එකතුව
විශ්‍රාම ගැන්වූ	10	11	12	23	08	01	-	-	**65**
අධිකාරියෙන් ඉවත් වීම	-	-	-	-	10	05	02	-	**17**
සේවය අවලංගු කිරීම	-	-	-	-	01	-	-	02	**03**
උසස්ම නිලයට පත් වීම	-	-	-	01	-	-	02	-	**03**
අධිකාරියෙන් ඉවත් වීම	-	-	-	-	02	-	02	-	**04**
අවමන් සහිතව සේවයෙන් පහකිරීම	-	-	-	-	-	03	-	-	**03**
මුදල් ගෙවීමේ පදනම මත නිම සේවා ගැන්වීම	-	-	-	-	-	-	-	17	**17**
එකතුව	**10**	**11**	**12**	**24**	**21**	**09**	**06**	**19**	**112**

වගුව - 7

(2) 2022 වර්ෂය තුළ ස්වේච්ඡා නිලධාරීන් විශ්‍රාම ගැන්වීම/ සේවයෙන් නිදහස් කිරීම පිළිබඳ තොරතුරු පහත පරිදිය.

විශ්‍රාම ක්‍රමය	විංග් කමාන්ඩර්	බලසන නායක	පියාසර ලුතිනන්	පියාසර නිලධාරී	කැඩෙට් නිලධාරී	එකතුව
වෛද්‍ය හේතූන් මත සේවය අවලංගු කිරීම	-	-	01	-	-	**01**
අධිකාරියෙන් ඉවත් වීම	01	01	03	05	01	**11**
විශ්‍රාම ගැන්වූ	02	01	-	-	-	**03**
අධිකාරියෙන් ඉවත් කිරීම	-	01	-	01	-	**02**
එකතුව	**03**	**03**	**04**	**06**	**01**	**17**

වගුව - 8

එ. **නිත්‍ය ගුවන්භට/ ගුවන්කාන්තා උසස්වීම් - 2022.**

(1) 2022 වර්ෂය තුළ නිත්‍ය ගුවන්භට/ ගුවන් කාන්තා උසස්වීම් පහත පරිදිය.

සෙසු නිල	උසස්වීම් සංඛ්‍යාව
ප්‍රධාන බලලත් නිලධාරී	83
ස්ථිර බලලත් නිලධාරී	326
වැඩබලන බලලත් නිලධාරී	448
ස්ථිර පියාසර සැරයන්	394
වැඩබලන පියාසර සැරයන්	792
ස්ථිර සැරයන්	585
වැඩබලන සැරයන්	831
ස්ථිර කෝප්‍රල්	520
වැඩබලන කෝප්‍රල්	767
එකතුව	**4,746**

වගුව - 09

(2) 2022 වර්ෂය තුළ ස්වේච්ඡා ගුවන්භට/ ගුවන් කාන්තා උසස්වීම් පහත පරිදිය.

සෙසු නිල	උසස්වීම් සංඛ්‍යාව
ප්‍රධාන බලලත් නිලධාරී	05
ස්ථිර බලලත් නිලධාරී	36
වැඩබලන බලලත් නිලධාරී	45
ස්ථිර පියාසර සැරයන්	55
වැඩබලන පියාසර සැරයන්	74
ස්ථිර සැරයන්	110
වැඩබලන සැරයන්	210
ස්ථිර කෝප්‍රල්	148
වැඩබලන කෝප්‍රල්	413
එකතුව	**1,096**

වගුව - 10

ඒ. **නිත්‍ය ගුවන්භට/ ගුවන් කාන්තා විශ්‍රාම ගැන්වීම/ නිම සේවා ගැන්වීම - 2022.**

(1) 2022 වර්ෂය තුළ නිත්‍ය ගුවන්භට/ ගුවන් කාන්තා විශ්‍රාම ගැන්වීම/ සේවයෙන් නිදහස් කිරීම පිළිබඳ තොරතුරු පහත පරිදිය.

විශ්‍රාම ක්‍රමය/ නිම සේවා ගැන්වීම තොරතුරු	2022 දෙසැම්බර් 31 දිනට (2022.01.01 සිට 2022.12.31)		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව
විශ්‍රාම ගැන්වූ	459	43	**502**
සේවා ගිවිසුම අවසන් කිරීම	165	09	**174**
සේවය තව දුරටත් අවශ්‍ය නොවීම/ සාමාන්‍ය විශ්‍රාම ගැන්වීම	898	190	**1,088**
ගුවන් හමුදා සේවයට නොසුදුසු වීම	03	01	**04**
වෛද්‍ය හේතූන් මත නිම සේවා ගැන්වීම	63	10	**73**
මුදල් ගෙවීමේ පදනම මත නිම සේවා ගැන්වීම	34	06	**40**
සානුකම්පිත හේතූන් මත විශ්‍රාම ගැන්වීම	145	12	**157**
වෙනත්	03	-	**03**
එකතුව	**1,770**	**271**	**2,041**

වගුව - 11

(2) 2022 වර්ෂය තුළ ස්වේච්ඡා ගුවන්භට/ ගුවන් කාන්තා විශ්‍රාම ගැන්වීම/ සේවයෙන් නිදහස් කිරීම පිළිබඳ තොරතුරු පහත පරිදිය.

විශ්‍රාම ක්‍රමය	2022 දෙසැම්බර් 31 දිනට (2022.01.01 සිට 2022.12.31)		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව
විශ්‍රාම ගැන්වූ	374	06	**380**
සේවා ගිවිසුම අවසන් කිරීම	121	04	**125**
ඉල්ලීම මත නිම සේවා ගැන්වීම	228	15	**243**
සේවය තව දුරටත් අවශ්‍ය නොවීම	117	06	**123**
වෛද්‍ය හේතූන් මත නිම සේවා ගැන්වීම	40	-	**40**
නියමිත ශාරීරික යෝග්‍යතාව නොමැතිවීම	01	-	**01**
එකතුව	**881**	**31**	**912**

වගුව - 12

6.2 මානව සම්පත් හිඟය සහ අතිරික්තය ආයතනයේ කාර්යසාධනය කෙරෙහි බලපෑම

2022 වර්ෂයේ ශ්‍රීලංගුහ අනුමත සේවක සංඛ්‍යාවේ තත්‍ය උපයෝජනය 83.10% කි. අනුමත කාර්ය මණ්ඩලයේ උපයෝජනය නොකළ ප්‍රතිශතය 16.90% ක් වන අතර එය සේවා පුද්ගල කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 5,809 ක් සහ සිවිල් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 1,005 ක් ද ඇතුළුව මුළු පුරප්පාඩු 6,814 ක් නියෝජනය කරයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව		සමස්ත ආයෝජනය (රු.000)		වැඩසටහන් ස්වභාවය (විදේශීය/ දේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
		සිට	දක්වා	දේශීය	විදේශීය		
නිලධාරීන් - රාජ්‍ය තාන්ත්‍රික සහ ලෝක කටයුතු පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව 2021/ 2022	02	අවුරුදු 01		0.22	-	දේශීය	විෂයට අදාළව
නිලධාරීන් - ශ්‍රී ලංකා නිලධාරීන් සඳහා (Dte of PA) ලතින් සහ බාල් නැටුම් පිළිබඳ වෘත්තිය පුහුණුව ලබාදීම	02	සති 06 (සතියකට දින 01)		0.10	-	දේශීය	විෂයට අදාළව
ශබ්දාගාර වල (Studio) සහ PA පද්ධති වල ශබ්ද කළමනාකරණ පාඨමාලාව	05	2022 ජනවාරි පළමු සතිය		0.20	-	දේශීය	විෂයට අදාළව
පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව	10	2021 දෙසැම්බර් 27, 31 සහ 2022 ජනවාරි 04, 06		0.25	-	දේශීය	විෂයට අදාළව
ගුවන්භට/ ගුවන් කාන්තා - ලතින් සහ බාල් නැටුම් පිළිබඳ වෘත්තීය පුහුණුව	20	සති 08 (සතියකට දින 01)		0.20	-	දේශීය	විෂයට අදාළව
රියදුරු උපදේශක පාඨමාලාව	12	දින 07 (2021 දෙසැම්බර් 17, 18, 22, 23, 24, 25 සහ 26)		0.20	-	දේශීය	විෂයට අදාළව
ගුවන්භට - යෝග්‍යතා පුහුණු කරුවන් සඳහා සහතික පත්‍ර පාඨමාලාව - 2022	05	2022		0.08	-	දේශීය	විෂයට අදාළව
ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - ප්‍රවාහන ක්‍රියාකරුවන් (OMT) සඳහා උසස් ආරක්ෂක රියදුරු පුහුණුව	160	2021 දෙසැම්බර් 27, 31 සහ 2022 ජනවාරි		0.16	-	දේශීය	විෂයට අදාළව
ගුවන් භටයින් සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - MTM වෘත්තිකයන් සඳහා වන ඊසල් ඉන්ජෙක්ෂන් පම්ප් අළුත්වැඩියාව සහ නඩත්තුව පිළිබඳ විශේෂ පුහුණුව	10	දින 07 (2021 දෙසැම්බර් 17, 18, 22, 23, 24, 25 සහ 26)		0.84	-	දේශීය	විෂයට අදාළව
ශ්‍රී ලංකා දන්ත වෛද්‍ය සංගමයේ දක්ෂිණ ශාඛා ප්‍රාදේශීය විද්‍යාත්මක සැසි සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම - 2022 ජනවාරි 28 සහ 29	02	2022 ජනවාරි 28	2022 ජනවාරි 29	0.014	-	දේශීය	විෂයට අදාළව
